SRI LANKA

# Level 1

## 101

## මූල්‍ය ගිණුම්කරණය

## FINANCIAL ACCOUNTING

## (FAN)

- ද්විත්ව සටහන්
- මූලික සටහන් පොත්
- බැංකු සැසඳුම් ප්‍රකාශන
- පාලන ගිණුම්

# T - 02

# ද්විත්ව සටහන්
# Double Entry

## ද්විත්ව සටහන් ක්‍රමය හැඳින්වීම

ව්‍යාපාරික ගණුදෙනු හා සිද්ධීන් හේතු කොටගෙන ව්‍යාපාරයේ වත්කම්, වගකීම් හා හිමිකම් කෙරෙහි එකවර ද්විත්ව බලපෑමක් ඇති වේ. ගණුදෙනුවකින් හෝ සිද්ධියකින් ඇතිවන මෙම ද්විත්ව බලපෑම හර (Debit) සහ බැර (Credit) ලෙස දෙතැනක එකම අවස්ථාවකදී සටහන් කිරීම ද්විත්ව සටහන් ක්‍රමය (Double Entry System) ලෙස හැඳින්වේ.

මෙම ක්‍රමය ක්‍රි. ව. 1494 දී ලූකා පැසිඔලි (Luca Pasioli) නම් යුරෝපීය ජාතිකයෙකු විසින් ලොවට හඳුන්වා දී ඇත.

## ද්විත්ව සටහන් ක්‍රමය හා ගිණුම්කරණ සමීකරණය අතර සම්බන්ධතාවය

ව්‍යාපාරික ගණුදෙනු හා සිද්ධීන් ගිණුම්කරණ සමීකරණයට බලපෑම් ඇති කරනුයේ එහි තුලනතාවය ආරක්ෂා වන පරිදිය. එනම් ගණුදෙනුවකින් හෝ සිද්ධියකින් ව්‍යාපාරයේ වත්කම්, වගකීම් හා හිමිකම්වලට එකවර බලපෑම් දෙකක් ඇති කලද, හිමිකම් + වගකීම් = වත්කම් නම් වූ ගිණුම්කරණ සමීකරණයේ තුලනතාවයට හානියක් ඇති නොකෙරේ.

එලෙසම ව්‍යාපාරික ගණුදෙනු හා සිද්ධීන් ද්විත්ව සටහන් ක්‍රමය අනුව ගිණුම් පොත් පංතියක සටහන් කිරීමෙන් පසුව ද ඉහත සඳහන් ගිණුම්කරණ සමීකරණයේ තුලනතාවය ආරක්ෂා වේ.

ද්විත්ව සටහන් ක්‍රමය අනුව ගණුදෙනු හා සිද්ධීන් සටහන් කරන ලද පොත් පංතියක හර සටහන්වල සංඛ්‍යාත්මක අගය බැර සටහන්වල සංඛ්‍යාත්මක අගයට සමාන විය යුතුය. එසේ නොවන්නේ නම් ඉන් හැඟෙන්නේ ගණුදෙනු හා සිද්ධීන් සටහන් කිරීමේදී කිසියම් දෝෂයක් සිදු වී තිබෙන බවයි. ඒ අනුව ද්විත්ව සටහන් ක්‍රමය මගින් ගිණුම් සටහන්වල නිරවද්‍යතාවය ස්වපරීක්ෂණයට භාජනය කෙරේ. ද්විත්ව සටහන් ක්‍රමයේ වැදගත්කම රඳා පවතින්නේ මෙම සාධකය මත ය.

## වත්කම්, වගකීම් හා ප්‍රාග්ධනයට අදාළ ද්විත්ව සටහන් න්‍යාය පැහැදිලි කිරීම.

| | වැඩිවීම | අඩුවීම |
|---|---|---|
| වත්කම් | ............................ | ............................ |
| වගකීම් | ............................ | ............................ |
| හිමිකම් (ප්‍රාග්ධනය) | ............................ | ............................ |

## ආදායම් හා වියදම්වලට අදාළ ද්විත්ව සටහන් න්‍යාය පැහැදිලි කිරීම

| | වැඩිවීම | අඩුවීම |
|---|---|---|
| ආදායම් | ............................ | ............................ |
| වියදම් | ............................ | ............................ |

## ආදායම් හා වියදම්වලට අදාළ ගණුදෙනු නිසා ප්‍රාග්ධනය වෙනස්වීම

ආදායම් හේතුකොට ගෙන හිමිකම් (ප්‍රාග්ධනය) වැඩිවන බවත් වියදම් හේතුකොට ගෙන හිමිකම් (ප්‍රාග්ධනය) අඩුවන බවත් ගිණුම්කරණය යටතේ ඉගෙන ගෙන ඇත. එහෙත් ප්‍රායෝගිකව ආදායමක් උපයද්දීම ප්‍රාග්ධනය වැඩිවීමක් හෝ වියදමක් ඇති වූ විටදී ම ප්‍රාග්ධනය අඩුවීමක් හෝ සිදු නොවේ. කිසියම් ගිණුම් කාලච්ඡේදයක් තුලදී උපයන ආදායම් හා දරනු ලබන වියදම් වෙන වෙනම ගිණුම්ගත කෙරෙන අතර ගිණුම් කාලච්ඡේදය අවසානයේදී ලාභාලාභ ගිණුමකට හෝ අදායම් ප්‍රකාශණයකට එම ආදායම් හා වියදම් මාරු කර මෙහෙයුම් ලාභය හෝ අලාභය සොයා ගැනේ. ප්‍රාග්ධනයට ගලපනු ලබන්නේ එකී මෙහෙයුම් ප්‍රතිඵලය යි.

## ලෙජර් ගිණුම් (Ledger Account)

ද්විත්ව සටහන් ක්‍රමය යටතේ ව්‍යාපාරික ගණුදෙනු හා සිද්ධීන් වාර්තා කරනු ලබන්නේ ගිණුම්වලය. ගිණුමක් යනු කිසියම් අයිතමයක් පිළිබඳව ගිණුම් කාලච්ඡේදයක් තුලදී සිදුවන සියලුම මූල්‍යමය වෙනස්වීම් අඛණ්ඩව සටහන් කිරීමට භාවිතා කරනු ලබන වාර්තාවකි. ගිණුම් ඒකරාශී කර තබන ස්ථානය ලෙජරය යනුවෙන් හඳුන්වන නිසා මේවා ලෙජර් ගිණුම් ලෙස නම් කෙරේ.

**ගිණුමක ආකෘතිය**

| හර | | | | බැර | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය | විස්තරය | පිටුව | මුදල | දිනය | විස්තර | පිටුව | මුදල |
| | | | | | | | |

දිනය තීරුව ⟶ ගණුදෙනුවට අදාල දිනය
විස්තරය තීරුව ⟶ ගණුදෙනුවට සම්බන්ධ අනෙක් ගිණුමේ නම
සඟල පිටුව ⟶ ගණුදෙනුවට අදාල අනෙක් ගිණුමේ ලෙජර් පිටු අංකය
මුදල තීරුව ⟶ ගණුදෙනුවට අදාල මූල්‍ය වටිනාකම

ව්‍යාපාරික ගණුදෙනු හා සිද්ධීන් සටහන් කිරීම සඳහා මෙවැනි ලෙජර් ගිණුම් රාශියක් පවත්වා ගැනේ. එහෙත් එම ලෙජර් ගිණුම් මූලික වර්ග පහකට බෙදිය හැකි අතර ඒවා පහත සඳහන් වේ.

| ගිණුම් වර්ගය | වැඩිවීම | අඩුවීම | සාමාන්‍යයෙන් වැඩි අගයක් ඇති පැත්ත (ශේෂය) |
|---|---|---|---|
| වත්කම් ගිණුම් | | | |
| වියදම් ගිණුම් | | | |
| වගකීම් ගිණුම් | | | |
| ආදායම් ගිණුම් | | | |
| ප්‍රාග්ධන ගිණුම් | | | |

## ද්විත්ව සටහන් මූලධර්මය

1. වත්කම් - ........................................................

........................................................

| හර | බැර |
|---|---|
| වැඩිවීම (+) | අඩුවීම (-) |
| හර කිරීම | බැර කිරීම |

2. වියදම් - ........................................................

........................................................

| හර | බැර |
|---|---|
| වැඩිවීම (+) | අඩුවීම (-) |
| හර කිරීම | බැර කිරීම |

3. වගකීම් - ........................................................

........................................................

| හර | බැර |
|---|---|
| අඩුවීම (-) | වැඩිවීම (+) |
| හර කිරීම | බැර කිරීම |

4. ආදායම් - ........................................................
........................................................

| හර | බැර |
|---|---|
| අඩුවීම (-) | වැඩිවීම (+) |
| හර කිරීම | බැර කිරීම |

5. ප්‍රාග්ධනය - ප්‍රාග්ධනය අඩුවීම හර
ප්‍රාග්ධනය වැඩිවීම බැර

| හර | බැර |
|---|---|
| අඩුවීම (-) | වැඩිවීම (+) |
| හර කිරීම | බැර කිරීම |

**ගණුදෙනු ගිණුම්කරණ සමීකරණයට කරන බලපෑම ද්විත්ව සටහන් මගින් පැහැදිලි කිරීම.**

| ගණුදෙනුව | මූලික ගිණුම් සමීකරණයට වන බලපෑම | ද්විත්ව සටහන |
|---|---|---|
| (1) අයිතිකරු ව්‍යාපාරයට ප්‍රාග්ධනය ලෙස මුදල් යෙදවීම | | |
| (2) අයිතිකරු ව්‍යාපාරයට ප්‍රාග්ධනය ලෙස ඔහුගේ මෝටර් රථය යෙදවීම | | |
| (3) අත්පිට මුදලට භාණ්ඩ මිලදී ගැනීම | | |
| (4) ණයට භාණ්ඩ මිලදී ගැනීම | | |
| (5) අත්පිට මුදලට භාණ්ඩ විකිණීම | | |

| | | |
|---|---|---|
| (6) ණයට භාණ්ඩ විකිණීම | | |
| (7) අත්පිට මුදලට සේවා සැපයීම | | |
| (8) ණයට සේවා සැපයීම | | |
| (9) ණයට ගත් භාණ්ඩ හරවා යැවීම | | |
| (10) ණයට විකුණූ භාණ්ඩ හරවා එවීම | | |
| (11) ණයහිමියන්ට මුදල් ගෙවීම | | |
| (12) ණයගැතියන්ගෙන් මුදල් ලැබීම | | |
| (13) ණයහිමියන්ට මුදල් ගෙවීමේදී ලැබූ වට්ටම් | | |
| (14) ණයගැතියන්ගෙන් මුදල් ලැබීමේදී දුන් වට්ටම් | | |
| (15) ණයගැතියන්ගෙන් බොල්ණය කපා හැරීම | | |

| | | |
|---|---|---|
| (16) විදුලිය වියදම් මුදලින් ගෙවීම | | |
| (17) දුරකථන බිල්පත් ලැබී ඇතත් මුදල් ගෙවීම ප්‍රමාද කිරීම | | |
| (18) ඉඩම් හා ගොඩනැගිලි අත්පිට මුදල් ගැනීම | | |
| (19) කාර්යාල උපකරණ ණයට ගැනීම | | |
| (20) කාර්යාල උපකරණවල ක්ෂයවීම | | |
| (21) අයිතිකරුගේ මුදල් ගැනිලි | | |
| (22) අයිතිකරුගේ භාණ්ඩ ගැනිලි | | |
| (23) බැංකුවකින් ණය මුදලක් ගැනීම | | |
| (24) බැංකු ණය ආපසු ගෙවීම | | |
| (25) බැංකු ණය සඳහා පොලී ගෙවීම | | |

## අභ්‍යාසය 27


පහත දැක්වෙන ඒ ඒ ගණුදෙනුව ද්විත්ව සටහන් ආධාරයෙන් ගිණුම් ගතවන ආකාරය දක්වන්න.

| අංකය | ගණුදෙනුව | ද්විත්ව සටහන |
|---|---|---|
| 01. | අයිතිකරු ව්‍යාපාරයට මුදල් යෙදවීම | |
| 02. | ලී බඩු මිලදී ගැනීම | |
| 03. | දුරකථන බිල ගෙවීම | |
| 04. | අත්පිට මුදලට භාණ්ඩ මිලදී ගැනීම | |
| 05. | ණයට භාණ්ඩ ගැනීම | |
| 06. | භාණ්ඩ අත්පිට මුදලට විකිණීම | |
| 07. | භාණ්ඩ ණයට විකිණීම | |
| 08. | ණයහිමියන්ට මුදල් ගෙවීම | |
| 09. | ණයගැතියන්ගෙන් මුදල් ලැබීම | |
| 10. | ණයගැතියන්ගෙන් නොලැබෙන ණය | |
| 11. | බැංකු ණයක් ලබා ගැනීම | |

| | | |
|---|---|---|
| 12. | ගෙවල් කුලී ලැබීම | |
| 13. | බැංකු ණය පොලී ගෙවීම | |
| 14. | බැංකු ණයෙන් කොටසක් ගෙවීම | |
| 15. | අයිතිකරු තම පුද්ගලික මෝටර් රථය ව්‍යාපාරයට යෙදවීම | |
| 16. | අයිතිකරු භාණ්ඩ ගැනිලි | |
| 17. | අයිතිකරු මුදල් ගැනිලි | |
| 18. | ගොඩනැගිල්ලට අළුත් කොටසක් එකතු කිරීම | |
| 19. | අයිතිකරු තම පෞද්ගලික මුදලින් ව්‍යාපාරයෙහි ණයහිමියන්ට මුදල් යෙදවීම | |
| 20. | සංග්‍රහ වියදම් ගෙවීම | |

## ලෙජරය වර්ග කිරීම

කුඩා ව්‍යාපාරයක සිදුවන ගණුදෙනු ප්‍රමාණය අඩු නිසාත් අවශ්‍ය ගිණුම් ප්‍රමාණයද සීමිත වන නිසාත් සියලුම ගිණුම් එක් ලෙජරයක පවත්වා ගත හැකිය. එහෙත් විශාල ගිණුම් සංඛ්‍යාවක් පවත්වාගෙන යන මහා පරිමාණ ව්‍යාපාරයක ගිණුම් සියල්ලම එක් තනි ලෙජරයක පවත්වා ගැනීම ආපහසු බැවින් ලෙජර කීපයක් යටතේ ගිණුම් සමූහ වශයෙන් පවත්වා ගැනේ. මේ අනුව ලෙජරය පහත සඳහන් පරිදි  වර්ග කළ හැකිය.




## පොදු ලෙජරය

වත්කම්, වගකීම්, හිමිකම්, ආදායම්, වියදම් යන සියලුම වර්ගයේ ගිණුම් ඇතුළත් ලෙජරය පොදු ලෙජරය ලෙස හැඳින්වේ.

## ගැනුම් ලෙජරය / ණයහිමියන්ගේ ලෙජරය

ව්‍යාපාරයක ණයට ගැනුම් නිසා ඇතිවන වෙළඳ ණය හිමියන්ගේ පෞද්ගලික ගිණුම් ඇතුළත් අතිරේක ලෙජරය "ගැනුම් ලෙජරය" වේ.

## විකුණුම් ලෙජරය / ණයගැතියන්ගේ ලෙජරය

ව්‍යාපාරයක් තම ගනුදෙනුකරුවන්ට ණයට විකුණුම් කළ විට ඇති වන වෙළඳ ණයගැතියන්ගේ පෞද්ගලික ගිණුම් ඇතුළත් අතිරේක ලෙජරය "විකුණුම් ලෙජරය" වේ.

## ලෙජර් ගිණුම් වර්ගීකරණය

මූල්‍ය ගනුදෙනු හා සිද්ධීන් ඇතුලත් සම්පූර්ණ වාර්තාව පොදු ලෙජරය ලෙස හැඳින්වේ. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට අවශ්‍ය වන වත්කම්, වගකීම්, ප්‍රාග්ධනය, ආදායම් හා වියදම් වලට අදාල ගිණුම් මෙම ලෙජරය තුල අන්තර්ගත වේ. මෙය ගිණුම් සටහන් කිරීම හා සම්බන්ධ ප්‍රධානතම පොත ලෙස සැලකෙන අතර එහි ව්‍යාපාරයට අදාල සියලුම ගිණුම් අන්තර්ගත වේ. පොදු ලෙජරය නාමමාත්‍රික ලෙජරය ලෙස ද හැඳින්වේ.

## ලෙජර් ගිණුම් සම්ප්‍රදායික ලෙස වර්ග කිරීම

**(1)** ........................................................................................

ගොඩනැගිලි, වාහන, යන්ත්‍ර, උපකරණ යනාදී දේපළ සම්බන්ධ ගිණුම් මෙනමින් හැඳින්වේ. ස්ථාවර වත්කම් මූර්ත ගිණුම් ගණයට අන්තර්ගත වේ. තවදුරටත් විස්තර කළහොත් ණයහිමි හා ණයගැති ගිණුම් හැර ශේෂයන් ඉදිරියට ගෙන යා හැකි සහ ශේෂය පහළට ගෙන යා හැකි අනෙකුත් ගිණුම්, මූර්ත ගිණුම් ලෙස වර්ගීකරණය කළ හැක.

**(2)** ........................................................................................

ව්‍යාපාර ණයහිමියන්ට, ණයගැතියන්ට අදාල ගිණුම් පෞද්ගලික ගිණුම් ලෙස හැඳින්වේ.

**(3)** ........................................................................................

ව්‍යාපාරයේ ආදායම් වියදම් සහ මිලදී ගැනීම් හා සම්බන්ධ ගිණුම් නාමමාත්‍රික ගිණුම් ලෙස හැඳින්වේ. ව්‍යාපාරයේ සියලුම ආදායම් හා වියදම් ගිණුම් මෙම ගිණුම් වර්ගීකරණයට අදාල වේ.

## ලෙජර් ගිණුම් නූතන වර්ගීකරණය

(1) වත්කම් ගිණුම්

(2) වගකීම් ගිණුම්

(3) හිමිකම් ගිණුම්

(4) ආදායම් ගිණුම්

(5) වියදම් ගිණුම්

## ගිණුම් තුලනය හා ශේෂ පිරික්සුම

ගණුදෙනු හා සිද්ධීන් සටහන් කරන ලද ලෙජර් ගිණුම් වර්ෂය අවසානයේ දී තුලනය කෙරේ. එසේ කිරීමෙන් ලැබෙන හර ශේෂයන් හා බැර ශේෂයන් ශේෂ පිරික්සුම (Trial Balance) යනුවෙන් හඳුන්වන ශේෂ ලැයිස්තුවකට ඇතුලත් කර හර ශේෂයන්ගේ හා බැර ශේෂයන්ගේ තුලනතාවය පරීක්ෂා කරනු ලැබේ.

ශේෂ පිරික්සුම යනු ගණුදෙනු හා සිද්ධීන් සටහන් කරන ලද ගිණුම් පොත් පංතියක හර ශේෂයන්ගේ හා බැර ශේෂයන්ගේ සංඛ්‍යාත්මක නිරවද්‍යතාවය පරීක්ෂා කර බැලීම සඳහා පිලියෙළ කරනු ලබන ලේඛණයකි. වත්කම්, වගකීම්, හිමිකම්, වියදම් හා ආදායම් යන සියලුම ගිණුම් ශේෂයන් ශේෂ පිරික්සුමකින් පෙන්නුම් කෙරේ.

මෙවැනි ශේෂ පිරික්සුමක් පිළියෙල කරනු ලැබීමෙන් පහත සඳහන් ප්‍රයෝජන ලබාගත හැකිය.

(1) සටහන් කරන ලද ගණුදෙනුවල සංඛ්‍යාත්මක නිරවද්‍යතාවය තහවුරු කරගත හැකිය.
(2) ගිණුම් වර්ෂයක් තුල සිදු වූ සියලුම ගණුදෙනුවල සංක්ෂිප්ත සටහනක් ශේෂ පිරික්සුම තුලින් ලබාදීම.
(3) ගිණුම් තැබීමේදී සිදු වූ දෝෂ අනාවරණය කර ගැනීමටත් ඒවා නිවැරදි කිරීමටත් හැකි වීම.
(4) මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට උපකාරී වීම.

## අභ්‍යාසය 29

2015 ජනවාරි 01 දින, **සුනිල්**, SP ට්‍රේඩර්ස් නමින් ව්‍යාපාරයක් ආරම්භ කළේය. පළමු සතිය තුල සිදු වූ ව්‍යාපාරික ගනුදෙනුවල විස්තර පහත පරිදි වේ.

| දිනය | ගනුදෙනුව |
|---|---|
| 2015.01.01 | ඔහුගේ අළුත් ව්‍යාපාරය පිහිටුවීම සඳහා **සුනිල්** කළ ආයෝජනය පහත පරිදි වේ.<br>■ ව්‍යාපාරය ලියාපදිංචි කිරීම සඳහා රු. 50,000/- ක් ගෙවන ලදී.<br>■ **සුනිල්** සතුව තිබූ රු. 2,500,000/- ක් වටිනා ලොරියක් බෙදාහැරීමේ කටයුතු සඳහා ව්‍යාපාරයට යොදවන ලදී.<br>■ ව්‍යාපාරය නමින් බැංකු ගිණුමක් විවෘත කර රු.2,000,000/- ක් **සුනිල්** විසින් තැන්පත් කරන ලදී. |
| 2015.01.02 | චෙක්පතකින් (අංක 345543) රු.175,000/- ක් ආපසු ගෙන, නැවත ගෙවනු ලබන මාස 6 ක රු.150,000/- ක තැන්පතුවක් (refundable deposit) සහ රු.25,000/- ක මාසික ගෙවල් කුලිය ගෙවීම. |
| 2015.01.04 | චෙක්පතකින් (අංක 345544) රු. 2,175,000/- ක් වටිනා භාණ්ඩ නැවත විකිණීම සඳහා මිලදී ගැනීම. |
| 2015.01.05 | චෙක්පතකින් (අංක 345545) රු.175,000/- මුදල් ගෙන ව්‍යාපාරයේ ආරම්භක උත්සවයේ වියදම් සඳහා රු.145,000/- ක් වියදම් දරා ඉතිරිය සුළු මුදල් ගිණුමකට මාරු කිරීම. |
| 2015.01.06 | ආරම්භක උත්සවයේදී රු.975,000/- ක භාණ්ඩ මුදලට විකිණීම. එදිනම එම මුදල් බැංකුගත කිරීම. |

ඔබ විසින්, පහත දෑ **පිළියෙල කරන්න.**

(a) ව්‍යාපාරයේ පොදු ලෙජරය

(b) 2015 ජනවාරි 07 දිනට ශේෂ පිරික්සුම **(AAT - July 2015 - 08 Marks)**

## අභ්‍යාසය 30

පහත දැක්වෙන එකිනෙක ගණුදෙනුව ද්විත්ව සටහන් න්‍යායට අනුව ලෙජර් ගිණුම් වල සටහන් කර ශේෂ පිරික්සුම පිළියෙල කරන්න.

1. අයිතිකරු විසින් රු. 100 000 ක මුදලක් යොදා ව්‍යාපාරය ආරම්භ කිරීම.
2. අයිතිකරු රු. 30 000 ක් වටිනා ලීබඩු ව්‍යාපාරයට යෙදුවා.
3. යෙදවූ ප්‍රාග්ධනය ප්‍රමාණවත් නොවූ හෙයින් රු. 80 000 ක බැංකු ණයක් ලබා ගත්තා.
4. රු. 40 000 ක් වටිනා ගෘහ භාණ්ඩ ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා මිලදී ගත්තා.
5. රු. 15 000 ක් වටිනා බඩු තොග අත්පිට මුදලට ගත්තා.
6. රු. 10 000 ක් වටිනා බඩු තොග සුනිල්ගෙන් ණයට මිලදී ගත්තා.
7. වෙළෙඳ බඩු තොග අත්පිට මුදලට වික්කා, රු. 20 000 යි.
8. නිමල්ට වෙළෙඳ බඩු තොග ණයට වික්කා රු. 12 000 යි.
9. සුනිල්ගෙන් ණයට ගත් රු. 2 000 ක් වටිනා භාණ්ඩ ආපසු යැවුවා.
10. නිමල්ට විකුණූ භාණ්ඩ වලින් රු. 3 000 ක් වටිනා භාණ්ඩ ආපසු හරවා එව්වා.
11. විදුලිබිල ගෙව්වා, රු. 1 000 යි.

12. බැංකු ණයෙන් කොටසක් ගෙව්වා රු. 5 000 යි.
13. ලද ගෙවල්කුලී ආදායම රු. 4 000 යි.
14. ණයට ගත් භාණ්ඩ වෙනුවෙන් සුනිල්ට ගෙව්වා රු. 5 000 යි.
15. නිමල්ගෙන් මුදල් ලැබුනා රු. 7 000 යි.

## අභ්‍යාසය 31

ශෙහාන්, 2017 අප්‍රේල් 01 දින රු. 2,200,000/- ක මුදලක් ආයෝජනය කරමින් ශෙහාන් ට්‍රේඩර්ස් නමින් කේවලස්වාමි ව්‍යාපාරයක් ඇරඹුවේ ය.

2018 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ලැබීම් ජර්නලයෙහි සහ මුදල් ගෙවීම් ජර්නලයෙහි (මුදල් පොත) සාරාංශය පහත දැක්වේ.

| | රු. |
|---|---|
| මුදල් ලැබීම් ජර්නලය (ලැබීම්): | |
| ශෙහාන් යෙදවූ ප්‍රාග්ධනය | 2,200,000 |
| වෙළෙඳ ණයගැතියන්ගෙන් ලැබීම් | 2,300,000 |
| මුදල් ගෙවීම් ජර්නලය (ගෙවීම්): | |
| විදුලි බිල්පත් | 150,000 |
| වැටුප් | 450,000 |
| වෙළෙඳ ණයහිමියන්ට ගෙවීම් | 700,000 |
| 2017 ඔක්තෝම්බර් 01 දින අත්පත් කරගත් වාහනය | 2,000,000 |
| ගැනිලි | 400,000 |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත.

(1) සියලු විකුණුම් සහ ගැනුම් ණය පදනම මත සිදු කරනු ලබයි.

(2) වාහනය සඳහා සරල මාර්ග ක්‍රමය යටතේ පිරිවැය මත 10% බැගින් ක්ෂය ප්‍රතිපාදනය කිරීමට කළමනාකරණය තීරණය කර තිබේ.

(3) 2018 මාර්තු 31 දිනට පහත සඳහන් වියදම් උපචිත කළ යුතු වේ.

| | රු. |
|---|---|
| වැටුප් | 50,000 |
| විදුලිය | 15,000 |

(4) 22018 මාර්තු 31 දිනට ශෙහාන් ට්‍රේඩර්ස්හි ගිණුම් පොත්වල පහත සඳහන් ශේෂයන් ද පැවතුණි.

| | රු. |
|---|---|
| වෙළෙඳ ණයහිමියෝ | 800,000 |
| වෙළෙඳ ණයගැතියෝ | 900,000 |

(5) 2018 මාර්තු 31 දිනට තොග කිසිවක් නොතිබුණි.

ඔබ විසින් කළ යුතු දෑ:

2018 මාර්තු 31 දිනට ශෙහාන් ට්‍රේඩර්ස් හි ශේෂ පිරික්සුම පිළියෙල කරන්න.

**(AAT - July 2018)**

## අභ්‍යාසය 32

සැම්, මූලික ප්‍රාග්ධන වශයෙන් රු. 580,000 ක් මුදලින් ආයෝජනය කරමින් 2020 අප්‍රේල් 01 දින සැම් ට්‍රේඩර්ස් නමින් කේවලස්වාමි ව්‍යාපාරයක් ආරම්භ කළේය.

පහත දැක්වෙන අතිරේක තොරතුරු ද සපයා ඇත.

(1) 2020 අප්‍රේල් 30 දිනෙන් අවසන් වූ මාසය සඳහා මුදල් පාලන ගිණුම (මුදල් පොත) පහත පරිදි විය.

| | රු. | | රු. |
|---|---|---|---|
| මූලික ප්‍රාග්ධන ආයෝජනය | 580,000 | වැටුප් සහ වේතන | 1,375,000 |
| අමතර ප්‍රාග්ධන ආයෝජනය | 1,200,000 | කුලිය | 125,000 |
| මුදලට විකුණුම් | 5,500,000 | වෙළෙඳ ණයහිමියන්ට ගෙවීම් | 2,250,000 |
| වෙළෙඳ ණයහගැතියන්ගෙන් ලැබීම් | 1,900,000 | ලොරි රථයක් මිලදී ගැනීම (2020 අප්‍රේල් 01 දින අත්පත් කරගන්නා ලදී) | 2,400,000 |
| | | මුදලට ගැනුම් | 2,000,000 |
| | | විදුලිය | 45,000 |
| | | ශේෂය ප/ගෙ | 985,000 |
| | 9,180,000 | | 9,180,000 |

(2) 2020 අප්‍රේල් 30 දිනට පහත ශේෂයන් ගිණුම් පොත්වල දක්නට ලැබුණි.

| | රු. |
|---|---|
| වෙළෙඳ ණයගැතියෝ | 1,400,000 |
| වෙළෙඳ ණයහිමියෝ | 2,100,000 |
| උපචිත වැටුප් | 25,000 |

(3) ලොරි රථය වාර්ෂිකව පිරිවැය මත 20% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි.

(4) 2020 අප්‍රේල් 30 දිනට තොග කිසිවක් නොතිබුණි.

ඔබ විසින් කළ යුතු ද,

2020 අප්‍රේල් 30 දිනට ශේෂ පිරික්සුම පිළියෙල කරන්න. **(AAT - January 2021)**

## අභ්‍යාසය 33

01. කේවල ස්වාමි ව්‍යාපාරයක අයිතිකරු වන රණසිංහ, ඔහුගේ පෞද්ගලික මෝටර් රථය, ඔහුගේ ව්‍යාපාරයට මාරු කළේය. මෙම ගනුදෙනුව වාර්තා කිරීමට අදාල නිවැරදි ද්විත්ව සටහන වන්නේ,

    (1) මුදල් ගිණුම හර කිරීම සහ ප්‍රාග්ධන ගිණුම බැර
    (2) මෝටර් වාහන ගිණුම හර සහ මුදල් ගිණුම බැර
    (3) මෝටර් වාහන ගිණුම හර සහ ප්‍රාග්ධන ගිණුම බැර
    (4) ප්‍රාග්ධන ගිණුම හර සහ මෝටර් රථ වාහන ගිණුම බැර **(AAT - January 2021)**

02. පොත් සාප්පුවක පහත සඳහන් එක් එක් ගනුදෙනුව සඳහා නිවැරදි ද්විත්ව සටහන සඳහන් කරන්න.

    (a) මාර්තු මාසය සඳහා ගෙවිය යුතු විදුලිය රු. 82,000 කි.
    (b) නැවත විකිණීම සඳහා රු. 25,000 ක ලිපිද්‍රව්‍ය ණයට මිලදී ගන්නා ලදී
    (c) ව්‍යාපාරයේ බැංකු ගිණුමට රු. 12,000 ක පොලී ආදායමක් ලැබුණි

**(AAT - July 2019)**

03. රසිත්, කේවලස්වාමි ව්‍යාපාරයක් වන රසිත් ට්‍රේඩර්ස් හි අයිතිකරු වේ. රසිත් ට්‍රේඩර්ස් හි පහත දක්වෙන එක් එක් ගනුදෙනුව සඳහා නිවැරදි ද්විත්ව සටහන සඳහන් කරන්න.

    (a) නැවත විකිණීම සඳහා රු. 95,000 ක භාණ්ඩ, මුදලට මිලදී ගැනීම
    (b) රසිත්, ඔහුගේ පුතාගේ අමතර පන්ති ගාස්තු වන රු. 24,000 ව්‍යාපාරයේ මුදලින් ගෙවීම
    (c) රසිත්, රු. 1,000,000 ක් වටිනා ඔහුගේ පුද්ගලික ඉඩම අමතර ප්‍රාග්ධනයක් ලෙස ව්‍යාපාරයට පවරා දුන්නේය.

**(AAT - January 2019)**

04. ජනිත්, කේවලස්වාමි ව්‍යාපාරයක් වන ජනිත් ට්‍රේඩර්ස්හි අයිතිකරු වේ. ජනිත් ට්‍රේඩර්ස්හි පහත සඳහන් එක් එක් ගනුදෙනුව සඳහා නිවැරදි ද්විත්ව සටහන සඳහන් කරන්න.

    (a) කාර්යාල ප්‍රයෝජනය සඳහා මෝටර් රථයක් සීමාසහිත AM (පෞද්ගලික) සමාගමෙන් රු 1,000,000/- කට ණයට මිලට ගැනීම
    (b) වර්ෂය තුළ දී අයිතිකරු විසින් ඔහුගේ, පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ලබාගත් භාණ්ඩවල පිරිවැය රු. 12,000/- කි.
    (c) වෙළෙඳ ණයගැතියෙකු වූ මලික් විසින් ජනිත්ගෙන් මිලට ගත් රු. 40,000/- ක භාණ්ඩ හානිවී තිබීම නිසා ආපසු හරවා එවන ලදී. **(AAT - July 2018)**

05. සිල්වා, කේවලස්වාමි ව්‍යාපාරයක් වන කමල් ඉලෙක්ට්‍රිකල්ස් හි අයිතිකරු වේ. කමල් ඉලෙක්ට්‍රිකල්ස්හි පහත සඳහන් එක් එක් ගනුදෙනු සඳහා නිවැරදි ද්විත්ව සටහන සඳහන් කරන්න.

(a) මුදලින් රු. 1,000,000/- ක් සහ රු. 250,000/- ක් වටිනා කාර්යාල උපකරණ ආයෝජනය කරමින් සිල්වා ව්‍යාපාරයක් ආරම්භ කළේ ය.

(b) නැවත විකිණීම සඳහා රු. 800,000/- ක විදුලි උපකරණ ණය පදනම මත අජිත්ගෙන් මිලට ගැනීම

(c) සිල්වා ඔහුගේ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා රු. 5,600/- ක් මුදලින් ලබාගෙන ඇත.

**(AAT - January 2018)**

06. කේවල ස්වාමි ව්‍යාපාරයක් වන SS ට්‍රේඩින් හි පහත සඳහන් එක් එක් ගනුදෙනුව සඳහා නිවැරදි ද්විත්ව සටහන සඳහන් කරන්න.

(a) අයිතිකරු විසින් අතිරේක ප්‍රාග්ධනය වශයෙන් ව්‍යාපාරයට මුදලින් රු. 800,000 ක් ආයෝජනය කර තිබීම.

(b) රු. 50,000 ක වෙළෙඳ ණයගැතියෙකුගෙන් එම මුදල සම්පූර්ණයෙන් පියවා දැමීම සඳහා, මුදලින් රු. 45,000/- ක් ලැබී තිබුණි.

(c) රු. 10,000/- ක පොලී ආදායමක් බැංකු ගිණුමට ලැබී තිබුණි. **(AAT July 2017)**

07. කේවල ස්වාමි ව්‍යාපාරයක සිදුවූ පහත සඳහන් එක් එක් ගනුදෙනුව සඳහා අදාල ද්විත්ව සටහන සඳහන් කරන්න.

(a) කාර්යාලයීය භාවිතය සඳහා ණය පදනම මත සීමාසහිත ඇන් සමාගමෙන් රු. 30,000/- ක් වටිනා ගෘහ භාණ්ඩ මිලට ගන්නා ලදී.

(b) අයිතිකරුගේ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා වර්ෂය තුළදී ගන්නා ලද භාණ්ඩවල පිරිවැය රු. 15,000/- ක් විය.

(c) ණයහිමියෙකුගේ රු. 32,000/- ක් වූ ඉන්වොයිසියක් රු. 30,000/- ක් ගෙවා සම්පූර්ණයෙන් පියවා දමන ලදී.

08. බැංකු ශේෂයක් මත උපයා ඇති පොලිය සටහන් කරන නිවැරදි ද්විත්ව සටහන වන්නේ,

(1) මුදල් ගිණුම හර කිරීම සහ වෙළෙඳ ගෙවිය යුතු මුදල් ගිණුම බැර කිරීම

(2) පොලී ආදායම් ගිණුම හර කිරීම සහ බැංකු ගිණුම බැර කිරීම


(3) බැංකු ගිණුම හර කිරීම සහ මුදල් ගිණුම බැර කිරීම

(4) බැංකු ගිණුම හර කිරීම සහ පොලී ආදායම් ගිණුම බැර කිරීම **(AAT - January 2015)**

# මූලික සටහන් පොත්

## ගිණුම්කරණ ක්‍රියාවලිය (Accounting Process)

ව්‍යාපාර ගණුදෙනු හා සිද්ධීන් ගිණුම් පොත් පංතියක සටහන් කිරීම හා අදාල ගිණුම්කරණ ක්‍රියාවලිය පහත දැක්වේ.




## මූලාශ්‍ර ලේඛන (Source documents)

ගිණුම්කරණ යෙදවුම් (දත්ත) ලබා ගැනිම සිදුවනුයේ මූලාශ්‍ර ලියවිලි මගිනි. මෙම ලියවිලි මගින් ගනුදෙනුවක් ඇති වූ බවට ලිඛිත සාක්ෂියක් සපයනවා පමණක් නොව මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගත වන්නාවූ තොරතුරු සත්‍යාපනය කිරීමේ හැකියාවක් ද ලබා දෙයි. ගිණුම්කරණයේ දී භාවිත කරන්නා වූ විවිධ වූ මූලාශ්‍ර ලියවිලි පහත දක්වා ඇත.

| | ගණුදෙනුව | මූලාශ්‍ර ලේඛනය |
|---|---|---|
| 1. | මුදල් ලැබීම් | ........................................................................................ |
| 2. | මුදල් ගෙවීම | ........................................................................................ |
| 3. | භාණ්ඩ ණයට ගැනීම | ........................................................................................ |
| 4. | භාණ්ඩ ණයට විකිණීම | ........................................................................................ |
| 5. | සේවා සැපයීම | ........................................................................................ |
| 6. | භාණ්ඩ ආපසු යැවීම | ........................................................................................ |
| 7. | භාණ්ඩ ආපසු එවීම | ........................................................................................ |
| 8. | සුළු වියදම් ගෙවීම් | ........................................................................................ |

## මූලාශ්‍ර ලේඛනවල වැදගත්කම

- ගනුදෙනුව ගිණුම්ගත කිරීම සඳහා පදනම් ලියවිල්ලක් ලෙස මූලාශ්‍ර ලේඛන යොදා ගැනීම
- ගනුදෙනුවට අදාළ සම්පූර්ණ විස්තර දැනගත හැකි වීම
- ගනුදෙනුව සිදු වූ බවට ලිඛිත සාක්ෂියක් ලෙස යොදා ගත හැකි වීම
- මූලාශ්‍ර ලේඛනයට අත්සන යොදා ඇති නිලධාරියා වෙත එහි වගකීම පැවරිය හැකි වීම

## අනෙකුත් උපකාරක ලියවිලි

### ගැනුම් ඇණවුම් Purchase Order (PO)

ගැනුම්කරු විසින් අවශ්‍ය කරන භාණ්ඩයේ හෝ සේවාවේ ප්‍රභේදය, ප්‍රමාණය හා එකඟ වූ මිල ගණන් ඇතුළත් කරමින් විකුණුම්කරුට යවන වාණිජ සහ පළමු රාකාරිමය ලියවිල්ල ගැනුම් ඇණවුමයි. ගැනුම් ඇණවුම අනුමත වූ විට විකුණුම්කරු විසින් ගැනුම්කරු හා විකුණුම්කරු අතර ගිවිසුමක් ඇති කර ගනී. එතෙක් ගැනුම් ඇණවුම අනුමත වනතුරු ගිවිසුමක් නොපවතී. බාහිර සැපයුම්කරුවන්ගෙන් භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේදී එය පාලනය කිරීමට මෙය යොදා ගනී.

### භාණ්ඩ ලැබීම් පත්‍රය Goods Received Note (GRN)

භාණ්ඩ ලැබෙන අවස්ථාවේදී එය සටහන් කීමට මෙය යොදා ගනී. සියලුම භාණ්ඩ ලැබූ බවට සහතික කිරීමට මෙය යොදා ගන්නා අතර ගෙවීම් සිදු කිරීමට පෙර ගැනුම් ඇණවුම් සමඟ මෙම පත්‍රිකාව සසඳනු ලැබේ.

සැපයුම්කරුගෙන් භාණ්ඩ ලද බව සහතික කරමින් ගැනුම්කරුගේ ගබඩා කළමනාකරු විසින් භාණ්ඩ ලැබීම් පත්‍රය නිකුත් කරනු ලබයි. මෙය අභ්‍යන්තර පරිශීලනයට වන අතර එය පිටපත් තුනකින් හෝ ඊට වඩා වැඩි ගණනකින් සමන්විත වන අතර ගබඩා දෙපාර්තමේන්තුවට හා ගිණුම්කරණ දෙපාර්තමේන්තුවට එක බැගින් තබා ගනී. ව්‍යාපාරයක තොග මෙහෙයුම් පාලනය සිදු කරන විට භාණ්ඩ ලැබීම් පත්‍ර ගබඩා ලෙජරයේ සටහන් තැබීමට පදනමක් පිහිටුවයි.

## ද්‍රව්‍ය ඉල්ලුම් පත්‍රය / ද්‍රව්‍ය අධියාචනා පත්‍රිකාව
## Material Requisition Note (MRN)

ගබඩාවේ තිබෙන යම් නිශ්චිත අයිතමයක අවශ්‍ය ප්‍රමාණය පවත්වාගෙන යාම සඳහා ව්‍යාපාරයේ ගබඩා දෙපාර්තමේන්තුව මඟින් ද්‍රව්‍ය ඉල්ලුම්පත පිළියෙල කර එය ද්‍රව්‍ය මිලදී ගැනීමට ගැනුම් දෙපාර්තමේන්තුවට යවනු ලැබේ. මෙය ව්‍යාපාරයේ නිෂ්පාදන කටයුතු සුමටව පවත්වා ගෙන යෑමට අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා ගැනීමට දැනුම් දීම සඳහා ගබඩා දෙපාර්තමේන්තුව විසින් ගැනුම් දෙපාර්තමේන්තුවට යවන අභ්‍යන්තර ලියවිල්ලකි.

## මූලික පොත් / උපයෝගී පොත් - Subsidiary Books


ව්‍යාපාර ගනුදෙනු හා සිද්ධීන් ද්විත්ව සටහන් ක්‍රමයට අනුව සටහන් කරනු ලබන්නේ ලෙජර් ගිණුම්වල වුවත් එය එක එල්ලේ ම සිදු නොකරයි. ව්‍යාපාර ගනුදෙනු පළමුවෙන් ඒවා සිදුවන දින අනුපිළිවෙලින් හා විස්තරාත්මක වශයෙන් මූලික පොත් පංතියක සටහන් කරනු ලබයි. මෙම මූලික පොත් පංතිය උපයෝගී පොත් යනුවෙන් හඳුන්වනු ලැබේ. මූලික සටහන් පොත් (Primentry Books), දෛනික පොත් (Day Books), ජ'නලයන් (Journals) යනාදි නම් වලින් හඳුන්වන්නේද මෙම උපයෝගී පොත් පංතිය යි. එක් එක් වර්ගයට අයත් ගනුදෙනු සටහන් කිරීමට වෙන වෙන ම උපයෝගී පොතක් බැගින් පවත්වා ගැනීම සාමාන්‍ය ගිණුම්කරණ සම්ප්‍රදාය වී ඇත.

මූලාශ්‍ර ලේඛන පදනම් කරගෙන, ගනුදෙනුවල ස්වභාවය අනුව පහත දක්වෙන මූලික සටහන් පොත් ව්‍යාපාර විසින් පවත්වා ගෙන යයි.

- මුදල් ලැබීම් ජර්නලය / ලැබීම් ජර්නලය
- මුදල් ගෙවීම් ජර්නලය / ගෙවීම් ජර්නලය
- සුළු මුදල් ගෙවීම් ජර්නලය
- ගැනුම් ජර්නලය
- ආපසු යැවුම් ජර්නලය
- විකුණුම් ජර්නලය
- ආපසු එවුම් ජර්නලය
- පොදු ජර්නලය

ඉහත කී උපයෝගී පොත්වල සටහන් කෙරෙන ගනුදෙනු හා ඊට අදාළ මූලාශ්‍ර ලියවිලි පිළිබඳ සාරාංශයක් පහත දැක් වේ.

| අංකය | ගනුදෙනුව | මූලාශ්‍ර ලේඛන | මූලික සටහන් පොත |
|---|---|---|---|
| 01 | මුදලින් සිදුවන ගනුදෙනු<br>1. මුදල් ලැබීම්<br>2. මුදල් ගෙවීම් | <br>ලදුපත<br>ගෙවුම් වවුචරය | <br>මුදල් ලැබීම් ජ'නලය<br>මුදල් ගෙවීම් ජ'නලය |
| 02 | සුළු මුදල් ගනුදෙනු | සුළු මුදල් වවුචරය | සුළු මුදල් පොත |
| 03 | නැවත විකිණීමේ අරමුණින් භාන්ඩ ණයට ගැනීම | ගැනුම් ඉන්වොයිසිය | ගැනුම් ජ'නලය |
| 04 | නැවත විකිණීමේ අරමුණින් ගත් භාණ්ඩ ණයට විකිණීම | විකුණුම් ඉන්වොයිසිය | විකුණුම් ජ'නලය |
| 05 | නැවත විකිණීමේ අරමුණින් ණයට ගත් භාණ්ඩ ආපසු යැවීම | හරපත | ආපසු යැවුම් ජ'නලය |
| 06 | නැවත විකිණීමේ අරමුණින් ගත් භාන්ඩ ණයට විකුණූ පසු ආපසු එවීම | බැරපත | ආපසු එවුම් ජ'නලය |
| 07 | වෙනත් ගනුදෙනු<br>1. ආරම්භක ජ'නල් සටහන<br>2. දේපළ පිරියත හා උපකරණ ණයට ගැනීම හා ණයට විකිණීම<br>3. වැරදි නිවැරදි කිරීමේ සටහන්<br>4. ගැලපුම් සටහන්<br>5. පියවීමේ සටහන්<br>6. මාරු කිරීමේ සටහන් | පොදු ජ'නල් වවුචර | පොදු ජ'නලය |




## අභ්‍යාසය 34

01. ගබඩාවට භාණ්ඩ ලැබීම වාර්තා කිරීම සඳහා උපයෝගී කරගන්නා ලියවිල්ල වන්නේ,

(1) මිලදී ගැනුම් ඇණවුමයි.
(2) මිලදී ගැනිමේ අධියාචනා පත්‍රයයි.
(3) භාණ්ඩ ලැබීමේ පත්‍රිකාවයි
(4) ද්‍රව්‍ය අධියාචනා පත්‍රයයි **(AAT July 2020)**

02. පහත සඳහන් ඒවා අතුරෙන්, සැපයුම්කරුවන්ගෙන් ලැබුණු භාණ්ඩ වාර්තා කිරීම සඳහා ගබඩා භාරකරු විසින් නිකුත් කරනු ලබන මූලාශ්‍ර ලියවිල්ල වන්නේ,

(1) ද්‍රව්‍ය අධියාචනා පත්‍රය (Material Requisition Note - MRN) යි
(2) ගැනුම් ඇණවුම (Puchase Order - PO) යි
(3) භාණ්ඩ ලැබීමේ පත්‍රිකාව (Goods Received Note) යි
(4) ජර්නල් වවුචරය යි **(AAT July 2018)**

03. භාණ්ඩ හෝ සේවා සඳහා වර්ගයන්, ප්‍රමාණයන් සහ එකඟ වූ මිල ගණන් දක්වමින්, ගැනුම්කරුවෙකු විසින් විකුණුම්කරුවෙකු වෙත නිකුත් කරනු ලබන මූලාශ්‍ර ලියවිල්ල වන්නේ,

(1) ගැනුම් ඇණවුම [Purchase Order (PO)]
(2) භාණ්ඩ ලැබීමේ පත්‍රිකාව [Good Received Note (GRN)]
(3) ද්‍රව්‍ය අධියාචනා පත්‍රිකාව [Material Requisition Note (MRN)]
(4) ගැනුම් ඉන්වොයිසිය [Purchase Invoice (PI)] **(AAT - January 2018)**

04. ගැනුම් ඇණවුම් (Purchase Order - PO) යනු,

(1) අත්තිත්වයක් විසින් භාණ්ඩ ලැබෙන අවස්ථාවේදී එම ලැබීම් සටහන් කිරීමට භාවිතා කරන ලියවිල්ලකි.
(2) ගබඩා දෙපාර්තමේන්තුව විසින් අවශ්‍ය ද්‍රව්‍ය පිළිබඳව දැනුම් දීමට භාවිත කරන ලියවිල්ලකි.
(3) භාණ්ඩ හෝ සේවා සඳහා වර්ගය, ප්‍රමාණය සහ එකඟ වූ මිල ගණන් දක්වමින් ගැනුම්කරුවෙකු විසින් විකුණුම්කරුවෙකු වෙත නිකුත් කරන ලියවිල්ලකි.
(3) ඇණවුම් කළ ඒවා වෙනුවෙන් ගෙවීම් ඉල්ලා සිටීම සඳහා සැපයුම්කරුවෙකු විසින් භාවිතා කරන ලියවිල්ලකි. **(AAT - July 2017)**

## මුදල් ලැබීම් ජ'නලය හා මුදල් ගෙවීම් ජ'නලය

- ව්‍යාපාරයකට විවිධ අන්දමින් ලැබෙන මුදල් හා චෙක්පත්, මුල් වරට සටහන් කරන මූලිකසටහන් පොත **මුදල් ලැබීම් ජ'නලය** වේ.
- මුදල් හා චෙක්පත් ලැබීමට අදාළ මූලාශ්‍ර ලේඛනය **ලදුපත** වේ.
- ව්‍යාපාරයක් බැංකු ගිණුම මගින් සිදු කරන ගෙවීම්, මුල්වරට සටහන් කරන මූලික සටහන් පොත, **මුදල් ගෙවීම් ජ'නලය** වේ.
- බැංකු ගිණුම් මගින් සිදු කරන ගෙවීම්වලට අදාළ මූලාශ්‍ර ලේඛනය **ගෙවීම් වවුචරය** වේ.
- ව්‍යාපාරයක මුදල් ගනුදෙනු, අදාළ මූලාශ්‍ර ලේඛන උපයෝගී කර ගෙන ලැබීම් හා ගෙවීම් ජ'නලවල වාර්තා කිරීමෙන් පසුව, ද්විත්ව සටහන් මූලධර්මවලට අනුව පොදු ලෙජරයට පිටපත් කළ යුතු ය.

### මුදල් ලැබීම් ජර්නලය / ලැබීම් ජර්නලය

| දිනය | ලදුපත් අංකය | විස්තරය | දුන් වට්ටම් රු. | වටිනාකම රු. | ලැබීම් විශ්ලේෂණය (රු.) | | | | ලෙජර් පිටුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | අත්පිට විකුණුම් | ණයගැති ලැබීම් | වෙනත් ආදායම් | වෙනත් ලැබීම් | |
| | | | | | | | | | |
| | | | XX | XXX | XX | XX | XX | XXX | |
| | | | (1) | | (2) | (3) | (4) | (5) | |

### මුදල් ගෙවීම් ජර්නලය / ගෙවීම් ජර්නලය

| දිනය | වවුචර් අංකය | විස්තරය | ලද වට්ටම් රු. | වටිනාකම රු. | ලැබීම් විශ්ලේෂණය (රු.) | | | | ලෙජර් පිටුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | අත්පිට ගැනුම් | ණයහිමි ගෙවීම් | වියදම් | වෙනත් ගෙවීම් | |
| | | | | | | | | | |
| | | | XX | XXX | XX | XX | XX | XXX | |
| | | | (6) | | (7) | (8) | (9) | (10) | |

ඉහත මුදල් ලැබීම් හා ගෙවීම් ජර්වල්වල සටහන් කළ ගනුදෙනු පහත ආකාරයට පොදු ලෙජරයට පිටපත් කළ යුතුය.

### මුදල් ගිණුම / මුදල් පාලන ගිණුම

(රු.)

| | | | | | |
|---|---|---|---|---|---|
| ඉ/ගෙ ශේෂය | | | (7) | ගැනුම් ගිණුම | XX |
| (2) | විකුණුම් ගිණුම | XX | (8) | ණයහිමි පාලන ගිණුම | XX |
| (3) | ණයගැති පාලන ගිණුම | XX | (9) | වියදම් ගිණුම | XX |
| (4) | ආදායම් ගිණුම | XX | (10) | වෙනත් ගෙවීම් ගිණුම | XX |
| (5) | වෙනත් ලැබීම් ගිණුම | XX | | ශේ/ප/ගෙ | XX |
| | | XXX | | | XXX |
| ඉ/ගෙ/ශේෂය | | XX | | | |

**හෝ**

**මුදල් ගිණුම / මුදල් පාලන ගිණුම** (රු.)

| | | | |
|---|---|---|---|
| ඉ/ගෙ/ශේෂය | XX | විවිධ ගිණුම් / මුදල් ගෙවීම් | XX |
| විවිධ ගිණුම් / මුදල් ලැබීම් | XX | ශේ/ප/ගෙ | XX |
| | XXX | | XXX |
| ඉ/ගෙ/ශේෂය | | | |

**දුන් වට්ටම් ගිණුම** (රු.)

| | | | |
|---|---|---|---|
| (1) ණයගැති පාලන ගිණුම | XX | | |

**විකුණුම් ගිණුම** (රු.)

| | | | |
|---|---|---|---|
| | | (2) මුදල් ගිණුම | XX |

**ණයගැති පාලන ගිණුම** (රු.)

| | | | |
|---|---|---|---|
| ඉ/ගෙ/ශේෂය | XX | (1) දුන් වට්ටම් ගිණුම | XX |
| | | (3) මුදල් ගිණුම | XX |

**ආදායම් ගිණුම** (රු.)

| | | | |
|---|---|---|---|
| | | (4) මුදල් ගිණුම | XX |

**ලද වට්ටම් ගිණුම** (රු.)

| | | | |
|---|---|---|---|
| | | (6) ණයහිමි පාලන ගිණුම | XX |

**ණයහිමි පාලන ගිණුම** (රු.)

| | | | |
|---|---|---|---|
| (6) ලද වට්ටම් ගිණුම | XX | ඉ/ගෙ/ශේෂය | XX |
| (8) මුදල් ගිණුම | XX | | |

**ගැනුම් ගිණුම** (රු.)

| | | | |
|---|---|---|---|
| (7) මුදල් ගිණුම | XX | | |

**බැංකු ණය ගිණුම** (රු.)

| | | | |
|---|---|---|---|
| (10) මුදල් ගිණුම | XX | (5) මුදල් ගිණුම | XX |

**සේවක වැටුප් ගිණුම** (රු.)

| | | | |
|---|---|---|---|
| (9) මුදල් ගිණුම | XX | | |

මුදල් ලැබීම් ජ'නලයේ තීරුවල එකතුව පහත සඳහන් ආකාරයට පොදු ලෙජරයට පිටපත් කළ යුතු වේ.

| දුන් වට්ටම් තීරුවේ එකතුව | දුන් වට්ටම් ගිණුම හර | ණයගැති පාලන ගිණුම බැර |
|---|---|---|
| එක් එක් තීරුවේ එකතුව / | මුදල් ගිණුම හර | විකුණුම් ගිණුම බැර |
| වට්නාකම් තීරුවේ එකතුව | | ණයගැති පාලන ගිණුම බැර |
| අත්පිට විකුණුම් තීරුවේ එකතුව | | එක් එක් අදාළ ආදායම් ගිණුම් |
| ණයගැති ලැබීම් තිරුවේ එකතුව | | වෙන් වෙන්ව බැර |
| ආදායම් තීරුවේ එකතුව | | එක් එක් අදාළ ලැබීම් ගිණුම් |
| වෙනත් ලැබීම් තීරුවේ එකතුව | | වෙන් වෙන් ව බැර |

මුදල් ගෙවීම් ජ'නලයේ තීරුවල එකතුව පහත සඳහන් ආකාරයට පොදු ලෙජරයට පිටපත් කළ යුතු වේ.

| ලද වට්ටම් තීරුවේ එකතුව | ණයහිමි පාලන ගිණුම හර | ණයගැති පාලන ගිණුම බැර |
|---|---|---|
| අත්පිට ගැනුම් තීරුවේ එකතුව | ගැනුම් ගිණුම හර | |
| ණයහිමි ගෙවීම් තිරුවේ එකතුව | ණයහිමි පාලන ගිණුම හර | |
| වියදම් තීරුවේ එකතුව | අදාළ එක් එක් වියදම් ගිණුම්වලට වෙන් වෙන්ව හර | |
| වෙනත් ගෙවීම් තීරුවේ එකතුව | අදාළ එක් එක් ගිණුම්වලට වෙන් වෙන්ව හර | |
| එක් එක් තීරුවේ එකතුව / වට්නාකම් තීරුවේ එකතුව | | මුදල් ගිණුම බැර |

## අභ්‍යාසය 35

කමල්ගේ ව්‍යාපාරයේ 2021 අප්‍රේල් මාසයේ සිදු වූ මුදල් ලැබීම් හා මුදල් ගෙවීම් සම්බන්ධ ගනුදෙනු පහත දැක්වේ. ඒ ඇසුරින් මුදල් ලැබීම් ජර්නලය හා මුදල් ගෙවීම් ජ'නලය පිළියෙල කර ලෙජරයට පිටපත් කරන්න.

| | | | |
|---|---|---|---|
| 04.05 | අත්පිට විකුණුම් | (ල.අ. 01) | 50,000 |
| 04.06 | මාසික විදුලි බිල ගෙවීම් | (ව.අ. 01) | 8,000 |
| 04.08 | ණයහිමි - පෙරේරාට ගෙවීම් | (ව.අ. 02) | 12,500 |
| | ලද මුදල් වට්ටම් | | 1,500 |
| 04.10 | ලද ගොඩනැගිලි කුලී | (ල.අ. 02) | 10,000 |
| 04.10 | අත්පිට ගැනුම් | (ව.අ. 03) | 17,000 |
| 04.12 | මාසික රක්‍ෂණ ගාස්තු | (ව.අ. 04) | 12,000 |
| 04.14 | ණයහිමි - සාගරට ගෙවීම් | (ව.අ. 05) | 17,000 |
| | ලද මුදල් වට්ටම් | | 2,000 |
| 04.16 | කාර්යාල ලී බඩු ගැනීමට | (ව.අ. 06) | 60,000 |
| 04.18 | ණයගැති අමල්ගෙන් ලැබුණා | (ල.අ. 04) | 8,000 |
| | අමල්ට දුන් වට්ටම් | | 500 |
| 04.18 | වැටුප් හා වේතන ගෙවීම් | (ව.අ. 07) | 20,000 |
| 04.20 | අත්පිට විකුණුම් | (ල.අ. 05) | 60,000 |
| 04.20 | බැංකු ණය වාරිකය ගෙවීමම් (පොලිය රු. 2,000) | (ව.අ. 08) | 12,000 |
| 04.22 | (ණයගැති) රුවන්ගෙන් ලැබුණු | (ල.අ. 06) | 47,500 |
| | දුන් වට්ටම් | | 2,500 |
| 04.22 | අත්පිට ගැනුම් | (ව.අ. 09) | 20,000 |
| 04.26 | මුදල් ගැනිලි | (ව.අ. 10) | 4,000 |
| 04.28 | අතිරේක ප්‍රාග්ධනය යෙදීම | (ල.අ. 08) | 50,000 |

# අභ්‍යාසය 36

2021.04.01 අරුණ රු. 600,000 ක් ව්‍යාපාරය නමින් බැංකු ගිණුමක තැන්පත් කර වෙළෙඳ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. පහත දැක්වෙන්නේ අප්‍රේල් මාසය තුළ සිදු වූ ගනුදෙනු වේ.

| ගනුදෙනු සිදු වූ දිනය 2021 | විස්තරය | | චෙක් අංකය | වටිනාකම රු. |
|---|---|---|---|---|
| .04.01 | අත්පිට ගැනුම් | (ව.අ. 1) | 900500 | 150,000 |
| .04.02 | ලී බඩු සහ සවිකිරීම් මිලට ගත්තා | (ව.අ. 2) | 900501 | 90,000 |
| .04.02 | අත්පිට විකුණුම් | (ල.අ. 2) | 823631 | 300,000 |
| .04.03 | මාලාගෙන් ණයට ගැනුම් | | | 100,000 |
| .04.04 | අමල්ට ණයට විකුණුම් | | | 150,000 |
| .04.05 | සුළු මුදල් භාරකරුට ගෙවීම් | (ව.අ. 3) | 900502 | 20,000 |
| .04.06 | ගෙන ඒමේ කුලී ගෙව්වා | (ව.අ. 4) | 900503 | 15,000 |
| .04.07 | ගයාන්ගෙන් ණයට ගැනුම් | | | 80,000 |
| .04.08 | චතුරට ණයට විකුණුම් | | | 90,000 |
| .04.08 | මහජන බැංකුවෙන් ලබා ගත් ණය මුදල | (ල.අ. 3) | | 300,000 |
| .04.09 | මාලාට ගෙව්වා. ලද වට්ටම් රු. 5,000 | (ව.අ. 5) | 900504 | 95,000 |
| .04.10 | අමල්ගෙන් 10%ක වට්ටමකට යටත්ව | | | |
| | මුදල් ලැබුණා | (ල.අ. 4) | 831814 | 135,000 |
| .04.12 | අත්පිට විකුණුම් | (ල.අ. 5) | මුදල් | 350,000 |
| .04.14 | ගොඩනැගිලි කුලී ගෙවීම් | (ව.අ. 6) | 900505 | 40,000 |
| .04.15 | අත්පිට ගැනුම් | (ව.අ. 7) | 900506 | 110,000 |
| .04.18 | ගයාන්ට ගෙව්වා අඩු කළ වට්ටම් 10% | (ව.අ. 8) | 900507 | 72,000 |
| .04.22 | චතුරගෙන් ලැබීම් දුන් වට්ටම් 10% | (ල.අ. 6) | මුදල් | 81,000 |
| .04.25 | සේවක වේතන ගෙව්වා | (ව.අ. 9) | 900508 | 15,000 |
| .04.26 | අරුණගේ ගැනිලි | (ව.අ. 10) | 900509 | 5,000 |
| .04.28 | ලද කොමිස් | (ල.අ. 7) | මුදල් | 6,000 |

අරුණගේ ව්‍යාපාරයේ ගනුදෙනු ලැබීම් ජර්නලයක හා ගෙවීම් ජර්නලයක සටහන් කර, ඒවායේ ඇතුළත් තොරතුරු පොදු ලෙජරයට පිටපත් කරන්න.

## අභ්‍යාසය 37

රවිඳුගේ ව්‍යාපාරය බැංකු ගිණුමක් මගින් සියළු මුදල් ගනුදෙනු සිදු කරයි. 2021.04.01 දිනට බැංකු ගිණුමේ ශේෂය රු. 1,200,000 කි. 2018 අප්‍රේල් මාසයේ සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.

| ගනුදෙනු සිදු වූ දිනය 2021 | මූලාශ්‍ර ලේඛන අංකය | විස්තරය | චෙක් අංකය | වටිනාකම (රු.'000) |
|---|---|---|---|---|
| 04.01 | ල. අ. 01 | අත්පිට විකුණුම් | 246512 | 3,000 |
| 04.02 | ව. අ. 01 | අත්පිට ගැනුම් | 461261 | 1,000 |
| 04.03 | ල. අ. 02 | සුදත්ගෙන් ලැබුණා | මුදල් | 500 |
| 04.04 | ව. අ. 02 | සුරනිට ගෙව්වා | 461262 | 900 |
| 04.05 | ව. අ. 03 | විදුලි බිල ගෙව්වා | 461263 | 300 |
| 04.06 | ල. අ. 03 | ගෙවල් කුලී ආදායම | මුදල් | 400 |
| 04.08 | ල. අ. 04 | නාමල්ගෙන් 10%ක වට්ටමකට යටත්ව ලැබුණා | 125214 | 360 |
| 04.10 | ව. අ. 04 | සුගත්ට 10%ක වට්ටමකට යටත්ව ගෙව්වා | 461264 | 180 |
| 04.12 | ව. අ. 05 | සේවක වේතන ගෙව්වා | 461265 | 120 |
| 04.14 | ව. අ. 06 | මෝටර් රථයක් ගත්තා | 461266 | 2,750 |
| 04.15 | ල. අ. 05 | බැංකු ණයක් ගත්තා | මුදල් | 3,500 |
| 04.18 | අගරු නි. | නාමල්ගෙන් ලැබී තැන්පත් කර ඇති චෙක්පත අගරු වී ඇති බව බැංකුව දැනුම් දුන්නා. | 236325 | 360 |
| 04.20 | ල. අ. 06 | අත්පිට විකුණුම් | මුදල් | 3,300 |
| 04.22 | ව. අ. 07 | චතුරට ගෙව්වා. ලද වට්ටම 10% කි. | 461267 | 450 |
| 04.24 | අගරු නි. | විදුලිය බිල සඳහා ගෙවූ චෙක්පත ලිවීමේ දෝෂයක් නිසා ආපසු ලැබුණා. | 461263 | 300 |
| 04.26 | ව. අ. 08 | රවිඳුගේ ගැනිලි | 461268 | 100 |
| 04.28 | ව. අ. 09 | අත්පිට ගැණුම් | 461269 | 1,200 |
| 04.29 | ල. අ. 07 | ජනිතගෙන් ලැබුණා | 138146 | 350 |
| 04.30 | ව. අ. 10 | විදුලිය වියදම් | 461270 | 300 |

අවශ්‍ය වන්නේ,

01. ඉහත තොරතුරු ඇසුරින් 2021 අප්‍රේල් මාසය සඳහා රවිඳුගේ ව්‍යාපාරයේ ලැබීම් ජ'නලයේ හා ගෙවීම් ජ'නලය පිළියෙල කිරීම.

02. මුදල් ලැබීම් ජ'නලයේ හා මුදල් ගෙවීම් ජ'නලයේ තොරතුරු උපයෝගී කරගෙන මුදල් ගිණුම පිළියෙල කිරීම

**වෙළෙඳ වට්ටම්**

කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් මිලදී ගැනීමේ දී හෝ විකිණීමේ දී ලකුණු කළ මිලෙන් කරන අඩු කිරීම, වෙළෙඳ වට්ටම ලෙස හඳුන්වන අතර වෙළෙඳ වට්ටම් වල මූලික අරමුණ අලෙවි ප්‍රවර්ධනය වේ. වෙළෙඳ වට්ටම් ගිණුම්ගත නොකෙරේ.

**මුදල් වට්ටම්**

කිසියම් ණයගැතියෙකුගෙන් ලැබීමට ඇති මුදලින් හෝ ණයහිමියෙකුට ගෙවීමට ඇති මුදලින් නියමිත කාලයේ දී මුදල් ලැබීමේ දී හෝ මුදල් ගෙවීමේ දී කෙරෙන අඩු කිරීම මුදල් වට්ටමක් ලෙස හැඳින්වේ. අරමුණෑ නියමිත කාලය තුළ දී මුදල් අයකර ගැනීමයි. මුදල් වට්ටම් ගිණුම්ගත කෙරේ

**මුදල් වට්ටම් වර්ග කිරීම**

1. දුන් වට්ටම්
2. ලද වට්ටම්

**දුන් වට්ටම්**

ණයගැතියෙකු විසින් නියමිත කාලය තුළ දී මුදල් ගෙවීමේ දී ලැබීමට ඇති මුදලින් කෙරෙන අඩු කිරීම දුන් වට්ටම් ලෙස හැඳුන්වන අතර, දුන් වට්ටම් ව්‍යාපාරයට වියදමකි.

දුන් වට්ටම් ගිණුම (හර) xxx

    වෙළෙඳ ලැබිය යුතු දෑ පාලන ගිණුම xxx

**ලද වට්ටම්**

කිසියම් ව්‍යාපාරයක් විසින් ණයහිමියෙකුට නියමිත කාලය තුළදී මුදල් ගෙවීමේ දී ගෙවීමට ඇති මුදලින් කෙරෙන අඩු කිරීම ලද වට්ටම් ලෙස හඳුන්වන අතර, ලද වට්ටම් ව්‍යාපාරයට ආදායමකි.

වෙළෙඳ ගෙවිය යුතු දෑ පාලන ගිණුම xxx

    ලද වට්ටම් ගිණුම xxx

# සුළු මුදල් ගෙවීම් ජ'නලය

සුළු වියදම් හා බැඳි ගනුදෙනු සටහන් කිරීමට සුළු මුදල් ගෙවීම් ජර්නලය පවත්වා ගනී.

| ගනුදෙනු | රු |
|---|---|
| බඩු තොග ගැනුම් | 12,000 |
| සංග්‍රහ වියදම් | 60 |
| මුද්දර සහ ලියුම් කවර ගත්තා | 30 |
| වැටුප් ගෙව්වා | 8,000 |
| ලිපිගොනු කවර ගත්තා | 20 |
| පොතක් ගත්තා | 12 |
| ලී බඩු ගත්තා | 55,000 |
| ගමන් වියදම් ගෙව්වා | 120 |

- ව්‍යාපාරයක සිදුවන ගනුදෙනු අතර අඩු වටිනාකම් සහිත ගනුදෙනු සිදු වේ.
- එවැනි ගනුදෙනු සඳහා නිදසුන් ලෙස,
    - සංග්‍රහ වියදම් ගෙවීම
    - මුද්දර හා ලියුම් කවර සඳහා ගෙවීම
    - ලිපිගොනු කවර සඳහා ගෙවීම
    - පෑනක් ගැනීමට ගෙවීම
    - ගමන් ගාස්තු ගෙවීම, දැක්විය හැකි බව
- එවැනි අඩු වටිනාකම් සහිත ගෙවීම් සුළු ගෙවීම් ලෙස හැඳින්වේ.
- ව්‍යාපාරයක දෛනික ව සිදු වන ගනුදෙනු අතර, සුළු වටිනාකම් සහිත ගනුදෙනු හඳුනා ගෙන ඒවා වෙන ම මූලික සටහන් පොතක සටහන් කළ යුතු ය. එම මූලික සටහන් පොත, සුළු මුදල් ගෙවීම් ජර්නලය ලෙස හැඳින්වේ.
- සුළු මුදල් ගෙවීම් ජර්නලයේ ගනුදෙනු වාර්තා කිරීමට යොදා ගන්නා මූලාශ්‍ර ලේඛන, **සුළු මුදල් ගෙවීම් වවුචරය** වේ.
- සුළු ගෙවීම් සඳහා සාමාන්‍යයෙන් මසක් වැනි කාලයකට වැය වන මුදල් කලින් තීරණය කර, ප්‍රධාන මුදල් භාරකරු විසින් සුළු මුදල් භාරකරුට ලබා දෙයි.
- එකවර ලබා දෙන මෙම මුදල සුළු මුදල් අග්‍රිමය ලෙස හැඳින්වෙන අතර, එම අග්‍රිම මුදල අවසාන වීමට ආසන්නයේ නැවතත් සුළු මුදල් භාරකරු මුදල් ඉල්ලා සිටිය යුතු අතර එවිට ගෙවූ මුදලට සමාන මුදලක් නැවත ලබා දෙමින් අග්‍රිමය සම්පූර්ණ කිරීම, සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූරණය කිරීම ලෙස හැඳින්වේ.

| සුළු මුදල් ගෙවීම් ජර්නලය | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| දිනය | විස්තරය | ව.අ. | ගෙවීම් රු. | ලිපි ද්‍රව්‍ය රු | කුලී වියදම් රු. | ගමන් වියදම් රු | විවිධ වියදම් රු | වෙනත් රු | ලෙජර් පිටුව |
| | | | | | | | | | |

- විශ්ලේෂණ තීරු සහිත සුළු මුදල් ගෙවීම් ජර්නලයක සුළු වියදම් ගෙවීම් ඇතුළත් කළ යුතුය.
- සුළු මුදල් ගෙවීම් ජර්නලය හා පොදු ලෙජරයේ සටහන් කරන ගනුදෙනුවලට අදාළ ද්විත්ව සටහන් පහත පරිදි වේ.
  - ▲ සුළු මුදල් අග්‍රිමය ලැබීම (මෙය ගෙවීම් ජර්නලයේ වාර්තා කිරීමෙන් අනතුරු ව පහත පරිදි ගිණුම්ගත වේ.

    සුළු මුදල් පාලන ගිණුම හර
    මුදල් පාලන ගිණුම බැර

  - ▲ අග්‍රිමය ප්‍රතිපූරණය කිරීම

    සුළු මුදල් පාලන ගිණුම හර
    මුදල් පාලන ගිණුම බැර

  - ▲ සුළු වියදම් තීරුවල එකතුව

    ඒ ඒ වියදම් ගිණුම් හර
    සුළු මුදල් පාලන ගිණුම බැර

## අභ්‍යාසය 38

ගයනිගේ ව්‍යාපාරයේ 2021 මාර්තු මාසයේ පළමු දෙසතියේ මුදල් ගෙවීම් හා සම්බන්ධ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ. ඒවා ඇසුරින් ගයනිගේ ව්‍යාපාරයේ සුළු මුදල් ගෙවීම් ජර්නලය පිළියෙල කර ලෙජරයට පිටපත් කරන්න.

මුදල් අග්‍රිමය රු. 3,000 යි.

| දිනය 2021 | වවුචර් අංකය | ගයනිගේ ව්‍යාපාරය | රු. |
|---|---|---|---|
| 3/04 | 01 | සංග්‍රහ වියදම් | 300 |
| 3/05 | 02 | මුද්දර හා ලියුම් කවර | 280 |
| 3/06 | 03 | පිරිසිදු කිරීමේ වියදම් | 400 |
| 3/08 | 04 | තැපැල් ගාස්තු | 400 |
| 3/09 | 05 | කුලී රථ ගාස්තු | 350 |
| 3/10 | 06 | අමල්ට ගෙව්වා | 700 |
| 3/11 | 07 | පිරිසිදු කිරීමේ වියදම් | 250 |

## අභ්‍යාසය 39

ලක්සි සමාගම 2021 පෙබරවාරි 01 දින සිට රු. 3 000 ක අග්‍රිමයක් සහිතව සුළු මුදල් ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලදි. 2021 පෙබරවාරි මාසය තුල දී පහත සඳහන් ගනුදෙනු සිදුවිය.

පෙබ. 01 - සුළු මුදල් අග්‍රිමය ලෙස රු. 3 000 ක් ප්‍රධාන මුදල් භාරකරුගෙන් ලැබුණි.
04 - බෙදාහැරීමේ වියදම් සඳහා රු. 400 ක් ගෙවන ලදී.
07 - රු. 120 ක මුද්දර මිලදී ගන්නා ලදී.
12 - කාර්යාලීය ජනේල පිරිසිදු කිරීමට රු. 300 ක් ගෙවන ලදී.
17 - ව්‍යාපාර අයිතිකරු ඔහුගේ පුද්ගලික වියදම් සඳහා රු. 500 ක් සුළු මුදල්වලින් ලබා ගන්නා ලදී.
20 - ඡායා පිටපත් යන්ත්‍රය පිරිසිදු කිරීම සඳහා රු. 300 ක් ගෙවන ලදී.
22 - රු. 325 ක ලිපිද්‍රව්‍ය මිලදී ගන්නා ලදී.
25 - මෙම ව්‍යාපාරයේ වෙළෙඳ ණයහිමියෙකු වූ රවීට රු. 500 ක් ගෙවන ලදී.
27 - අයිතිකරුගේ පුද්ගලික මෝටර් රථය සේදීම සඳහා සේවා මධ්‍යස්ථානයට රු. 250 ක් ගෙවන ලදී.

**අවශ්‍ය වන්නේ:**

(1) මාසය අග දී සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූරණය කිරීම දක්වමින් 2021 පෙබරවාරි මාසය සඳහා විශ්ලේෂණ තීරු සහිතව සුළු මුදල් ගෙවීම් ජ'නලය පිළයෙල කිරීම.

(2) අදාළ ලෙජර් ගිණුම්වලට සියලු ම ගනුදෙනු පිටපත් කර දක්වන්න.

## අභ්‍යාසය 40

සමන්ගේ ව්‍යාපාරයේ 2021 අගෝස්තු මාසයේ සුළු මුදල් ගනුදෙනු පහත දක්වේ.

| | | | රු. |
|---|---|---|---|
| 8/01 | | ප්‍රධාන මුදල් භාරකරු විසින් සුළු මුදල් භාරකරුට අග්‍රිමය ලබා දීම | 2,000 |
| 8/01 | වවුචර් අංක 01 | ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම | 200 |
| 8/03 | වවුචර් අංක 02 | ගමන් වියදම් දැරීම | 60 |
| 8/05 | වවුචර් අංක 03 | සංග්‍රහ වියදම් දැරීම | 250 |
| 8/07 | වවුචර් අංක 04 | ඉටි පන්දම් මිලදී ගැනීම | 150 |
| 8/10 | වවුචර් අංක 05 | මුද්දර මිලදී ගැනීම | 100 |
| 8/12 | වවුචර් අංක 06 | කඩදාසි මිලදී ගැනීම | 110 |
| 8/15 | වවුචර් අංක 07 | තේ කොළ මිලදී ගැනීම | 90 |
| 8/20 | වවුචර් අංක 08 | සාගර ට ගෙවීම | 300 |
| 8/22 | වවුචර් අංක 09 | වාහන නතර කිරීමේ ගාස්තු | 50 |
| 8/25 | වවුචර් අංක 10 | ලියුම් කවර මිලදී ගැනුම් | 120 |
| 8/28 | වවුචර් අංක 11 | විවිධ වියදම් | 40 |
| 8/31 | | අග්‍රිමය ප්‍රතිපූර්ණය කළා | |

අවශ්‍ය වන්නේ,

1. සුළු මුදල් ගෙවීම් ජ'නලය
2. අදාළ ලෙජර් ගිණුම

## අභ්‍යාසය 41

01. 2017 ජනවාරි මාසයේ පළමුවන සතියේ අමල් ට්‍රේඩර්ස් හි පොත් වලින් සුළු මුදල් ගනුදෙනු වලට අදාළව පහත සඳහන් තොරතුරු උපුටා ගන්නා ලදී.

| දිනය | විස්තරය | රු. |
|---|---|---|
| ජනවාරි 01 | සුළු මුදල් අග්‍රිමය | 5,000 |
| ජනවාරි 03 | ලිපිද්‍රව්‍ය මිලට ගැනීම | 575 |
| ජනවාරි 05 | මුද්දර මිලට ගැනිම | 250 |
| ජනවාරි 06 | ගමන් වියදම් | 450 |

2017 ජනවාරි 07 දින සුළු මුදල් අයකැමි වෙත ලැබුණු සුළු මුදල් ප්‍රතිපූරණය වන්නේ,

(1) රු. 3,725/- කි.　　(2) රු. 5,000/- කි.

(3) රු. 1,275/- කි.　　(4) රු. 6,275/- කි

**(AAT - January 2017)**

02. සමාගමක් රු.15,000/- ක සුළු මුදල් අග්‍රිමයක් පවත්වා ගනී. අග්‍රිමය මාසිකව ප්‍රතිපූර්ණය කරනු ලැබේ. 2015 මැයි මාසය තුල, සුළු මුදල් වලට සම්බන්ධ පහත සඳහන් ගනුදෙනු සිදු විය.

| | රු. |
|---|---|
| සංග්‍රහ වියදම් | 6,500 |
| ලිපිද්‍රව්‍ය වියදම් | 2,500 |
| බෙදාහැරීමේ වියදම් | 5,000 |

2015 ජුනි මස ආරම්භයේදී සුළු මුදල් භාරකරුට ප්‍රතිපූර්ණය වශයෙන් ලැබිය යුතු මුදල කොපමණද? **(AAT - July 2015)**

03. **ආශී ඒනටප්‍රයිසස්** හි 2011 අප්‍රේල් මස මුල් සති දෙකේ සුළු මුදල් ගනුදෙනුවල සාරාංශය පහත සඳහන් පරිදි විය.

2011 අප්‍රේල් 01 දින ප්‍රධාන මුදල් අයකැමිගෙන් සුළු මුදල් අග්‍රීමය ලෙස ලැබුන මුදල රු. 2,500/- කි.

| දිනය | වවුචර අංකය | විස්තරය | රු. |
|---|---|---|---|
| 2011.04.05 | 001 | ලිපිද්‍රව්‍ය මිල දී ගැනුම් | 400 |
| 2011.04.10 | 002 | මුද්දර ගාස්තු | 500 |
| 2011.04.12 | 003 | ගමන් වියදම් | 650 |
| 2011.04.15 | 004 | පුවත්පත් මිල දී ගැනීම් | 800 |

2011 අප්‍රේල් 16 දින, සුළු මුදල් අග්‍රීමය ප්‍රතිපූර්ණය සිදු කරන ලදි. පුතිපූර්ණය කරන ලද මුදල වන්නේ,

(1) රු. 2,500/- කි.　　(2) රු. 150/-කි.

(3) රු. 2,350/- කි.　　(4) ඉහත සඳහන් කිසිවක් නොවේ.

**(AAT - January 2012)**

# ගැනුම් ජ'නලය/දෛනික ගැනුම් පොත

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

**ගැනුම් ජ'නලයේ ආකෘතිය**

ගැනුම් ජ'නලය

| දිනය | ඉන්. අංකය | සැපයුම්කරු | වටිනාකම |
|---|---|---|---|
| | | | |

**ගැනුම් ජ'නලය ලෙජරයට පිටපත් කරන ආකාරය**

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

- වෙළඳ භාණ්ඩ ණයට ගැනුම් සටහන් කිරීම සඳහා පවත්වා ගෙන යන මූලික සටහන් පොත, ගැනුම් ජර්නලය හෙවත් ගැනුම් පොත වේ.
- ගැනුම් ජර්නලයට අදාළ මූලාශ්‍ර ලේඛනය ඉන්වොයිසිය වේ (ගැනුම් ඉන්වොයිසිය).
- වෙළඳ භාණ්ඩ ණයට ගැනීමේ දී භාණ්ඩවල ලකුණු කළ මිලෙන් යම් ප්‍රතිශතයක් අඩු කරන අතර, එය වෙළඳ වට්ටම් ලෙස හඳුන්වනු ලැබේ.
- වෙළඳ වට්ටම් ඉන්වොයිසියෙන් අඩු කර දැක්වීම පමණක් සිදු කරයි. ගිණුම්ගත නොකරයි.

## අභ්‍යාසය 42

රෙදි පිළි, ව්‍යාපාරයක් පවත්වාගෙන යන ජනාදරීගේ ව්‍යාපාරිකයන්ගේ 2021 අප්‍රේල් මාසයේ සිදු වූ ණයට ගැනුම් පහත දැක්වේ.

2021 අප්‍රේල්

02. ප්‍රනාන්දු සහ පුත්‍රයෝ වෙතින් ඉන්වොයිස් අංක 413 යටතේ ණයට ගත් භාණ්ඩ
මීටරයක් රු. 45 බැගින් චීත්ත මීටර 150
මීටරයක් රු. 75 බැගින් සුදු පොප්ලින් මීටර 100
ලද වෙළෙඳ වට්ටම් 10%

10. අමරපාල සහ සමාගමෙන් ඉන්වොයිසි අංක 350 යටතේ ණයට ගත් භාණ්ඩ
මීටරයක් රු. 100 බැගින් කලිසම් රෙදි මීටර් 50
ළමා කමිස රු. 75 බැගින් කමිස 20
ළමා කලිසමක් රු. 70 බැගින් කලිසම් 20
එකක් රු. 150 බැගින් ටී ෂර්ට් 10

25. සීතාගේ ව්‍යාපාරයෙන් ඉන්වොයිස් අංක 534 යටතේ ණයට ගත් භාණ්ඩ
එකක් රු. 500 බැගින් සාරි 50
මීටරයක් රු. 75 බැගින් කමිස රෙදි මීටර් 100
මීටරයක් රු. 80 බැගින් පාට ටෙට්රන් මීටර් 50
ලද වෙළෙඳ වට්ටම් 10%

ඉහත සඳහන් තොරතුරු ගැනුම් ජ'නලයේ සටහන් කර අදාළ ලෙජර් ගිණුම් වලට පිටපත් කරන්න.

## අභ්‍යාසය 43

සත්සරගේ ව්‍යාපාරය රෙදිපිළි වෙළෙඳ ව්‍යාපාරයකි. 2021 අගෝස්තු මාසයේ සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.

08/01 ඉන්වොයිසි අංක 200 යටතේ සඳුන්ගේ භාණ්ඩ ණයට ගැනුම්
- මීටර් 1 ක් රු. 500 බැගින් රෙදි මීටර් 100
- එකක් රු. 2,000 බැගින් කමිස 100
- අඩු කළ වට්ටම් 10%

8/15 ඉන්වොයිසි අංක 216 යටතේ අමල් ගෙන් ණයට ගැනුම් රු. 300,000 අඩු කළ වෙළෙඳ වට්ටම් 10%

8/21 ඉන්වොයිසි අංක 220 යටතේ සිරිමල් ගෙන් ණයට ගැනුම්
- එකක් රු. 1,200 බැගින් කලිසම් 100
- එකක් රු. 5,000 බැගින් සාරි 20
- එකක් රු. 3,000 බැගින් සල්වාර් 60

8/30 අත්පිට ගැනුම් රු. 200,000

අවශ්‍ය වන්නේ,

i. ගැනුම් ජ'නලය

ii. පොදු ලෙජරයේ අදාළ ගිණුම්

## අභ්‍යාසය 44

පහත සඳහන් ගනුදෙනු නාලක පොත්හලේ 2017 ජනවාරි මාසයේ පළමුවන සතියේ ණයට මිලදී ගැනුම්වලට අදාල වේ.

| අංකය | දිනය | ඉන්වොයිස් අංකය | සැපයුම්කරුවන්ගේ නම | අයිතමය පිළිබඳ විස්තර | | | වෙළෙඳ වට්ටම් |
|---|---|---|---|---|---|---|---|
| | | | | විස්තරය | ප්‍රමාණය (ඒකක) | ඒකකයක මිල (රු.) | |
| 1 | 2017.01.01 | 101 | සුනිමල් | අභ්‍යාස පොත් | 100 | 90 | 2% |
| 2 | 2017.01.04 | 303 | අමල් | පාට පැන්සල් පෙට්ටි | 25 | 180 | - |
| 3 | 2017.01.06 | 14 | නාමල් | පැන්සල් | 75 | 15 | - |

ඔබ විසින් කළ යුතු දෑ,

2017 ජනවාරි මාසයේ පළමුවන සතිය සඳහා නාලක පොත්හලේ දෛනික ගැනුම් පොත පිළියෙල කරන්න. **(AAT July 2017)**

# විකුණුම් ජ'නලය/දෛනික විකුණුම් පොත

## (Daily Sales Book)

.................................................................................................................................................................

.................................................................................................................................................................

.................................................................................................................................................................

.................................................................................................................................................................

- විකුණුම් ජර්නලයට අදාළ මූලාශ්‍ර ලේඛනය **ඉන්වොයිසිය** වේ (විකුණුම් ඉන්වොයිසිය).
- වෙළඳ භාණ්ඩ ණයට විකිණීමේ දී භාණ්ඩවල ලකුණු කළ මිලෙන් යම් ප්‍රතිශතයක් අඩු කරන අතර එය **වෙළඳ වට්ටම්** ලෙස හඳුන්වනු ලැබේ.
- වෙළඳ වට්ටම් ඉන්වොයිසියෙන් අඩු කර දැක්වීම පමණක් සිදු කරයි. ගිණුම්ගත නොකරයි.

**දෛනික විකුණුම් පොතේ ආකෘතිය**

විකුණුම් ජ'නලය

| දිනය | ඉන්. අංකය | ගැනුම්කරු | වටිනාකම |
|---|---|---|---|
| | | | |

**විකුණුම් ජ'නලය ලෙජරයට පිටපත් කරන ආකාරය**

.................................................................................................................................................................

.................................................................................................................................................................

.................................................................................................................................................................

.................................................................................................................................................................

## අභ්‍යාසය 45

01. විනීතාගේ සිල්ලර වෙළඳ ව්‍යාපාරයේ 2020 ඔක්තෝම්බර් මාසයේ ණයට විකුණුම් ගනුදෙනු පහත සඳහන් පරිදි විය.

2020 ඔක්තෝම්බර්

05. ආර්. එස්. පෙරේරාට ඉන්වොයිස් අංක 35 යටතේ විකුණුම්
කිලෝ ග්‍රෑම් 1 ක් රු. 35 බැගින් සීනි කිලෝ ග්‍රෑම් 100
කිලෝ ග්‍රෑම් 50 මිටියක් රු. 1,500 බැගින් හාල් මිටි 10
කිලෝ ග්‍රෑම් 1 ක් රු. 100 බැගින් මිරිස් කිලෝ ග්‍රෑම් 25
කිලෝ ග්‍රෑම් 1 ක් රු. 80 බැගින් තේ කිලෝ ග්‍රෑම් 50
දුන් වෙළෙඳ වට්ටම් 5%

15. කේ. සරත්ට ඉන්වොයිස් අංක 36 යටතේ විකුණුම්
එකක් රු. 80 බැගින් විනාකිරි බෝතල් 20
එකක් රු. 60 බැගින් සැමන් ටින් 50
එකක් රු. 20 බැගින් පපඩම් පැකට් 50
දුන් වෙළෙඳ වට්ටම් 2%

22. එන්. එල්. සිරිපාලට ඉන්වොයිස් අංක 37 යටතේ විකුණුම්
පරිප්පු කිලෝ ග්‍රෑම් 1 ක් රු. 50 බැගින් කිලෝ ග්‍රෑම් 100
මුං ඇට කිලෝ ග්‍රෑම් 1 ක් රු. 80 බැගින් කිලෝ ග්‍රෑම් 50
රතු ළූණු කිලෝ ග්‍රෑම් 1 ක් රු. 60 බැගින් කිලෝ ග්‍රෑම් 20
සුදු ළූණු කිලෝ ග්‍රෑම් 1ක් රු. 100 බැගින් කිලෝ ග්‍රෑම් 20
දුන් වෙළෙඳ වට්ටම් 5%

ඉහත සඳහන් තොරතුරු විකුණුම් ජ'නලයේ සටහන් කර අදාල ලෙජර් ගිණුම්වලට පිටපත් කරන්න.

## අභ්‍යාසය 46

අසංක, අසංක ට්‍රේඩර්ස් නම් කොන්ක්‍රීට් ගල් නිෂ්පාදනය කර විකිණීමේ නිරත කේවලස්වාමී ව්‍යාපාරයක අයිතිකරු වේ. 2017 දෙසැම්බර් මාසය සඳහා ණයට විකුණුම් පහත සඳහන් වේ.

| දිනය | ඉන්වොයිස් අංකය | සැපයුම්කරුගේ නම | අයිතම පිළිබඳ විස්තර | | | වෙළෙඳ වට්ටම |
|---|---|---|---|---|---|---|
| | | | විස්තරය | ප්‍රමාණය (ඒකක) | ඒකකයක මිල (රු) | |
| 2017.12.01 | 45 | AA හාඩ්වෙයාර් | පොඩි ගල් | 5,000 | 40 | |
| 2017.12.20 | 46 | AA හාඩ්වෙයාර් | ලොකු ගල් | 8,000 | 50 | 5% |
| 2017.12.22 | 47 | නාමල් ස්ටෝර්ස් | මධ්‍යම ගල් | 5,000 | 45 | |

ඔබ විසින් කළ යුතු දෑ,

අසංක ට්‍රේඩර්ස්හි 2017 දෙසැම්බර් මාසය සඳහා දෛනික විකුණුම් පොත පිළියෙල කරන්න.

**(AAT - January 2018)**

# ආපසු යැවුම් ජ'නලය

## Purchase Return Day Book

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

- ආපසු යැවුම් සටහන් කිරීම සඳහා භාවිත කරන මූලික සටහන් පොත ආපසු යැවුම් ජර්නලය හෙවත් **ආපසු යැවුම් පොත** වේ.
- ආපසු යැවුම් ජර්නලයේ ගනුදෙනු සටහන් කිරීමට භාවිත කර ගන්නා මූලාශ්‍ර ලේඛනය හරපත වේ.

**ආපසු යැවුම් ජ'නලයේ ආකෘතිය**

ආපසු යැවුම් ජ'නලය

| දිනය | හරපත් අංකය | සැපයුම්කරු | වටිනාකම |
|---|---|---|---|
| | | | |

**ආපසු යැවුම් ජ'නලය ලෙජරයට පිටපත් කරන ආකාරය**

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

## අභ්‍යාසය 47

හරබැරගේ රෙදිපිළි ව්‍යාපාරයේ 2021 අගෝස්තු මාසයේ ආපසු යැවුම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

08/03 හරපත් අංක 26 යටතේ මානෙල් සමාගමට ආපසු යැවුම්

- එකක් රු. 2,000 බැගින් කමිස 40
- එකක් රු. 10,000 බැගින් සාරි 05
- එකක් රු. 2,500 බැගින් ගවුම් 04
- අඩු කළ වෙළෙඳ වට්ටම් 10%
- ආපසු යැවීමට හේතුව - වැඩිපුර සපයා තිබීම වේ.

8/10 හරපත් අංක 27 යටතේ අරලියට ආපසු යැවුම් ලකුණු කළ මිල රු. 100,000
වෙළෙඳ වට්ටම් 10%
ආපසු යැවීමට හේතුව - ඇණවුමේ වූ වෙනසක් තිබීම වේ.

8/28 හරපත් අංක 28 යටතේ නීල් ට ආපසු යැවුම්

- එකක් රු. 1,000 බැගින් ටී ෂර්ට් 10
- එකක් රු. 2,000 බැගින් දිග කලිසම් 05
- එකක් රු. 500 බැගින් ළමා ඇඳුම් 20

ආපසු යැවීමට හේතුව - හානි වූ භාණ්ඩ සපයා තිබීම වේ.

අවශ්‍ය වන්නේ,

i. ආපසු යැවුම් ජ'නලය
ii. පොදු ලෙජරයේ අදාළ ගිණුම්

## අභ්‍යාසය 48

පහත දැක්වෙන්නේ සිරිපාලගේ ව්‍යාපාරයේ 2018 අප්‍රේල් මාසයට අදාළව ගැනුම් ජ'නලය හා ආපසු යැවුම් ජ'නලය වේ.

**ගැනුම් ජ'නලය**

| දිනය 2018 | ඉන්වොයිසි අංකය | සැපයුම්කරු | වටිනාකම (රු.) | ලෙජර් පිටුව |
|---|---|---|---|---|
| 04/05 | 335 | රමණී | 7,000 | |
| 04/08 | 426 | දයා | 14,000 | |
| 04/12 | 339 | දයා | 10,000 | |
| 04/18 | 526 | කසුනි | 8,000 | |
| 04/25 | 931 | අමාලි | 12,000 | |
| 04/30 | පොදු ලෙජරයට පිටපත් කළා | | **51,000** | |

**ආපසු යැවුම් ජර්නලය**

| දිනය 2018 | හරපත් අංකය | සැපයුම්කරු | වටිනාකම (රු.) | ලෙජර් පිටුව |
|---|---|---|---|---|
| 04/10 | 01 | දයා | 4,000 | |
| 04/22 | 02 | කසුනි | 1,800 | |
| 04/30 | පොදු ලෙජරයට පිටපත් කළා | | **5,800** | |

**අවශ්‍ය වන්නේ,**

ඉහත සඳහන් අගයන් අදාළ දිනට ලෙජරයට පිටපත් කිරීම

# ආපසු එවුම් ජ'නලය (ආපසු එවුම් පොත)

..................................................................................................................................................
..................................................................................................................................................
..................................................................................................................................................
..................................................................................................................................................

- ණයට විකුණු වෙළඳ භාණ්ඩ පහත සඳහන් හේතූන් මත ගනුදෙනුකරුවන් විසින් ආපසු එවීම සිදු කෙරේ.
  - කාලය ඉකුත් වීම
  - ඇණවුමට අනුකූල නොවීම
  - නෂ්ට වූ භාණ්ඩ වීම
- ආපසු එවුම් සටහන් කිරීම සඳහා භාවිත කරන මූලික සටහන් පොත ආපසු එවුම් ජර්නලය හෙවත් ආපසු එවුම් පොත වේ.
- ආපසු එවුම් ජර්නලයේ ගනුදෙනු සටහන් කිරීමට පදනම් කර ගන්නා මූලාශ්‍ර ලේඛනය බැරපත වේ.

**ආපසු එවුම් ජ'නලයේ ආකෘතිය**

ආපසු එවුම් ජ'නලය

| දිනය | බැරපත් අංකය | ගැනුම්කරු | වටිනාකම |
|---|---|---|---|
| | | | |

**ආපසු එවුම් ජ'නලය ලෙජරයට පිටපත් කරන ආකාරය**

..................................................................................................................................................
..................................................................................................................................................
..................................................................................................................................................
..................................................................................................................................................

## අභ්‍යාසය 49

අමරසිංහ ව්‍යාපාර සිල්ලර වෙළෙඳසැලක් පවත්වා ගෙන යන අතර, 2021 අගෝස්තු මාසයේ ආපසු එවුම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

08/05 බැරපත් අංක 22 යටතේ සඳලි ව්‍යාපාරයෙන් භාණ්ඩ ආපසු එවුම්

- පැකට් එකක් රු. 400 බැගින් කිරිපිටි පැකට් 20
- පැකට් එකක් රු. 100 බැගින් සීනි පැකට් 10
- අඩු කළ වෙළෙඳ වට්ටම් 10%
- ආපසු එවීමට හේතුව - ප්‍රවාහනයේ දී දෝෂ සිදු වී තිබීම

8/10 බැරපත් අංක 23 යටතේ වර්ණපුර සමාගමෙන් ආපසු එවුම්

- මිටි එකක් රු. 4,000 බැගින් සහල් මිටි 10
- මිටි එකක් රු. 6,000 බැගින් පිටි මිටි 05
- ආපසු එවීමට හේතුව - වැඩිපුර සපයා තිබීම වේ.

8/31 බැරපත් අංක 24 යටතේ සෙන්පුර ව්‍යාපාරයෙන් ආපසු එවුම් රු. 200,000
ආපසු එවීමට හේතුව - කල් ඉකුත් වී තිබීම නිසා වේ.

අවශ්‍ය වන්නේ,

i. ආපසු එවුම් ජ'නලය

ii. පොදු ලෙජරයේ අදාළ ගිණුම්

## අභ්‍යාසය 50

මහේෂ්ගේ ව්‍යාපරය ලී බඩු විකිණීමේ ව්‍යාපාරය කි. එම ව්‍යාපාරයේ 2019 අගෝස්තු මාසයේ සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.

08/03 ඉන්වොයිසි අංක 16 යටතේ ඉෂාර සමාගමෙන් ණයට ගැනුම්

- එකක් රු. 20,000 බැගින් ඇඳන් 20
- එකක් රු. 50,000 බැගින් අල්මාරි 10
- අඩු කළ වට්ටම 10%

8/05 ඉන්වොයිසි අංක 200 යටතේ සඳමාලි සමාගමට ණයට විකුණුම්

- එකක් රු. 30,000 බැගින් ඇඳන් 10
- එකක් රු. 70,000 බැගින් අල්මාරි 10

8/15 ඉන්වොයිසි අංක 111 යටතේ මයුර සමාගමෙන් ණයට ගැනුම්

- එකක් රු. 10,000 බැගින් ලී පෙට්ටි 40
- එකක් රු. 50,000 බැගින් පුටු සෙට් 20
- අඩු කළ වෙළෙඳ වට්ටම 10%

8/20 සීමාසහිත අනිල් සමාගමෙන් රු. 2,000,000 මෝටර් රථ ණයට ගැනීම

| | |
|---|---|
| 8/25 | ඉන්වොයිසි අංක 201 යටතේ අමල් සමාගමට ණයට විකුණුම් |
| | • එකක් රු. 15,000 බැගින් ලී පෙට්ටි 20 |
| | • එකක් රු. 70,000 බැගින් පුටු සෙට් 10 |
| 8/26 | හරපත් අංක 18 යටතේ ඉෂාර සමාගමට ආපසු යැවුම් |
| | • ඇඳන් 10 • අල්මාරි 05 |
| 8/27 | බැරපත් අංක 22 යටතේ සඳමාලි සමාගමෙන් අපසු එවුම් |
| | • ඇඳන් 05 • අල්මාරි 05 |
| 8/28 | හරපත් අංක 19 යටතේ මයුර සමාගමට ආපසු යැවීම |
| | • ලී පෙට්ටි 10 • පුටු සෙට් 02 |
| 8/30 | බැරපත් අංක 23 යටතේ අමල් සමාගමෙන් ආපසු එවුම් |
| | • ලී පෙට්ටි 10 • පුටු සෙට් 03 |
| 8/31 | රු. 200,000 මෝටර් රථයක් ප්‍රසන්න සමාගමෙන් ණයට ගැනීම |

අවශ්‍ය වන්නේ,

i. ගැනුම් ජ'නලය

ii. විකුණුම් ජ'නලය

iii. ආපසු යැවුම් ජ'නලය

iv. ආපසු එවුම් ජ'නලය

v. පොදු ලෙජරයේ අදාළ ගිණුම්

## අභ්‍යාසය 51

01. **සීමාසහිත BC සමාගමෙන්** අංක PO-89 දරණ ගැනුම් ඉන්වොයිසිය යටතේ **සීමාසහිත AD සමාගම** වෙත ලැබුණ භාණ්ඩවල පැවති සමහරක් දෝෂ හේතුවෙන් ඒවා නැවත **සීමාසහිත BC සමාගමට** හරවා යැවීමට තීරණය කරන ලදී. මේ සම්බන්ධයෙන් පිළියෙල කළ යුතු මූලාශ්‍ර ලියවිල්ල (Source Documnet) වන්නේ,

    (1) බැර පත
    (2) හරපත
    (3) ජර්නල් වවුචරය.
    (4) ද්‍රව්‍ය අධියාචනා පත්‍රය (Material Requisition Note) **(AAT - July 2015)**

02. **මහින්ද** විසින් ණය පදනම මත ජගත් ගෙන් රු. 100,000/- ක භාණ්ඩ මිල දී ගත් අතර භාණ්ඩ වලින් හරි අඩක් පසුව ජගත් වෙත ආපසු යවන ලදී.
භාණ්ඩ ආපසු එවීම සටහන් කිරීමට ජගත් විසින් නිකුත් කරනු ලබන්නේ පහත දැක්වෙන ලියවිලි අතුරෙන් කුමක් ද?

    (1) ඉන්වොයිසිය
    (2) බැරපත
    (3) හරපත
    (4) ප්‍රේෂණ දැන්වීම

**(AAT - July 2014)**

03. ගැනුම්කරු භාණ්ඩ ආපසු එවූ විට, විකුණුම්කරු විසින් නිකුත් කරනු ලබන මූලාශ්‍ර ලියවිල්ල (Source Document) වන්නේ පහත සඳහන් ඒවා අතුරෙන් කුමක් ද?

    (1) ජර්නල් වවුචරය
    (2) හරපත
    (3) බැරපත
    (4) ඉන්වොයිසිය **(AAT - July 2013)**

04. ණය පදනමට මිලදී ගත් භාණ්ඩ විකුණුම්කරුට ආපසු යැවේ නම්, ගැනුම්කරු විසින් නිකුත් කරනුයේ:

    (1) හරපතකි.
    (2) බැරපතකි.
    (3) භාණ්ඩ ලැබීම් පත්‍රයකි. (Good Received Note)
    (4) ඉන්වොයිසියකි. (Invoice) **(AAT - January 2013)**

# පොදු ජ'නලය (ප්‍රධාන ජ'නලය)

අනෙකුත් උපයෝගී පොත්වල සටහන් කළ නොහැකි ගනුදෙනු සටහන් කිරීමට භාවිතා කරන උපයෝගී පොත පොදු ජ'නලය හෙවත් ප්‍රධාන ජ'නලය නම් වේ. පොදු ජ'නලයක ගනුදෙනු, සටහන් කිරීමට යොදා ගැනෙන මූලාශ්‍ර ලේඛණය ජ'නල් වවුචරය නම් වේ.

පොදු ජ'නලයක පහත සඳහන් දෑ සටහන් කළ හැකිය.

1. ..................................................................................................................................
2. ..............................................................................................................................................
3. ..............................................................................................................................
4. ..................................................................................................................................
5. ....................................................................................................................................
6. ....................................................................................................................................

**පොදු ජ'නලයක ආකෘතිය**

**පොදු ජ'නලය**

| දිනය | වවුචර අංකය | විස්තරය | ලෙජර් පිටු අංකය | හර | බැර |
|---|---|---|---|---|---|
| | | හර කළ යුතු ගිණුමේ නම<br>බැර කළයුතු ගිණුමේ නම<br>සංලක්ෂ්‍යය | | | |

**1. ආරම්භක සටහන්**

ව්‍යාපාරයේ ආරම්භ කරන අවස්ථාවේ දී හෝ අලුත් ගිණුම් කාලපරිච්ඡේදයක් ආරම්භ වන අවෙස්ථාවේදී හෝ එදින පැවති වත්කම්, වගකීම් හා ප්‍රාග්ධනය ජ'නල ගත කිරීම ආරම්භක සටහන් ජ'නල් ගත කිරීම ලෙස හැඳින්වේ.

**2. දේපළ, පිරියත හා උපකරණ ණයට ගැනීම සහ ණයට විකිණීම**

ව්‍යාපාරයකට එහි ප්‍රයෝජනය සඳහා ඉඩම්, ගොඩනැගිලි මෝටර් රථ, ලී බඩු යන දේපළ, පිරියත හා උපකරණ මුදලට මෙන්ම ණයට ද ලබාගත හැකිය. එලෙසම ව්‍යාපාරය සතු දේපළ, පිරියත හා උපකරණ ණයට විකුණන අවස්ථාද ඇත. එම ණයට ගැනුම් හා විකුණුම් පිළිබඳ සටහන් ප්‍රථමයෙන් ම ඇතුළත් කෙරෙන්නේ පොදු ජ'නලයේ ය.

**3. වැරදි නිවැරදි කිරීම පිළිබඳ සටහන්**

මූලික සටහන් පොත් වලත්, ලෙජර් ගිණුම් වලත් ගනුදෙනු සටහන් කිරීමේදී ඇතැම් විට වැරදි සිදුවිය හැකි ය. ඒ වැරදි සොයා ගැනීමෙන් පසු ඒවා ලෙජර් ගිණුම්වල නිවැරදි කළ යුත්තේ පොදු ජ'නලයේ සටහන් තැබීමෙනි.

**4. ගැලපුම් සටහන්**

යම්කිසි ගිණුම් කාලපරිච්ඡේදයක් අවසන් වන විට සමහර ගනුදෙනු ලෙජර් ගිණුම්වල සටහන් වී නොතිබීම ද, ගිණුම් පොත්වල ඇතුළත් වූ සමහර ගනුදෙනු අදාළ ගිණුම් කාල පරිච්ඡේදයට අනුරූප වන අයුරු සකස් වී නොතිබීමද සාමාන්‍යයෙන් දැකිය හැකි ය.

**5. මාරු කිරීම් පිළිබඳ සටහන්**

එක් ගිණුමක ඇති වටිනාකමක් තවත් ගිණුමකට මාරු කිරීම සඳහා පොදු ජ'නලයේ ඇතුළත් කරන සටහන් මාරු කිරීම් සටහන් නමින් හැඳින්වේ.

**6. පියවීම් සටහන්**

කාලපරිච්ඡේදයක් තුළ දී ව්‍යාපාර කටයුතු වලින් ලැබූ ලාභ හෝ අලාභ හෝ සෙවීම සඳහා ඒ කාලපරිච්ඡේදය අවසානයේ දී වෙළඳ හා ලාභ අලාභ ගිණුම සකස් කරනු ලැබේ. මේ සඳහා ගිණුම් කාලපරිච්ඡේදයට අදාල ආදායම් ගිණුම් වලත් වියදම් ගිණුම්වලත් ශේෂ වෙළඳ හා ලාභ අලාභ ගිණුමට ගෙන යා යුතු ය. එසේ ගෙන යනු ලබන්නේ පොදු ජ'නලය මගිනි. පොදු ජ'නලය ඇතුළත් කරන මේ සටහන් පියවීම් සටහන් ලෙස හැඳින්වේ.

## අභ්‍යාසය 52

01. පහත සඳහන් ඒවා අතුරෙන්, පොදු ජර්නලයේ සටහන් කරනු නොලබන්නේ කුමක්ද?
    (1) වැරදි නිවැරදි කිරීම (2) වර්ෂ අවසාන ගැලපුම්
    (3) ආරම්භක ශේෂ සටහන් කිරීම (4) භාණ්ඩ ණයට විකිණීම
    **(AAT - January 2017)**

02. පහත සඳහන් ඒවා අතුරෙන් පොදු ලෙජරයේ සටහන් කරනු නොලබන්නේ කුමක් ද?
    (1) වැරදි නිවැරදි කිරීම
    (2) ආරම්භක ශේෂ සටහන් කිරීම
    (3) කාර්යාල ප්‍රයෝජන සඳහා ණය පදනම මත යන්ත්‍රයක් මිල දී ගැනීම
    (4) නැවත විකිණීම සඳහා ණය පදනම මත භාණ්ඩ මිල දී ගැනීම **(AAT - July 2014)**

03. පහත සඳහන් ඒවා අතුරෙන් ප්‍රාථමික සටහන් පොතක් නොවන්නේ කුමක් ද?
    (1) පොදු ජර්නලය (2) මුදල් පොත
    (3) විකුණුම් ජර්නලය (4) පොදු ලෙජරය **(AAT - July 2013)**

04. කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා කිට් හෝටලය රු. 800,000/- ක කාර්යාලීය උපකරණ ණය පදනම මත මිලදී ගත්තේය. එම ගනුදෙනුව සටහන් කිරීම සඳහා පහත සඳහන් ඒවා අතුරෙන් කුමන මූලික සටහන් පොත භාවිත කරනු ලැබේද?
    (1) දෛනික ගැනුම් පොත (2) පොදු ජ'නලය
    (3) පොදු ලෙජරය (4) මුදල් පොත **(AAT - January 2013)**

05. පහත ඒවා අතුරෙන් පොදු ජ'නලයේ (General Journal) සටහන් නොකරනු ලබන්නේ කවරක්ද?
    (1) ස්ථාවර වත්කම් ණයට මිල දී ගැනීම
    (2) වැරදි නිවැරදි කිරීම
    (3) ගැලපුම් සඳහා සටහන්
    (4) නැවත විකිණීම සඳහා භාණ්ඩ ණයට මිලදී ගැනීම **(AAT - July 2012)**

## අභ්‍යාසය 53

සාරංගගේ ව්‍යාපාරයේ 2020/09/01 දිනට පහත සඳහන් වත්කම්, වගකීම් හා ප්‍රාග්ධන ගිණුම්වල ශේෂ දක්නට ලැබිණි.

| | (රු.000) |
|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 200 |
| මෝටර් රථ | 100 |
| තොගය | 50 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 60 |
| මුදල් | 90 |
| බැංකු ණය | 110 |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | 90 |
| ප්‍රාග්ධනය | 300 |

අවශ්‍ය වන්නේ,

i. 2020.09.01 දිනට ආරම්භක ජ'නල් සටහන් ජ'නල් ගත කිරීම

ii. අදාළ ලෙජර් ගිණුම

## අභ්‍යාසය 54

**පීටර් කොස්තා** 2020 ඔක්තෝම්බර් 01 දින පහත දැක්වෙන වත්කම් හා වගකීම් ඇතිව ව්‍යාපාරයක් පටන් ගැනීමට තීණය කළේය.

| | රු. |
|---|---|
| බැංකුවේ මුදල් | 14 770 |
| වෙළෙඳ ණයහිමියෝ | 3 060 |
| වෙළෙඳ ණයගැතියෝ | 9 176 |
| ඉඩම් හා ගොඩනැගිලි | 59 000 |
| අතැති මුදල් | 399 |
| බඩු තොගය | 8 715 |
| භාර්යාව වූ ඇනා කොස්තා මිය ගෙන් ගත් ණය මුදල | 5 000 |

2020 ඔක්තෝම්බර් 01 දිනට වත්කම්, වගකීම් හා ප්‍රාග්ධනය කොස්තාගේ පොත්වලට ගෙන ඒමට ආරම්භක ජ'නල් සටහන් කෙටුම්පත් කරන්න.

# ශේෂ පිරික්සුම

## Trial Balance

සෑම ගනුදෙනුවක් ම එක හා සමාන හර සහ බැර වටිනාකමකින් ලෙජර් ගිණුම්වල ඇතුළත් කෙරෙන නිසා ලෙජරයේ සියලුම හර සටහන්වල එකතුව සියලුම බැර සටහන්වල එකතුවට අනිවාර්යයෙන් ම සමාන විය යුතු ය. ව්‍යාපාරයක් යම් නිශ්චිත කාලපරිච්ඡේදයක් අවසානයේ දී මේ එකතුවල සමානවීම් පරීක්ෂා කරන්නේ සියළුම ලෙජර ගිණුම් තුලනය කර, ඒවායේ හර ශේෂවල එකතුව හා බැර ශේෂවල එකතුව එකිනෙක සැසඳීමෙනි. ඒ සඳහා පිළියෙල කෙරෙන තීරු දෙකක් සහිත ලේඛනය, ශේෂ පිරික්සුම නමින් හැඳින්වේ. ශේෂ පිරික්සුම ද්විත්ව සටහන් ක්‍රමයේ කොටසක් ලෙස නොසැළකේ. ශේෂ පිරික්සුමක ආකෘතිය පහත දැක්වේ.

**ශේෂ පිරික්සුමක ආකෘතිය**

**X ගේ ව්‍යාපාරයේ**
××/×××/×× **දිනට ශේෂ පිරික්සුම**

| ගිණුමේ නම | ස.පි. | හර | බැර |
|---|---|---|---|
| | | | |
| | | ××× | ××× |

## අභ්‍යාසය 55

ප්‍රවීන් රු. 2,500,000 ක මුදලක් ආයෝජනය කර, බැංකු ගිණුමක් විවෘත කොට 2018 අප්‍රේල් 01 දින ප්‍රවීන් ට්‍රේඩර්ස් නම් වූ කේවල ස්වාමි ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී.

(1) 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සිදු කළ මුදල් ගනුදෙනු පහත පරිදි වේ.

| මුදල් ලැබීම | රු. |
|---|---|
| ගෙවූ මුදල් | 2,500,000 |
| මුදලට විකුණුම් | 1,300,000 |
| වෙළෙඳ ණයගැතියන්ගෙන් ලැබීම් | 831,000 |
| | 4,631,000 |

| මුදල් ලැබීම | රු. |
|---|---|
| මෝටර් ලොරි රථය (2018 ඔක්තෝම්බර් 01 දින අත්පත් කරගත්) | 1,500,000 |
| වෙළෙඳ ණයහිමියන්ට ගෙවීම් | 1,150,000 |
| විදුලිය | 72,000 |
| වැටුප් හා වේතන | 290,000 |
| ගැනිලි | 175,000 |
| මුදලට ගැනුම් | 788,000 |
| | 4,631,000 |

(2) ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වන්නේ මෝටර් ලෝරි රථය මත ක්ෂය, පිරිවැය මත සරල මාර්ග ක්‍රමට වර්ෂයකට 25% ක් ප්‍රතිපාදනය කිරීමයි.

(3) 2019 මාර්තු 31 දිනට ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ පහත පරිදි වේ.

| | රු. |
|---|---|
| වෙළෙඳ ණයගැතියෝ | 145,000 |
| වෙළෙඳ ණයහිමියෝ | 110,000 |
| ගෙවිය යුතු වැටුප් | 38,000 |

(4) 2019 මාර්තු 31 දිනට කිසිදු තොගයක් නොමැත.

ඔබ විසින් කළ යුතු දෑ,

2019 මාර්තු 31 දිනට ප්‍රවීන් හාඩ්වෙයාර්හි ශේෂ පිරික්සුම පිළියෙල කරන්න.

**(AAT - January 2020)**

## අභ්‍යාසය 56

විජය රු. 1,400,000/- ක් ආයෝජනය කරමින් හාඩ්වෙයාර් අයිතම විකිණීම සඳහා විජය හාඩ්වෙයාර් නමින් කේවලස්වාමි ව්‍යාපාරයක් 2018 අප්‍රේල් 01 දින ආරම්භ කළේ ය.

(1) 2018 අප්‍රේල් 01 දින සිදුකරන ලද ඔහුගේ ආරම්භක ආයෝජනය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | රු. |
|---|---:|
| මෝටර් ලොරිය | 750,000 |
| මුදල් | 650,000 |
| එකතුව | 1,400,000 |

(2) 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුළ දී සිදු කළ මුදල් ගනුදෙනු පහත පරිදි විය.

| මුදල් ලැබීම | රු. | මුදල් ලැබීම | රු. |
|---|---:|---|---:|
| යෙදවූ මුදල | 650,000 | වැටුප් හා වේතන | 600,000 |
| අත්පිට (මුදලට) විකුණුම් | 2,500,000 | විදුලිය | 68,000 |
| වෙළෙඳ ණයගැතියන්ගෙන් ලැබීම් | 1,300,000 | වෙළෙඳ ණයහිමියන්ට ගෙවීම් | 3,280,000 |
| බැංකු ණය | 500,000 | ගැනිලි | 210,000 |
| | 4,631,000 | | 4,631,000 |

(3) 2019 මාර්තු 31 දිනට තොග කිසිවක් නොතිබුණි.

(4) 2019 මාර්තු 01 දින වාර්ෂිකව 18% බැගින් වූ පොලී අනුපාතිකයක් යටතේ රු. 500,000/- ක බැංකු ණයක් ලබාගත් අතර, එම ප්‍රාග්ධන ආපසු ගෙවීම 2019 අප්‍රේල් 01 දින සිට කළ යුතු වේ.

(5) 2019 මාර්තු 31 දිනට පහත දැක්වෙන ලැබිය යුතු සහ ගෙවිය යුතු ශේෂ ව්‍යාපාරයේ ගිණුම් පොත්වල තිබුණි.

| | රු. |
|---|---:|
| උපචිත විදුලිය | 18,000 |
| වෙළෙඳ ණයගැතියෝ | 275,000 |
| වෙළෙඳ ණයහිමියෝ | 275,000 |

(6) මෝටර් ලොරිය සරල මාර්ග ක්‍රමය යටතේ පිරිවැය මත වාර්ෂිකව 25% ක අනුපාතයට ක්ෂය කරනු ලබයි.

2019 මාර්තු 31 දිනට විජය හාඩ්වෙයාර්හි ශේෂ පිරික්සුම පිළියෙල කරන්න.

**(AAT - July 2019)**

## අභ්‍යාසය 57

රණසිංහ 2017 අප්‍රේල් 01 දින මුදලින් රු. 750,000 ක් ආයෝජනය කරමින් රණසිංහ ට්‍රේඩර්ස් නම් කේවලස්වාමි ව්‍යාපාරයක් ආරම්භ කළේ ය. 2018 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ලැබීම් ජර්නලයේ සහ මුදල් ගෙවීම් ජර්නලයේ සාරාංශය පනහත පරිදි වේ.

| මුදල් ලැබීම් ජර්නලය (ලැබීම්) | රු. |
|---|---|
| රණසිංහ යෙදවූ ප්‍රාග්ධනය | 750,000 |
| අත්පිට (මුදලට) විකුණුම් | 625,000 |
| | 4,631,000 |

| මුදල් ගෙවීම් ජර්නලය (ගෙවීම්) | රු. |
|---|---|
| වැටුප් හා වේතන | 225,000 |
| විදුලි බිල්පත් | 89,000 |
| ගෘහ භාණ්ඩ මිලට ගැනීම | 75,000 |
| ජල බිල්පත් | 23,000 |
| සුළු මුදල් අග්‍රිමය | 25,000 |
| ගැනිලි | 100,000 |
| | 2,112,000 |

පහත දැක්වෙන අතිරේක තොරතුරු ද සපයා ඇත.

(1) 2018 මාර්තු 31 දිනට ලැබිය යුතු සහ ගෙවිය යුතු ශේෂයන් පහත පරිදි වේ.

| | රු. |
|---|---|
| වෙළෙඳ ණයගැතියෝ | 78,000 |
| වෙළෙඳ ණයහිමියෝ | 125,000 |
| උපචිත විදුලිය | 12,500 |

(2) සුළු මුදල් ගනුදෙනු පහත පරිදි විය.

සුළු මුදල් පාලන ගිණුම්

| | රු. | | රු. |
|---|---|---|---|
| මුදල් පාලන ගිණුම | 25,000 | අනියම් වේතන | 5,800 |
| | | ගමන් වියදම් | 3,500 |
| | | ප/ගෙ ශේෂය | 15,700 |
| | 25,000 | | 25,000 |

(3) සියලුම ගැනුම් ණය පදනම මත සිදු කරනු ලබන අතර, 2018 මාර්තු 31 දිනට තොග කිසිවක් නොතිබුණි.

(4) 2017 ඔක්තෝම්බර් 01 දින රු. 75,000/- කට ගෘහ භාණ්ඩ අත්පත් කර ගන්නා ලද අතර, ඒවා පිරිවැය මත වාර්ෂිකව 20% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි.

ඔබ විසින් කළ යුතු දෑ,

2018 මාර්තු 31 දිනට රණසිංහ ට්‍රේඩර්ස් හි ශේෂ පිරික්සුම පිළියෙල කරන්න.

**(AAT - January 2019)**

## අභ්‍යාසය 58

**සැම්,** මූලික ප්‍රාග්ධනය වශයෙන් රු.580,000/- ක් මුදලින් ආයෝජනය කරමින් 2020 අප්‍රේල් 01 දින **සැම් ට්‍රේඩර්ස්** නමින් කේවලස්වාමි ව්‍යාපාරයක් ආරම්භ කළේය.

පහත දැක්වෙන අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2020 අප්‍රේල් 30 දිනෙන් අවසන් වූ මාසය සඳහා මුදල් පාලන ගිණුම (මුදල් පොත) පහත පරිදි විය:

| | රු. | | රු. |
|---|---|---|---|
| මූලික ප්‍රාග්ධන ආයෝජනය | 580,000 | වැටුප් සහ වේතන | 1,375,000 |
| අමතර ප්‍රාග්ධන ආයෝජනය | 1,200,000 | කුලිය | 125,000 |
| මුදලට විකුණුම් | 5,500,000 | වෙළෙඳ ණයහිමියන්ට ගෙවීම් | 2,250,000 |
| වෙළෙඳ ණයගැතියන්ගෙන් ලැබීම් | 1,900,000 | ලොරි රථයක් මිලදී ගැනීම (2020 අප්‍රේල් 01 දින අත්පත් කරගන්නා ලදී) | 2,400,000 |
| | | මුදලට ගැනුම් | 2,000,000 |
| | | විදුලිය | 45,000 |
| | | ශේෂය ප/ගෙ | 985,000 |
| | **9,180,000** | | **9,180,000** |

(2) 2020 අප්‍රේල් 30 දිනට පහත ශේෂයන් ගිණුම් පොත්වල දක්නට ලැබුණි:

| | රු. |
|---|---|
| වෙළෙඳ ණයගැතියෝ | 1,400,000 |
| වෙළෙඳ ණයහිමියෝ | 2,100,000 |
| උපචිත වැටුප් | 25,000 |

(3) ලොරි රථය වාර්ෂිකව පිරිවැය මත 20% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි.

(4) 2020 අප්‍රේල් 30 දිනට තොග කිසිවක් නොතිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2020 අප්‍රේල් 30 දිනට **සැම් ට්‍රේඩර්ස්හි** ශේෂ පිරික්සුම **පිළියෙල කරන්න.** (ලකුණු 10)

# බැංකු සැසඳුම් ප්‍රකාශන

## Bank Reconciliation Statements

බැංකුවක ජංගම ගිණුමක් පවත්වාගෙන යන ව්‍යාපාරයක් විසින් එම ජංගම ගිණුම මගින් සිදු කරන ගනුදෙනු ව්‍යාපාරයේ පොත්වල බැංකු ගිණුමේ සටහන් කරයි. ව්‍යාපාරයක් නමින් බැංකුවේ පවතින මුදල් ප්‍රමාණය ව්‍යාපාරයේ වත්කමකි. එම නිසා ව්‍යාපාරයේ පොත්වල පවත්වාගෙන යන බැංකු ගිණුම වත්කම් ගිණුමකි. වත්කම් ගිණුමට අදාළ ද්විත්ව සටහන් රීතීන්ට අනුකූලව බැංකු ගිණුමේ ගනුදෙනු සටහන් කරනු ලැබේ. එහිදී බැංකු ශේෂය වැඩි වීමට බලපාන ගනුදෙනු බැංකු ගිණුමට හර කෙරෙන අතර බැංකු ශේෂය අඩු වීමට බලපාන ගනුදෙනු බැංකු ගිණුමට බැර කරනු ලැබේ.

වාණිජ බැංකු විසින් ව්‍යාපාරය නමින් පවතින බැංකු ජංගම ගිණුමෙහි ගනුදෙනු සටහන් කරන ආකාරය විමසා බලමු.

ව්‍යාපාරයක් විසින් බැංකු ජංගම ගිණුම මගින් සිදු කරන ගනුදෙනු බැංකුව ද බැංකුවේ පොත්වල ව්‍යාපාරය නමින් වූ ගිණුමක සටහන් කරයි. ව්‍යාපාරයක් වෙනුවෙන් බැංකුවේ පවතින ගිණුම එහි වගකීම් ගිණුමකි. එම නිසා බැංකුව ව්‍යාපාරයට අදාළ බැංකු ගිණුමේ ගනුදෙනු සටහන් කරන්නේ වගකීම් ගිණුමක ගනුදෙනු සටහන් කිරීමට අදාළ රීතිවලට අනුව ය. ඒ අනුව බැංකු ශේෂය වැඩි වීමට බලපාන ගනුදෙනු බැංකුව ව්‍යාපාරය නමින් පවත්වා ගන්නා ගිණුමට බැර කරන අතර ශේෂය අඩු වීමට බලපාන ගනුදෙනු ඊට හර කරයි.

ව්‍යාපාරය විසින් බැංකු ගිණුමට හර කරන අගයන් බැංකුව විසින් ව්‍යාපාරයේ ගිණුමට බැර කෙරෙන අතර ව්‍යාපාරය විසින් බැංකු ගිණුමට බැර කෙරෙන අගයන් බැංකුව විසින් ව්‍යාපාරයේ ගිණුමට හර කරනු ලබයි. අවසානයේ දී ව්‍යාපාරයේ පොත්වල බැංකු ගිණුමේ හර ශේෂයක් පවතිනවිට බැංකුවේ පොත්වල ව්‍යාපාරයෙ නමින් වූ ගිණුමේ බැර ශේෂයක් පෙන්නුම් කරයි.

## බැංකු ප්‍රකාශය (Bank Statement)

බැංකු ජංගම ගිණුමක් හිමි අයෙකුට බැංකුව විසින් සාමාන්‍යයෙන් මසකට වරක් වාර්තාවක් එවනු ලැබේ. අදාළ මාසය තුළ බැංකුව විසින් ගිණුමට කළ හර කිරීම්, බැර කිරීම් සහ ශේෂය මෙහි දක්වේ. වර්තමානයේ දී නම් සාමාන්‍යයෙන් සිදු කෙරෙන්නේ සලකා බලන මාසයට අදාළව බැංකුවේ පවතින ගිණුමේ පරිගණක මුද්‍රිත පිටපතක් ව්‍යාපාරයට එවීමයි. මෙසේ බැංකුව එවනු ලබන වාර්තාව හෙවත් ගිණුමේ මුද්‍රිත පිටපත, බැංකු ප්‍රකාශය හෙවත් බැංකු ගිණුම් විස්තරය ලෙස හැඳින්වේ.

ව්‍යාපාරය විසින් පිළියෙල කරන බැංකු ගිණුම තුලනය කළවිට ව්‍යාපාරයේ පොත්වලට අනුව බැංකුවේ පවතින මුදල් ප්‍රමාණය ලැබේ. බැංකුව විසින් එවනු ලබන බැංකු ප්‍රකාශයෙහි බැංකුවේ පොත්වලට අනුව ව්‍යාපාරයට අයත් ගිණුමේ පවතින ශේෂය දක්වේ. ජංගම ගිණුමට අදාළ සියලු ම ගනුදෙනු දෙපාර්ශ්වය ම සටහන් කළේ නම් මෙම අගයන් දෙක එකිනෙකට සමාන විය යුතු ය. එහෙත් ප්‍රායෝගිකව ව්‍යාපාරයේ පොත්වල බැංකු ගිණුමේ දක්වෙන ශේෂය සහ බැංකු ප්‍රකාශයේ දක්වෙන ශේෂය එකිනෙකට වෙනස් වේ. එසේ වෙනස් වන්නේ සලකා බැලෙන කාලච්ඡේදය තුළ ව්‍යාපාරයේ පොත්වල බැංකු ගිණුමේ සටහන් කර ඇති සමහර අගයන් බැංකු ප්‍රකාශයේ සටහන් වී නොතිබීමත් බැංකු ප්‍රකාශයේ සටහන්ව ඇති සමහර අගයන් ව්‍යාපාරයේ පොත්වල බැංකු ගිණුමේ සටහන් වී නොතිබීමත් නිසා ය.

ව්‍යාපාරයේ පොත්වල බැංකු ගිණුමේ අවසාන ශේෂයත් බැංකු ප්‍රකාශනයට අනුව ශේෂයත් එකිනෙකට අසමාන වීමට හේතු පහත පරිදි වර්ග කළ හැක.

## කාල වෙනස් වීම

ව්‍යාපාරය බැංකු ගිණුමේ සටහන් කළත්, කිසියම් කාල පමාවක් ගත වීම නිසා බැංකුවේ ජංගම ගිණුමේ සටහන් කිරීම ප්‍රමාද වී ඇති ගනුදෙනු කාල වෙනස්වීම් ය. එවැනි කාල වෙනස්වීම් වර්ග දෙකක් ය.

1. ..................................................................................................................................

ව්‍යාපාරයට ලැබී ඇති චෙක්පත් බැංකුවේ තැන්පත් කළ විට ව්‍යාපාරය එය බැංකු ගිණුමට හර කරයි. එවිට ව්‍යාපාරයේ පොත්වල ඇති බැංකු ගිණුමේ ශේෂය වැඩි වේ. මෙසේ තැන්පත් කළ චෙක්පත්වලින් සමහර චෙක්පත් එම කාලච්ඡේදය තුළ නිෂ්කාශනය නොවීම හෙවත් උපලබ්ධි නොවීම සිදුවිය හැකි ය. චෙක්පත් නිෂ්කාශනය වීම යනු චෙක්පතේ සඳහන් වටිනාකම බැංකුවේ පවතින ජංගම ගිණුමේ වටිනාකමට එකතු වීම වේ. චෙක්පතක් බැංකුවේ තැන්පත් කළ විට එහි වටිනාකම ගිණුමට එකතු වීම සඳහා දින කිහිපයක් ගත විය හැකි ය. එබැවින් නියමිත කාලච්ඡේදය අවසාන වනවිට ව්‍යාපාරයක් විසින් තැන්පත් කළ සමහර චෙක්පත්වල වටිනාකම බැංකුව ව්‍යාපාරයට අයත් ගිණුමේ සටහන් කර නොතිබීමට ඉඩ ඇත. තැන්පත් කළ නමුත් නිෂ්කාශනය නොවූ චෙක්පත් ලෙස හඳුන්වන්නේ මේවා ය. මේ නිසා තැන්පත් කරනු ලැබුව ද නිෂ්කාශනය නොවූ චෙක්පත් බැංකු ප්‍රකාශයේ තැන්පත් ලෙස වාර්තා වී නැත.

- **එබැවින් ව්‍යාපාරයක බැංකු ගිණුමේ දක්වෙන ශේෂය, බැංකු ප්‍රකාශයේ දක්වෙන ශේෂයට වඩා වැඩි වේ.**

2. ....................................................................................................................................................

ව්‍යාපාරය නිකුත් කරන චෙක්පත් ව්‍යාපාරයේ පොත්වල බැංකු ගිණුමට බැර කෙරෙයි. එවිට ව්‍යාපාරයේ පොත්වල ඇති බැංකු ගිණුමේ ශේෂය අඩු වේ. මෙසේ නිකුත් කරන චෙක්පත්වලින් සමහර චෙක්පත් කාලච්ඡේදය අවසානය වනවිටත් ඒවායෙහි හිමිකරුවන් බැංකුව වෙත ඉදිරිපත් කර මුදල් ලබාගෙන නොතිබීමට ඉඩ ඇත. නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්පත් ලෙස හඳුන්වන්නේ මේවා ය. එම චෙක්පත්වලට බැංකුව මුදල් ගෙවා නැති නිසා බැංකු ප්‍රකාශයේ ගෙවීම් ලෙස වාර්තා වී නැත.

- **එබැවින් ව්‍යාපාරයේ බැංකු ගිණුමේ දැක්වෙන ශේෂය, බැංකු ප්‍රකාශයේ දැක්වෙන ශේෂයට වඩා අඩු වේ.**

# අත් හැරීම්

බැංකුව ජංගම ගිණුමේ සටහන් කළත්, ව්‍යාපාරය බැංකු ගිණුමේ සටහන් කිරීමට අතපසු වී ඇති ගනුදෙනු අත් හැරීම (මග හැරීම) ලෙස සැලකේ. එවැනි අත් හැරීම් පහත පරිදි දැක්විය හැකි ය.

1. ....................................................................................................................................................

ගනුදෙනුකරුවෙකුගෙන් ලැබී බැංකුවේ චෙක්පතක් තැන්පත් කළවිට ව්‍යාපාරය බැංකු ගිණුමට හර කරයි. එම චෙක්පත අගරු වූ විට බැංකුව ජංගම ගිණුම බැර කර, අගරුවීම පෙන්වීමට නැවත හර කරයි. එලෙස බැංකුවේ අගරු වූ චෙක්පත ව්‍යාපාරයේ බැංකු ගිණුමට බැර කරන තෙක් බැංකු ප්‍රකාශනයේ ශේෂයත්, බැංකු ගිණුමේ ශේෂයත් එකිනෙකට අසමාන වේ.

2. ....................................................................................................................................................

ණය හිමියන්ට / වියදම් සඳහා චෙක්පතක් නිකුත් කළවිට ව්‍යාපාරය බැංකු ගිණුමට බැර කරයි. එම චෙක්පත අගරු වූ විට බැංකුව විසින් ජංගම ගිණුම හර කර නැවත බැර කරයි.

(බැංකුව සටහනක් නොකරයි.)

එම අගරු වීම ව්‍යාපාරයේ බැංකු ගිණුමේ සටහන් කරන තෙක් (හර කිරීම) ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂයත් බැංකු ප්‍රකාශනයේ ශේෂයත් එකිනෙකට අසමාන වේ.

3. ..................................................................................................................................................

..................................................................................................................................................

ව්‍යාපාරය විසින් ගෙවිය යුතු බැංකු ණය වාරික, කල් බදු ණය වාරික, රක්ෂණ ගාස්තු වැනි සමහර ගෙවීම් බැංකුවේ පවතින මුදල්වලින් ගෙවන ලෙසට ගිණුම් හිමියන් විසින් ලිඛිතව බැංකුවට දැනුම් දීම ස්ථාවර නියෝග ලෙස හැඳින්වෙයි. එවැනි දැනුම් දීම් මත බැංකුව විසින් කරන ගෙවීම් සිදුකර ඇති බව ව්‍යාපාරයට දැනගත හැකිවන්නේ ද බැංකු ප්‍රකාශය ලැබුණු පසුව ය. බැංකුව විසින් ස්ථාවර නියෝග මත ගෙවීම සිදු කර එම වටිනාකම බැංකු ජංගම ගිණුමෙන් අඩු (හර) කරයි. එවිට බැංකු ප්‍රකාශයේ දී ස්ථාවර නියෝග මත ගෙවීම් අඩු වී ඇතත් ව්‍යාපාරයේ බැංකු ගිණුමේ එම වටිනාකම බැර පැත්තේ සටහන් වී නැත.

- **එබැවින් ව්‍යාපාරයේ බැංකු ගිණුමේ දැක්වෙන ශේෂය බැංකු ප්‍රකාශයේ දැක්වෙන ශේෂයට වඩා වැඩි අගයක් ගනී.**

4. ..................................................................................................................................................

සමහර ගනුදෙනුකරුවන් ව්‍යාපාරයට ලබා දිය යුතු වටිනාකම් ඍජුව ම ව්‍යාපාරයේ ජංගම ගිණුමේ තැන්පත් කරන අවස්ථා ඇත. එසේ ම ව්‍යාපාරයට ලැබිය යුතු කුලී, පොලී සහ ගිණුමේ තැන්පතු යනාදිය යද ඍජුව බැංකු ජංගම ගිණුමට එවන අවස්ථා ඇත. ඒවා ඍජු ප්‍රේෂණ ලෙස හැඳින්වේ. ඍජු ප්‍රේෂණ ලැබීම් පිළිබඳව ව්‍යාපාරයට දැනගත හැකිවන්නේ බැංකු ප්‍රකාශය ලැබීමෙන් පසුව ය. එලෙස ලැබී ඇති ඍජු ප්‍රේෂණ බැංකු ප්‍රකාශයේ ලැබීම් (බැර) ලෙසට වාර්තා වුව ද ව්‍යාපාරයේ බැංකු ගිණුමේ වාර්තා වී නැත.

- **එබැවින් ව්‍යාපාරයේ බැංකු ගිණුමේ දැක්වෙන ශේෂය, බැංකු ප්‍රකාශයේ දැක්වෙන ශේෂයට වඩා අඩු වේ.**

5. ..................................................................................................................................................

ජංගම ගිණුම් හිමියෙකුට බැංකුව මගින් සපයන සේවා වෙනුවෙන් බැංකුව ජංගම ගිණුමෙන් අයකරන ගාස්තු බැංකු ගාස්තු වේ. බැංකුව ලබා දෙන චෙක් පොත් වෙනුවෙන් අය කරන ගාස්තු චෙක්පොත් ගාස්තු වේ. මෙවැනි ගාස්තු ව්‍යාපාරයට දැනගත හැකි වන්නේ බැංකු ප්‍රකාශය ලැබීමෙන් පසුව ය. එසේ අයකළ ගාස්තු බැංකු ප්‍රකාශයේ ගෙවීම් ලෙසට (හර තීරුවේ) සටහන් වී ඇත. එහෙත් ව්‍යාපාරයේ බැංකු ගිණුමේ අදාළ කාලච්ඡේදය අවසාන වනවිටත් ඒවා වාර්තා වී නැත.

- **එබැවින් ව්‍යාපාරයේ බැංකු ගිණුමේ දැක්වෙන ශේෂය බැංකු ප්‍රකාශයේ දැක්වෙන ශේෂයට වඩා වැඩි ය.**

# වැරදි

ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂයත්, බැංකුව සකස් කරන බැංකු ජංගම ගිණුමේ ශේෂයත් අසමාන වීමට බලපාන වැරදි වේ. එනම්, ව්‍යාපාරය බැංකු ගිණුමේ සිදු කළ වැරදි හෝ බැංකුව ජංගම ගිණුමේ සිදු කළ වැරදි මෙයින් අදහස් වේ.

ඒ අනුව මෙවැනි වැරදි වර්ග දෙකක් ය.

1. ........................................................................................................................................................

   ව්‍යාපාරයේ බැංකු ගිණුමේ හර හෝ බැර ලෙස සිදු කර ඇති වැරදි නිසා බැංකු ගිණුමේ ශේෂයත්, බැංකු ප්‍රකාශනයේ ශේෂය හා අසමාන වේ.

2. ........................................................................................................................................................

   බැංකුව විසින් ජංගම ගිණුම සකස් කිරීමේ දී කළාතුරකින් සිදුවන වැරදි නිසා ද බැංකු ප්‍රකාශනයට අනුව ශේෂයත් ව්‍යාපාරයේ ශේෂයත් අසමාන වේ.

ඉහත සඳහන් කළ ආකාරයට ව්‍යාපාරයේ පොත්වල බැංකු ගිණුමේ අවසාන ශේෂය සහ බැංකු ප්‍රකාශයේ දැක්වෙන ශේෂය අතර වෙනසක් පැවතිය හැකි ය.

ඉහත දැක්වූ වෙනස්කම් හඳුනාගත හැක්කේ ව්‍යාපාරයේ බැංකු ගිණුම හා බැංකුවෙන් එවනු ලැබූ බැංකු ප්‍රකාශය සැසඳීමෙනි. ඒ අනුව පළමුවෙන් සිදු කළ යුත්තේ බැංකු ගිණුම සහ බැංකු ප්‍රකාශය සසඳා වෙනසට බලපාන හේතු හඳුනා ගැනීම ය.

ඒ සඳහා,

- බැංකු ගිණුමේ හර පැත්ත, බැංකු ප්‍රකාශයේ බැර තීරුව සමගත්
- බැංකු ගිණුමේ බැර පැත්ත, බැංකු ප්‍රකාශයේ හර තීරුව සමගත් සැසඳිය යුතු ය.

එහිදී බැංකු ගිණුමේ ඇති අගය එකින් එක ගෙන ඒවා බැංකු ප්‍රකාශයේ ඇතුළත්ව තිබේ ද යන්න පරීක්ෂා කළ යුතු ය. මේ සඳහා බැංකු ගිණුම හා බැංකු ප්‍රකාශය යන දෙකෙහි ම සටහන් වී ඇති අගය ලකුණු කරගත යුතු ය. එවිට ලකුණු නොවී ඉතිරි වන්නේ එක් ප්‍රකාශයක පමණක් ඇතුළත්ව ඇති අගය වේ. අවසාන ශේෂයන්ගේ වෙනසට බලපා ඇත්තේ එම අගය ය.

මෙම වෙනස්කම් ගැලපීම හා සැසඳීම සඳහා පියවර දෙකක් අනුගමනය කළ යුතු වේ.

1. ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කිරීම
2. සංශෝධිත බැංකු ශේෂය යොදා ගනිමින් බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීම

**ව්‍යාපාරයේ දක්වෙන බැංකු ගිණුවේ ශේෂය සංශෝධනය කිරීම**

ව්‍යාපාරයෙහි බැංකු ගිණුමේ ශේෂය සහ බැංකු සැසඳුම් ප්‍රකාශයේ ශේෂය අතර වෙනස සඳහා බලපාන හේතු අතරින් සමහර හේතු බැංකු ගිණුමෙහි දක්වෙන වැරදි හෝ අතහැරීම් වැනි අඩු පාඩු විය හැකි ය. මෙම අඩු පාඩු නිසා බැංකු ගිණුමෙහි දක්වෙන ශේෂය වැරදි සහගත වේ. එබැවින් එය නිවැරදි කළ යුතු ය. එසේ නිවැරදි කිරීම බැංකු ගිණුම සංශෝධනය කිරීම ලෙස හැඳින්වේ.

ඉහත දක්වූ නිදසුනට අනුව පහත සඳහන් හේතුවලට අදාළ අගය බැංකු ගිණුමෙහි ගැලපිය යුතු ය.

1. ............................................................................................................................
2. ............................................................................................................................
3. ............................................................................................................................
4. ............................................................................................................................

**ඍජු ප්‍රේෂණ ලැබීම් මගින් බැංකු ගිණුමේ ශේෂය වැඩි විය යුතු ය. මේ නිසා ඍජු ප්‍රේෂණ බැංකු ගිණුමට හර කළ යුතු ය.**

**ස්ථාවර නියෝග මත සිදු කළ ගෙවීම් සහ බැංකුව විසින් ගිණුමෙන් අය කළ ගාස්තු නිසා බැංකු ශේෂය අඩු විය යුතු ය. එම නිසා බැංකු ගිණුමට ස්ථාවර නියෝග මත සිදු කළ ගෙවීම්, බැංකුව අය කළ ගාස්තු යනාදිය බැර කළ යුතු ය.**

ඉහත ආකාරයට ගැලපීම් සිදු කළ පසු **බැංකු ගිණුමේ සංශෝධිත ශේෂය** ලැබේ.

**සංශෝධිත බැංකු ශේෂය යොදා ගනිමින් බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීම**

සංශෝධිත බැංකු ගිණුමේ ශේෂය පිළියෙල කිරීමෙන් පසු එම ශේෂය තව දුරටත් බැංකු ප්‍රකාශයේ ශේෂය සමග නොගැලපෙන්නේ නම් බැංකු ශේෂයන්ගේ වෙනසට පහත සඳහන් හේතු ප්‍රධාන වශයෙන් අදාළ වේ.

- තැන්පත් කළ නමුත් නිෂ්කාශනය නොවූ චෙක්පත්වල වටිනාකම
- නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්පත්වල වටිනාකම

එබැවින් මෙම හේතු දෙක බැංකු ගිණුමෙහි නොගලපන්නේ එය බැංකු ගිණුමේ ගනුදෙනු වාර්තා කිරීමට අදාළ වැරදි හෝ අත්හැරීම් නොවන බැවිනි.

මෙම ඉතිරිවන හේතු ඇතුළත් කර බැංකු ගිණුමේ සංශෝධිත ශේෂය බැංකු ප්‍රකාශයේ ශේෂය සමග සැසඳීමට ප්‍රකාශක් පිළියෙල කළ යුතු ය. **බැංකු සැසඳුම් ප්‍රකාශය** ලෙස හඳුන්වන්නේ එයයි. බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීම මගින් ශේෂවල නිවැරදිතාව තහවුරු කර ගත හැකි ය.

ඒ අනුව

**නිකුත් කළ නමුත් එම කාල සීමාව තුළ බැංකුවට ඉදිරිපත් නොකළ චෙක්පත් පැවතීම නිසා බැංකු ප්‍රකාශයේ සඳහන් ශේෂයට වඩා බැංකු ගිණුමේ ශේෂය අඩු ය. එබැවින් බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්පත් බැංකු සැසඳුම් ප්‍රකාශයේ බැංකු ගිණුමේ සංශෝධිත ශේෂයට එකතු කිරීමක් වශයෙන් දැක්විය යුතු ය.**

**තැන්පත් කළ නමුත් අදාළ කාල සීමාව තුළ නිෂ්කාශනය නොවූ චෙක්පත් පැවතීම නිසා බැංකු ගිණුමේ ශේෂය බැංකු ප්‍රකාශයේ ශේෂයට වඩා වැඩි ය. එබැවින් සංශෝධිත බැංකු ශේෂයෙන් නිෂ්කාශනය නොවූ චෙක්පත්වල වටිනාකම අඩු කිරීමක් වශයෙන් දැක්විය යුතු ය.**

ඉහත හේතු දෙක ඇතුළත් කර බැංකු සැසඳුම් විස්තරය පිළියෙල කළ විට ලැබෙන ශේෂය බැංකු ප්‍රකාශයේ සඳහන් ශේෂය වේ.

නදීකාගේ ව්‍යාපාරය
2021 ජූලි මාසය සඳහා බැංකු සැසඳුම් විස්තරය

| | |
|---|---|
| සංශෝධිත බැංකු ශේෂය | XX |
| එකතු කළා | |
| නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොකළ චෙක්පත් | XXX |
| | XXX |
| අඩු කළා | |
| තැන්පත් කළ නමුත් නිෂ්කාශනය නොවූ චෙක්පත් | XXX |
| 2021.07.31 දිනට බැංකු ප්‍රකාශයේ සඳහන් ශේෂය | XXX |

# බැංකු අයිරාව

බැංකු අයිරාව ගිණුමේ පවතින මුදල් ප්‍රමාණය ඉක්මවා චෙක්පත් නිකුත් කිරීමේ පහසුකම වාණිජ බැංකු විසින් ගිණුම් හිමියන්ට ලබා දෙන අවස්ථා ඇත. එවැනි පහසුකමක් බැංකු අයිරාව ලෙස හැඳින්වේ. ඒ අනුව ව්‍යාපාරය විසින් බැංකු ගිණුමේ පවතින මුදල් ප්‍රමාණය ඉක්මවා චෙක්පත් නිකුත් කළහොත් බැංකු ගිණුමේ හර පැත්තේ එකතුවට වඩා එහි බැර පැත්තේ එකතුව වැඩි වීමෙන් බැංකු ගිණුමේ බැර ශේෂයක් ලැබේ. එලෙස පවතින බැර ශේෂය බැංකු අයිරාව වන අතර එය ව්‍යාපාරයේ වගකීමක් වේ. ඒ අනුව ගිණුමේ පවතින ශේෂය ඉක්මවා චෙක්පත් නිකුත් කළ විට බැංකුව එම චෙක්පත්වලට ගෙවීම් කිරීම නිසා ගිණුම් හිමියා බැංකුවට ණයගැති වන අගය බැංකු අයිරාව ලෙස හැඳින්වේ.

## අභ්‍යාසය 59

**සීමාසහිත XYZ සමාගමෙහි** 2021 ජනවාරි 31 දිනට බැංකු ප්‍රකාශයේ රු.243,000/- ක වාසිදායක ශේෂයක් පෙන්නුම් කරන ලද අතර, **සීමාසහිත XYZ සමාගමේ** මුදල් පාලන ගිණුමේ රු.175,000/- ක හර (වාසිදායක) ශේෂයක් පෙන්නුම් කරන ලදි.

වෙනස සඳහා හේතු පහත සඳහන් පරිදි වේ:

(1) බැංකුව, රු.5,000/- ක් බැංකු ගාස්තු වශයෙන් අඩුකරගෙන තිබෙන අතර, එය මුදල් පාලන ගිණුමේ සටහන් කර නොතිබුණි.

(2) ස්ථාවර තැන්පතුවක් මත පොලී ආදායම වශයෙන් රු.98,000/- ක පොලියක් බැංකුවට සෘජුවම ලැබී තිබේ. කෙසේනමුත් මෙය මුදල් පොතේ සටහන් වී නොතිබුණි.

(3) **සීමාසහිත XYZ සමාගම** විසින් 2021 ජනවාරි 29 දින නිකුත් කරන ලද රු.125,000/- ක චෙක්පතක් 2021 ජනවාරි 31 දින වන විටත් ගෙවීම් සඳහා බැංකුවට ඉදිරිපත් කර නොතිබුණි.

(4) බැංකුවෙහි තැන්පත් කරන ලද රු.150,000/- ක චෙක්පතක් 2021 ජනවාරි 31 දින වන විටත් උපලබ්ධි වී නොතිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **පිළියෙල කරන්න:**

(a) ගලපන ලද මුදල් පාලන ගිණුම (මුදල් පොත). (ලකුණු 02)

(b) 2021 ජනවාරි 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය. (ලකුණු 02)

**(AAT January 2021)**

# අභ්‍යාසය 60

**රණසිංහ සහ සමාගමේ** 2020 මාර්තු 31 දිනට, බැංකු ප්‍රකාශනය අනුව බැංකු ශේෂය, එහි මුදල් පාලන ගිණුමේ (මුදල් පොතේ) වාසිදායක (හර) ශේෂය වන රු.155,000/- සමඟ එකඟ නොවීය.

පහත සඳහන් හේතු පසුව හඳුනාගන්නා ලදී:

(1) ස්ථාවර නියෝගයක් අනුව බැංකුව විසින් බැංකු ගිණුමෙන් රු.75,000/- ක මුදලක් අඩු කරගෙන තිබුණ ද එය මුදල් පොතෙහි වාර්තාකර නොතිබුණි.

(2) ගනුදෙනුකරුවෙකු විසින් බැංකුව වෙත සෘජුවම තැන්පත් කළ රු.30,000/- ක් මුදල් පොතෙහි වාර්තාකර නොතිබුණි.

(3) **රණසිංහ සහ සමාගම** විසින් 2020 මාර්තු 29 දින රු.195,000/- ක් වටිනා චෙක්පතක් නිකුත්කර තිබුණ ද, එය 2020 මාර්තු 31 දින වන විටත් ගෙවීම සඳහා බැංකුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(4) **රණසිංහ සහ සමාගම** විසින් 2020 මාර්තු 30 දින රු.65,000/- ක් වටිනා චෙක්පතක් බැංකුවෙහි තැන්පත් කර තිබූ නමුත් එය 2020 මාර්තු 31 දින වන විටත් උපලබ්ධි වී නොතිබුණි.

(5) රු.1,500/- ක බැංකු ගාස්තු මුදල් පොතෙහි වාර්තාකර නොතිබුණි.

**ඔබ විසින් කළ යුතු දැ:**

(a) ගැලපෙන ලද මුදල් පාලන ගිණුම (මුදල් පොත) **පිළියෙල කරන්න**. (ලකුණු 03)

(b) 2020 මාර්තු 31 දිනට බැංකු ප්‍රකාශනයෙහි පෙන්නුම්කරන ශේෂය **හඳුනා දක්වන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 10)

**(AAT July 2020)**

## අභ්‍යාසය 61

සීමාසහිත ටෙක්ස් ගාමන්ට්ස් (පෞද්ගලික) සමාගමේ 2017 දෙසැම්බර් මාසය සඳහා මුදල් ලැබීම් ජ'නලය, ගෙවීම් ජ'නලය සහ බැංකු ප්‍රකාශනය පහත දැක්වේ.

| මුදල් ලැබීම් ජ'නලය | | |
|---|---|---|
| දිනය | ලැබීම් | වටිනාකම (රු.) |
| 2017.12.01 | ගිණුම විවෘත කිරීමට මූලික තැන්පතුව | 1,000,000 |
| 2017.12.02 | මුදල් තැන්පතු | 480,760 |
| 2017.12.15 | මුදල් තැන්පතු | 12,580 |
| 2017.12.18 | ණයගැතියෙකුගේ තැන්පතු | 766,600 |
| 2017.12.18 | චෙක්පත් තැන්පතු | 154,540 |

| මුදල් ගෙවීම් ජර්නලය | | | |
|---|---|---|---|
| දිනය | චෙක් අංකය | ගෙවීම් | වටිනාකම (රු) |
| 2017.12.09 | 637101 | ණයහිමියන්ට ගෙවීම් | 132,580 |
| 2017.12.15 | 637102 | කුලී ගෙවීම් | 125,540 |
| 2017.12.21 | 637103 | විදුලිය ගෙවීම් | 12,000 |
| 2017.12.21 | 637104 | ණයහිමියන්ට ගෙවීම් | 52,480 |
| 2017.12.25 | | සෘජු මාරු කිරීම - වැටුප් | 1,955,640 |

සීමාසහිත ටෙක්ස් ගාමන්ට්ස් (පෞද්ගලික) සමාගම
2017 දෙසැම්බර් මාසය සඳහා බැංකු ප්‍රකාශනය

| දිනය | විස්තරය | යොමුව | හර (රු.) | බැර (රු.) | ශේෂය (රු.) |
|---|---|---|---|---|---|
| 2017.12.01 | ඉ/ගෙ ශේෂය | | - | - | |
| 2017.12.01 | මුදල් තැන්පතු - ගිණුම විවෘත කිරීම | | | 1,000,000 | 1,000,000 |
| 2017.12.01 | චෙක්පොත් ගාස්තු | | 500 | | 999,500 |
| 2017.12.02 | මුදල් තැන්පතු | | | 480,760 | 1,480,260 |
| 2017.12.15 | මුදල් තැන්පතු | | | 12,580 | 1,492,840 |
| 2017.12.18 | සෘජු තැන්පතු | යොමුව 12542165 | | 766,600 | 2,259,440 |
| 2017.12.18 | චෙක්පත් තැන්පතු | | | 154,540 | 2,413,980 |
| 2017.12.22 | චෙක්පතින් ගෙවීම | 637103 | 12,000 | | 2,401,980 |
| 2017.12.22 | බැංකු ගාස්තු | | 13,670 | | 2,388,310 |
| 2017.12.25 | මාරු කිරීම් | යොමුව 23154851 | 1,955,640 | | 432,670 |
| 2017.12.30 | ස්ථාවර නියෝග | ණය අංකය 62587413 | 69,000 | | 363,670 |
| 2017.12.30 | චෙක්පතින් ගෙවීම | 637101 | 132,580 | | 231,090 |
| 2017.12.31 | ශේෂය | | | | 231,090 |

2017 දෙසැම්බර් 31 දිනට මුදල් පාලන ගිණුමේ වාසිදායක ශේෂය රු. 136,340/- කි.

ඔබ විසින් කළ යුතු දෑ:

පහත දෑ පිළියෙල කරන්න.

(a) 2017 දෙසැම්බර් 31 දිනට ගලපන ලද මුදල් පාලන ගිණුම (ලකුණු 03)
(b) 2017 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනය (ලකුණු 02)

(මුළු ලකුණු 05)

**(AAT - AA2 - January 2018)**

## අභ්‍යාසය 62

සීමාසහිත නිලේන්ද්‍ර (පෞද්ගලික) සමාගමට අලුතින් පත්වූ ගිණුම් සහායක විසින් 2018 දෙසැම්බර් මාසයට අදාළව පිළියෙල කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශනය පහත පරිදි වේ.

| | රු. |
|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට බැංකු ප්‍රකාශනය අනුව ශේෂය | 1,721,490 |
| අඩු කළා : ගෙවීම් සඳහා ඉදිරිපත් නොවූ චෙක්පත් : | |
| චෙක්පත් අංක 150162 | (435,000) |
| චෙක්පත් අංක 150278 | (123,000) |
| බැංකු ප්‍රකාශනයේ සඳහන් වන හඳුනා නොගත් බැර අයිතමය | (190,000) |
| එකතු කළා : තැන්පත් කරන ලද නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් | |
| චෙක්පත් අංක 506761 | 520,000 |
| **2018 දෙසම්බර් 31 දිනට මුදල් පාලන ගිණුමට (මුදල් පොතට) අනුව බැංකු ශේෂය** | **1,493,490** |

කෙසේවෙතත්, බැංකු සැසඳුම් ප්‍රකාශනයෙහි සඳහන් වන මුදල් පාලන ගිණුමට අනුව බැංකු ශේෂය, මුදල් පාලන ගිණුමෙහි සඳහන් සත්‍ය බැංකු ශේෂයට වඩා වෙනස් බව හඳුනාගන්නා ලද අතර, එකී වෙනසට හේතු ලෙස පහත සඳහන් දෑ සොයා ගන්නා ලදී.

(1) ඉදිරිපත් නොවූ චෙක්පතක් වන චෙක්පත් අංක 150162 හි නිවැරදි වටිනාකම රු. 453,000/- ක් වූ අතර, එය මුදල් පාලන ගිණුමෙහි නිවැරදිව සටහන්ව තිබුණි.

(2) හඳුනා නොගත් බැර අයිතමය, ව්‍යාපාරයේ ගනුදෙනුකරුවෙකු විසින් සෘජුවම බැංකු ගිණුමට කරන ලද තැන්පත් කිරීමක් බව පසුව හඳුනා ගන්නා ලදී. මෙය මුදල් පාලන ගිණුමෙහි වාර්තා වී නොතිබුණි.

(3) 2018 දෙසැම්බර් මාසයට අදාළ බැංකු ගාස්තුව වන රු. 6,570/- මුදල් පාලන ගිණුමෙහි සටහන් නොකරන ලදී.

ඔබ විසින් කළ යුතු දෑ:

(a) 2018 දෙසැම්බර් 31 දිනට මුදල් පාලන ගිණුමෙහි ගැලපීම්වලට පෙර පැවති සත්‍ය බැංකු ශේෂය හඳුනා දක්වන්න. (ලකුණු 02)
(b) 2018 දෙසැම්බර් මාසය සඳහා සංශෝධිත මුදල් පාලන ගිණුම පිළියෙල කරන්න.

(ලකුණු 03)

(මුළු ලකුණු 05)

**(AAT - AA2 - July 2019)**

## අභ්‍යාසය 63

රිකෝන් ට්‍රේඩර්ස්හි පොත්වලින් පහත සඳහන් තොරතුරු උපුටාගන්නා ලදී.

(1) 2018 අප්‍රේල් 30 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනය :

| | (රු.) | (රු.) |
|---|---|---|
| 2018 අප්‍රේල් 30 දිනට මුදල් පාලන ගිණුමේ (මුදල් පොතේ) ශේෂය | | 15,200 |
| එකතු කළා : නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් : | | |
| 265975 | 12,300 | |
| 265985 | 15,350 | 27,650 |
| අඩු කළා : උපලබ්ධි නොවූ තැන්පතු: | | |
| චෙක්පතු තැන්පතුව 257461 | | (65,000) |
| 2018 අප්‍රේල් 30 දිනට බැංකු ප්‍රකාශනයට අනුව ශේෂය | | (22,150) |

(2) 2018 මැයි 31 දින රු. 3,500/- ක චෙක්පොත් ගාස්තු බැංකුව විසින් අඩුකරගෙන ඇති අතර, මෙය මුදල් පොතේ සටහන් කර නොමැත.

(3) පහත සඳහන් නිකුත් කරන ලද චෙක්පත් 2018 මැයි 31 දින වනවිට බැංකුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.

| චෙක්පත් අංකය | නිකුත් කළ දිනය | වටිනාකම (රු.) |
|---|---|---|
| 265975 | 2018.04.15 | 12,300 |
| 266105 | 2018.05.15 | 3,200 |
| 266115 | 2018.05.31 | 60,000 |

(4) 2018 අප්‍රේල් 30 දිනට පැවති සියලුම උපලබ්ධි නොවූ තැන්පතු 2018 මැයි මාසය තුළදී උපලබ්ධි වී තිබුණි.

(5) 2018 මැයි 29 දින, බැංකුව විසින් වැරදීමකින් රු. 13,200/- ක් රිකෝන් ට්‍රේඩර්ස් හි බැංකු ගිණුමට හර කර තිබුණි.

(6) සමාගම විසින් 2018 මැයි 27 දින බැංකු ගිණුමේ තැන්පත් කළ පහත සඳහන් චෙක්පත 2018 මැයි 31 දින වන විටත් උපලබ්ධි වී නොතිබුණි.

| චෙක්පත් අංකය | වටිනාකම (රු.) |
|---|---|
| 452122 | 25,000 |

(7) 2018 මැයි 31 දිනට මුදල් පාලන ගිණුමේ (මුදල් පොතේ) හර ශේෂය (වාසිදායක ශේෂය) රු. 49,000/- ක් විය.

ඔබ විසින් කළ යුතු දෑ,

පහත සඳහන් දෑ පිළියෙල කරන්න.

(a) 2018 මැයි 31 දිනට ගලපන ලද මුදල් පාලන ගිණුම (මුදල් පොත) (ලකුණු 02)
(b) 2018 මැයි 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනය (ලකුණු 03)

(මුළු ලකුණු 05)

**(AAT - AA2 - July 2018)**

## අභ්‍යාසය 64

හසිත ට්‍රේඩර්ස්හි 2018 මැයි 31 දිනට මුදල් පාලන ගිණුමෙහි (මුදල් පොතෙහි) හර ශේෂය (වාසිදායක ශේෂය) රු. 328,500/- ක් වූ අතර, 2018 මැයි මාසයට අදාළ මුදල් ලැබීම් ජර්නලයෙහි සහ මුදල් ගෙවීම් ජර්නලයෙහි සාරාංශයක් පහත දැක්වේ.

| මුදල් ලැබීම් ජ'නලය | | |
|---|---|---|
| දිනය | ලැබීම් | වටිනාකම (රු.) |
| 2018.05.02 | මුදල් තැන්පතු | 28,000 |
| 2018.05.05 | අහමඩ් - චෙක්පත් අංක 343212 | 60,000 |
| 2018.05.12 | සීමාසහිත බර්නාඩ් (පෞද්.) සමාගම - චෙක්පත් අංක 451678 | 45,000 |
| 2018.05.18 | අමාලි ප්‍රින්ටර්ස් - චෙක්පත් අංක 231457 | 30,000 |
| 2018.05.30 | W. නිහාල් - චෙක්පත් අංක 117654 | 35,000 |
| | | 198,000 |

| මුදල් ගෙවීම් ජර්නලය | | |
|---|---|---|
| දිනය | ගෙවීම් | වටිනාකම (රු) |
| 2018.05.02 | මනෝහර - චෙක්පත් අංක 157842 | 50,000 |
| 2018.05.05 | හරේන්ද්‍ර - චෙක්පත් අංක 157843 | 26,000 |
| 2018.05.08 | P. ඩොනල්ඩ් - චෙක්පත අංක 157844 | 34,000 |
| 2018.05.26 | M. හර්ෂ - චෙක්පත් අංක 157845 | 11,000 |
| 2018.05.29 | සීමාසහිත මනහර (පෞද්ගලික) සමාගම - චෙක්පත් අංක 157846 | 13,500 |
| | | 134,500 |

2018 මැයි මාසයට අදාල හසිත ට්‍රේඩර්ස් හි බැංකු ප්‍රකාශනයෙහි උද්ධෘතයන් පහත දැක්වේ.

| දිනය | විස්තරය | හර (රු.) | බැර (රු.) | ශේෂය (රු.) |
|---|---|---|---|---|
| 2018.05.01 | ශේෂය | | | 265,000 |
| 2018.05.03 | මුදල් තැන්පතු | | 28,000 | |
| 2018.05.05 | චෙක්පත් ගෙවීම් - 157842 | 50,000 | | 243,000 |
| 2018.05.08 | චෙක්පත් තැන්පතු - 343212 | | 60,000 | 303,000 |
| 2018.05.12 | චෙක්පත් ගෙවීම් - 157843 | 26,000 | | |
| 2018.05.15 | චෙක්පත් තැන්පතු - 451678 | | 45,000 | 322,000 |
| 2018.05.18 | චෙක්පත් ගෙවීම් - 157844 | 34,000 | | 288,000 |
| 2018.05.23 | චෙක්පත් තැන්පතු - 231457 | | 30,000 | 318,000 |

| | | | | |
|---|---|---|---|---|
| 2018.05.25 | ණය වාරිකය | 30,000 | | 288,000 |
| 2018.05.27 | සෘජු තැන්පතු - 141567 | | 12,000 | 300,000 |
| 2018.05.31 | බැංකු ගාස්තු | 2,500 | | 297,500 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ පිළියෙල කරන්න.

(a) 2018 මැයි 31 දිනට ගලපන ලද මුදල් පාලන ගිණුම (මුදල් පොත) (ලකුණු 03)

(b) 2018 මැයි 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනය (ලකුණු 02)

(මුළු ලකුණු 05)

## අභ්‍යාසය 65

2016 මාර්තු 31 දිනට සීමාසහිත වින්ඩි හයි ටී සමාගමේ, බැංකු ප්‍රකාශනයේ ශේෂය, මුදල් පොතේ බැංකු තීරුවේ තිබූ රු. 107,000/- ක හර ශේෂය සමග එකඟ වූයේ නැත. එම දිනයේ බැංකු ප්‍රකාශනයේ රු. 227,000/- ක වාසිදායක ශේෂයක් පෙන්නුම් කරන ලදී.
වෙනසට හේතු වූ පහත සඳහන් කරුණු පසුව අනාවරණය විය.

01. පහත දැක්වෙන නිකුත් කළ චෙක්පත් 2016 මාර්තු 31 දිනට ගෙවීම සඳහා බැංකුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.

| චෙක්පත් අංකය | නිකුත්කළ දිනය | වටිනාකම රු. |
|---|---|---|
| 750298 | 2016.03.25 | 5,500 |
| 750307 | 2016.03.28 | 70,000 |
| 750136 | 2016.03.30 | 83,000 |

02. පහත සඳහන් තැන්පත් කරන ලද චෙක්පත 2016 මාර්තු මාසය තුළදී උපලබ්ධි වී නොතිබුණි.

| චෙක්පත් අංකය | තැන්පත්කළ දිනය | වටිනාකම රු. |
|---|---|---|
| 345675 | 2016.03.30 | 25,000 |

03. 2016 මාර්තු 30 දින බැංකුව විසින් වැරදීමකින් රු. 11,000/- ක් සීමාසහිත වින්ඩි හයි ටී සමාගමේ බැංකු ගිණුමට හරකර තිබුණේ ය.

04. 2016 මාර්තු මාසය සඳහා බැංකුව විසින් අයකරන ලද රු. 2,500/- ක බැංකු ගාස්තුව මුදල් පොත් සටහන් කර නොතිබුණි.

ඔබ විසින් කළ යුතු දෑ,
සීමාසහිත වින්ඩි හයි ටී සමාගම සඳහා පහත සඳහන් දෑ පිළියෙල කරන්න.

(a) 2016 මාර්තු 31 දිනට ගලපන ලද මුදල් පොත

(b) 2016 මාර්තු 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය (ලකුණු 05)

**(AAT - AA2 - July 2016)**

## අභ්‍යාසය 66

2015 මාර්තු දිනට, සීමාසහිත පර්ෆෙක්ට් (පෞද්ගලික) සමාගමේ මුදල් පොතෙහි රු.156,400/- ක බැංකු හර ශේෂයක් පෙන්නුම් කළ අතර, එය බැංකු ප්‍රකාශනයේ ශේෂයට වඩා වෙනස් විය. වාර්තා පරීක්ෂා කිරීමේදී එම වෙනසට හේතු වූ පහත සඳහන් කරුණු අනාවරණය විය.

(1) බැංකුව රු. 3,000/- ක බැංකු ගාස්තු අයකර තිබුණි.

(2) වැරදීමකින් බැංකුව අයකරගෙන තිබූ චෙක්පොත් ගාස්තුව රු. 750/- කි.

(3) ගනුදෙනුකරුවෙකු විසින් බැංකු ගිණුමට සෘජුවම තැන්පත් කර තිබූ රු. 10,000/- ක් මුදල් පොතේ සටහන් කර නොතිබුණි.

(4) පහත සඳහන් තැන්පත් කරන ලද චෙක්පත් මාසය තුල උපලබ්ධි වී නොතිබුණි.

අංක 750121 : රු. 25,000/-

අංක 141510 : රු. 110,000/-

(5) පහත සඳහන් නිකුත් කළ චෙක්පත් බැංකුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.

අංක 500221 : රු. 65,000/-

අංක 500300 : රු. 27,000/-

**ඔබ විසින්,**

2015 මාර්තු 31 දිනට, බැංකු සැසඳුම් ප්‍රකාශය **පිළියෙල කරන්න.** එදිනට බැංකු ප්‍රකාශයේ පෙන්වා තිබූ ශේෂය **හඳුනා දක්වන්න.** (ලකුණු 05)

**(AAT - AA2 - July 2015)**

## අභ්‍යාසය 67

ඔල්ඩ් ෆැෂන්ස් ආයතනයේ 2013 දෙසැම්බර් මාසය සඳහා වූ පහත දැක්වෙන මුදල් පොත සහ බැංකු ප්‍රකාශනය ඔබට දී ඇත:

මුදල් ලැබීම් ජ'නලය

| දිනය | විස්තරය | රු. |
|---|---|---|
| 6 | ණයගැතියෝ | 12,000 |
| 10 | මුදලට විකුණුම් | 27,000 |
| 15 | මුදලට විකුණුම් | 82,000 |
| 19 | ණයගැතියෝ | 18,200 |
| 20 | මුදලට විකුණුම් | 38,000 |
| 24 | ණයගැතියෝ | 3,000 |
| | | |
| | | 180,200 |
| | | |

මුදල් ගෙවීම් ජර්නලය

| දිනය | විස්තරය | රු. |
|---|---|---|
| 5 | චෙක් අංක 501 - සීමාසහිත පසන් සමාගම | 20,000 |
| 7 | චෙක් අංක 502 - සීමාසහිත සාමා සමාගම | 35,000 |
| 11 | චෙක් අංක 503 - සීමාසහිත ලංකා සමාගම | 2,100 |
| 13 | චෙක් අංක 504 - ගෙවල් කුලී | 5,000 |
| 17 | චෙක් අංක 505 - මුදල් | 25,000 |
| 20 | චෙක් අංක 506 - රක්ෂණය | 4,275 |
| 23 | චෙක් අංක 507 - සමන් ට්‍රේඩර්ස් | 30,000 |
| | | 121,375 |
| | | |

මුදල් පාලන ගිණුම

| | | | |
|---|---|---|---|
| ශේෂය ඉ/ගෙ | 100,000 | මුදල් ගෙවීම් | 121,375 |
| මුදල් ලැබීම් | 180,200 | ශේෂය ප/ගෙ | 158,825 |
| | 280,200 | | 280,200 |
| ශේෂය ඉ/ගෙ | 158,825 | | |

බැංකු ප්‍රකාශනය

| දිනය | විස්තරය | හර (රු.) | බැර (රු. | ශේෂය (රු.) |
|---|---|---|---|---|
| 01 | ශේෂය ඉ/ගෙ | - | - | 100,000 |
| 08 | චෙක් තැන්පතු | - | 12,000 | 112,000 |
| 09 | චෙක් ගෙවීම 501 | 20,000 | - | 92,000 |
| 10 | චෙක් ගෙවීම 502 | 35,000 | - | 57,000 |
| | මුදල් තැන්පතු | - | 27,000 | 84,000 |
| 15 | මුදල් තැන්පතු | - | 82,000 | 166,000 |
| | චෙක් ගෙවීම 504 | 5,000 | - | 161,000 |
| 16 | චෙක් ගෙවීම 503 | 2,100 | - | 158,900 |
| 17 | චෙක් ගෙවීම 505 | 25,000 | - | 133,900 |
| 20 | මුදල් තැන්පතු | - | 38,000 | 171,900 |
| 28 | ලාභාංශ | - | 7,000 | 178,900 |
| | බැංකු ගාස්තු | 2,300 | - | 176,600 |

ඔබ විසින්, පහත සඳහන් දෑ පිළියෙල කළ යුතුය:

(a) ගලපන ලද මුදල් පොත.

(b) 2013 දෙසැම්බර් 31 දිනට මුදල් පොත ගැලපීමෙන් පසු බැංකු සැසඳුම් ප්‍රකාශය.

**(AAT Foundation - January 2014 - 7 1/2**
**Marks නව විෂය නිර්දේශය අනුව සංශෝධනය කර ඇත.)**

## අභ්‍යාසය 68

2012 දෙසැම්බර් මාසය සඳහා සොෆ්ට් ට්‍රේඩර්ස් ව්‍යාපාරයේ පහත දැක්වෙන මුදල් පාලන ගිණුම සහ බැංකු ප්‍රකාශය ඔබට සපයා ඇත.

මුදල් ලැබීම් ජ'නලය

| දිනය | විස්තරය | රු. |
|---|---|---|
| 12 | ණයගැතියෝ - 500200 | 100,000 |
| 25 | ණයගැතියෝ - 129786 | 95,000 |
| 25 | සෝමවීර - 324567 | 20,000 |
| 26 | BQ ට්‍රේඩර්ස් - 400321 | 70,000 |
| | | |
| | | |
| | | 285,000 |

මුදල් ගෙවීම් ජර්නලය

| දිනය | විස්තරය | රු. |
|---|---|---|
| 04 | අමල් - 232321 | 150,000 |
| 10 | වියදම් - 232322 | 25,000 |
| 15 | ඉන්ද්‍ර ට්‍රේඩර්ස් - 232323 | 80,000 |
| 25 | කුමාර - 232324 | 115,000 |
| | හිමාලි - 232325 | 50,000 |
| | කුමාර - 232324 | 115,000 |
| | | 535,000 |

**බැංකු ප්‍රකාශය**

| දිනය | විස්තරය | හර (රු.) | බැර (රු.) | ශේෂය (රු.) |
|---|---|---|---|---|
| 2012.12.01 | ශේෂය ඉ/ගෙ | - | - | 444,000 |
| 2012.12.11 | ආපසු ගැනීම් - 232322 | 25,000 | - | 419,000 |
| 2012.12.13 | තැන්පතු 500200 | - | 100,000 | 519,000 |
| 2012.12.16 | ආපසු ගැනීම් - 232321 | 150,000 | - | 369,000 |
| 2012.12.16 | ඍජු තැන්පතු - 39866 | - | 200,000 | 569,000 |
| 2012.12.21 | ස්ථාවර තැන්පතු පොළිය | - | 78,000 | 647,000 |
| 2012.12.27 | තැන්පතු - 129786 | - | 95,000 | 742,000 |
| | ආපසු ගැනීම් - 232324 | 115,000 | - | 627,000 |
| 2012.12.28 | ස්ථාවර නියෝග ගෙවීම් | 60,000 | - | 567,000 |
| 2012.12.31 | බැංකු ගාස්තු | 1,000 | - | 566,000 |
| 2012.12.31 | චෙක්පොත් ගාස්තු | 250 | - | 565,750 |

**ඔබ විසින්**

(a) දෙසැම්බර් මාසය සඳහා මුදල් පාලන ගිණුම

(b) ගලපන ලද මුදල් පොත,

(c) 2012 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය,

ගණනය කළ යුතු ය.

**(AAT Foundation - January 2013 නව විෂය නිර්දේශය අනුව සංශෝධනය කර ඇත.)**

## අභ්‍යාසය 69

2012 අප්‍රේල් 30 දිනට **වත්සලා කෝපි ආපන ශාලාවේ** බැංකු ගිණුම් ප්‍රකාශයේ ශේෂය, එහි මුදල් පොතේ බැංකු තීරුවේ තිබූ රු. 23,000/- ක අයිරා ශේෂය සමග එකඟ වූයේ නැත. එම දිනයේ බැංකු ප්‍රකාශයේ රු. 17,000/- ක වාසිදායක ශේෂයක් පෙන්නුම් කෙරේ.

පසුව, පහත සඳහන් හේතු අනාවරණය විය.

<u>මුදල් පොතේ නොදැක්වෙන, එහෙත් බැංකු ප්‍රකාශයේ දැක්වෙන අයිතමඃ</u>

(1) බැංකුවෙන් බැර කරන ලද රු. 14.000/- ක ස්ථාවර තැන්පත් පොලිය.

(2) රු. 2,000/- ක බැංකු ගාස්තු.

(3) ස්ථාවර නියෝගයක් මත රක්‍ෂණය සඳහා රු. 20,000/- ක් ගෙවීම.

(4) **වත්සලා කෝපි ආපන ශාලාවේ** ණයගැතියෙකු විසින් කල රු. 43,000/- ක සෘජු තැන්පතුවක්.

(5) රු. 4,000/- ක් සඳහා නිකුත් කළ චෙක්පතක් මුදල් පොතේ බැංකු තීරුවේ සටහන් නොවීම.

<u>බැංකු ප්‍රකාශයේ නොදැක්වෙන, එහෙත් මුදල් පොතේ දැක්වෙන අයිතමඃ</u>

(1) රු. 6,400/- ක ගනුදෙනුකරුවන්ගේ චෙක් තැන්පතු.

(2) නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ රු. 15,400/- ක චෙක්පත්.

**ඔබ විසින් පහත දෑ පිළියෙල කළ යුතු ය.**

(a) ගලපන ලද මුදල් පොත.

(b) 2012 අප්‍රේල් 30 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය. **(AAT Foundation - July 2012)**

## අභ්‍යාසය 70

**සීමාසහිත චාම් කේක් සමාගමේ** 2016 දෙසැම්බර් 31 දිනට බැංකු ප්‍රකාශනයේ රු. 53,029/- ක බැංකු අයිරා ශේෂයක් පෙන්නුම් කළ අතර, සමාගමේ මුදල් පොතේ රු. 15,274/- ක හර ශේෂයක් පෙන්නුම් කළේ ය. වෙනස සඳහා පහත හේතු හඳුනා ගෙන ඇත.

(1) තැන්පත් කරන ලද පහත චෙක්පත්, 2016 දෙසැම්බර් 31 වනවිට උපලබ්ධි වී නොතිබීම.

| චෙක්පත් අංකය | තැන්පත් කළ දිනය | වටිනාකම (රු.) |
|---|---|---|
| 321154 | 2016.12.28 | 156,200 |
| 265471 | 2016.12.31 | 24,675 |

(2) සමාගම විසින් නිකුත් කළ පහත චෙක්පත්, 2016 දෙසැම්බර් 31 වනවිට ගෙවීම සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

| චෙක්පත් අංකය | තැන්පත් කළ දිනය | වටිනාකම (රු.) |
|---|---|---|
| 628734 | 2016.12.25 | 3,274 |
| 628742 | 2016.12.28 | 115,248 |

(3) නිකුත් කරන ලද චෙක්පත් අංක 628730 හි නිවැරදි වටිනාකම රු. 67,945/- ක් වුව ද, පොත් තබන්නා විසින් එහි වටිනාකම රු. 69,745/- ක් ලෙස මුදල් පොතේ වැරදි ලෙස ඇතුලත් කර ඇත.

(4) 2016 දෙසැම්බර් 31 දින බැංකුව විසින් අයකළ රු. 2,500/- ක චෙක්පොත් ගාස්තු, මුදල් පොතේ සටහන් කර නොතිබුණි.

(5) 2016 දෙසැම්බර් 31 දින බැංකුව විසින් වැරදීමකින් රු. 5,250/- ක් සීමාසහිත චාම් කේක් සමාගමේ බැංකු ගිණුමට බැර කර ඇත.

ඔබ විසින් කළ යුතු දෑ,

**සීමාසහිත චාම් කේක් සමාගම** සඳහා පහත සඳහන් දෑ පිළියෙල කරන්න.

(a) 2016 දෙසැම්බර් 31 දිනට ගලපන ලද මුදල් පොත. (බැංකු තීරුව)
(ලකුණු 02)

(b) 2016 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනය.
(ලකුණු 03)

(මුළු ලකුණු 05)

**(AAT - January 2017)**

## අභ්‍යාසය 71

2017 පෙබරවාරි 28 දිනට සීමාසහිත සිවා (පෞද්ගලික) සමාගමේ බැංකු සැසඳුම් ප්‍රකාශනය පහත සඳහන් පරිදි විය.

| | රු. | රු. |
|---|---|---|
| 2017 පෙබරවාරි 28 දිනට මුදල් පොතට අනුව ශේෂය | | (12,300) |
| එකතු කළා: නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත්: | | |
| අංක 251371 | 12,000 | |
| අංක 251372 | 13,200 | 25,200 |
| අඩු කළා: තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් | | |
| අංක 265971 | | (50,000) |
| 2017 පෙබරවාරි 28 දිනට බැංකු ප්‍රකාශනයට අනුව ශේෂය (අයිරාව) | | (37,100) |

2017 මාර්තු මාසය සඳහා පහත සඳහන් තොරතුරු ද සපයා ඇත.

(1) 2017 මාර්තු මාසය සඳහා බැංකු ප්‍රකාශනයට අනුව, බැංකුව විසින් රු. 3,000/- ක චෙක්පොත් ගාස්තුවක් අඩු කර තිබුණ ද, එය මුදල් පොතේ සටහන් වී නොතිබුණි.

(2) 2017 මාර්තු මාසය තුළ නිකුත් කරන ලද පහත සඳහන් චෙක්පත්, 2017 මාර්තු 31 දින වන විට ගෙවීම සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

| චෙක්පත් අංකය | චෙක්පතේ දිනය | වටිනාකම (රු.) |
|---|---|---|
| 251433 | 2017.03.27 | 4,500 |
| 251439 | 2017.03.31 | 12,890 |

(3) 2017 මාර්තු මාසය තුළ තැන්පත් කළ පහත සඳහන් චෙක්පත, 2017 මාර්තු 31 දින වනවිට උපලබ්ධි වී නොතිබුණි.

| චෙක්පත් අංකය | චෙක්පතේ දිනය | වටිනාකම (රු.) |
|---|---|---|
| 452316 | 2017.03.30 | 12,200 |

(4) 2017 පෙබරවාරි 28 දිනට ඇති බැංකු සැසඳුම් ප්‍රකාශනයේ ඇතුළත් කර තිබූ රු. 50,000/- ක උපලබ්ධි නොවූ තැන්පතුව, 2017 මාර්තු මාසය තුළ දී උපලබ්ධි වී තිබුණි.

(5) 2017 පෙබරවාරි මාසය තුළ නිකුත් කළ පහත සඳහන් චෙක්පත, 2017 මාර්තු 31 දින වනවිටත් ඉදිරිපත් කර නොතිබුණි.

| චෙක්පත් අංකය | චෙක්පතේ දිනය | වටිනාකම (රු.) |
|---|---|---|
| 251372 | 2017.02.17 | 13,200 |

(6) සීමාසහිත සිවා (පෞද්ගලික) සමාගමේ 2017 මාර්තු 31 දිනට, මුදල් පොතේ බැංකු තීරුවේ පැවති වාසිදායක ශේෂය රු. 107,000/- කි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත දෑ පිළියෙල කරන්න.

(a) 2017 මාර්තු 31 දිනට ගලපන ලද මුදල් පොත (ලකුණු 01)

(b) 2017 මාර්තු 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනය (ලකුණු 04)

(මුළු ලකුණු 05)

**(AAT - July 2017)**

## අභ්‍යාසය 72

01. 2014 මාර්තු 31 දිනට, සීමාසහිත ණ සමාගමේ බැංකු ප්‍රකාශනයෙහි රු. 125,000/- ක වාසිදායක ශේෂයක් පෙන්වුව ද, මුදල් පොතෙහි වෙනස් ශේෂයක් පෙන්නුම් කළේය. වෙනස සඳහා පහත සඳහන් හේතු හඳුනාගන්නා ලදී.

- තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් රු. 13,000/- ක් විය.
- නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් රු. 3,500/- ක් විය.
- ස්ථාවර නියෝගයකින් ගෙවූ රු. 16,250/- ක ගෙවල් කුලිය සහ රු. 750/- ක බැංකු ගාස්තු, මුදල් පොතේ සටහන් කර නොතිබුණි.

2014 මාර්තු 31 දිනට, ගැලපීම කිරීමට පෙර මුදල් පොතේ බැංකු ශේෂය වන්නේ:

(1) රු. 117,500/- (හර) (2) රු. 132,500/- (හර)
(3) රු. 151,500/- (හර) (4) රු. 151,500/- (බැර)

**(AAT Foundation - July 2014)**

02. සීමාසහිත XYZ (පෞද්ගලික) සමාගමේ 2013 මාර්තු 31 දිනට බැංකු ප්‍රකාශනයේ වාසිදායක ශේෂය රු. 425,300/- ක් වුවද, මුදල් පොතේ ඊට වෙනස් ශේෂයක් පෙන්නුම් කළේය.

එම වෙනස සඳහා පහත දැක්වෙන හේතු හඳුනා ගන්නා ලදී.

- තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ රු. 30,000/- ක චෙක්පතක් තිබීම.
- නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් කර නොතිබූ රු. 43,500/- ක චෙක්පත් තිබීම.
- රු. 13,700/- ක බැංකු අයිරා පොලිය මුදල් පොතේ සටහන් කර නොතිබීම.

2013 මාර්තු 31 දිනට ගැලපීම් කිරීමට පෙර මුදල් පොතේ තිබූ බැංකු ශේෂය වන්නේ,

(1) රු. 400,800/- හර (2) රු. 425,100/- හර
(3) රු. 425,500/- හර (4) රු. 398,100/- හර

**(AAT Foundation - January 2014)**

03. 2013 මාර්තු 31 දිනට බැංකු ප්‍රකාශනයේ අයිරා ශේෂය රු. 500/- කි. මුදල් පොතේ, බැංකු තීරුවේ එදිනට ශේෂය, බැංකු ප්‍රකාශනයේ ශේෂය සමග නොගැලපුණි. පහත සඳහන් හේතු වෙනස සම්බන්ධයෙන් අනාවරණය විය.

- තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් රු. 17,000/- විය.
- නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් කර නොතිබූ චෙක්පත් රු. 18,000/- විය.
- සමාගමේ මුදල් පොතේ සටහන් නොවූ බැංකු වෙත කෙළින්ම ලද තැන්පතු රු. 20,000/-
- රු. 1,500/- ක බැංකු ගාස්තු මුදල් පොතේ සටහන් කර නොතිබුණි.

ගැලපීම් වලින් පසු 2013 මාර්තු 31 දිනට, මුදල් පොතේ නිවැරදි ශේෂය වන්නේ,

(1) රු. 1,500/- බැර (2) රු. 1,500/- හර
(3) රු. 20,000/- හර (4) රු. 20,000/- බැර

**(AAT Foundation - July 2013)**

04. 2012 මාර්තු 31 දිනට සීමාසහිත X සමාගමේ බැංකු ප්‍රකාශනය රු. 262,500/- ක අයිරා ශේෂයක් පෙන්නුම් කළ අතර, මුදල් පොත ඊට වෙනස් ශේෂයක් පෙන්නුම් කළේය. වෙනසට හේතු පහත සඳහන් පරිදි විය.

- නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් කර නොතිබූ රු. 60,000/- ක චෙක්පතක් තිබුණි.
- තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ රු. 27,000/- ක තැන්පතු තිබුණි.
- බැංකුව වැරදීමකින් රු. 5,000/- ක් ගිණුමට හර කර තිබුණි.
- රු. 9,000/- ක් වූ අයිරා පොළිය මුදල් පොතේ සඳහන් කර තිබුණේ නැත.

2012 මාර්තු 31 දිනට මුදල් පොතේ පෙන්නුම් කර තිබෙන බැංකු ශේෂය වූයේ,

(1) රු. 248,500/- බැර (2) රු. 290,500/-
(3) රු. 281,500/- බැර (4) රු. 281,500/- හර

**(AAT Foundation - July 2012)**

05. A සමාගමේ මාසයක් අවසානයේ දී බැංකු ප්‍රකාශය අනුව රු. 230,000/- ක ශේෂයක් පෙන්නුම් කරන අතර එදිනට මුදල් පොත අනුව ශේෂය රු. 130,000/- (හර) ක් විය. කෙසේ වෙතත් A සමාගමේ බැංකු ප්‍රකාශය පරීක්ෂා කර බැලීමේ දී බැංකුව මාසය සඳහා ආයෝජන පොලී වශයෙන් රු. 90,000/- ක් බැර කර ඇති බව සොයා ගැනුණි. බැංකුව විසින් වැරදීමකින් කළ රු. 12,500/- ක බැර කිරීමක් සහ බැංකුව විසින් හර කරන ලද රු. 2,500/- ක බැංකු ගාස්තු බැංකු ප්‍රකාශයේ ඇතුලත්ව තිබුණි. මාසය අවසානයේ දී A සමාගමේ ගලපන ලද මුදල් පොතේ ශේෂය විය යුත්තේ,

(1) හර රු. 220,000/- (2) හර රු. 217,500/-
(3) හර රු. 127,500/- (4) හර රු. 115,000/-

**(AAT Foundation - January 2012)**

# පාලන ගිණුම්

## Control Accounts

කිසියම් උප ලෙජරයක පවත්නා එකම වර්ගයකට අයත් ගිණුම් සමූහයක් වෙනුවෙන් පොදු ලෙජරයේ තබා ගන්නා තනි ගිණුම් පාලන ගිණුමක් යනුවෙන් හඳුන්වයි. ඕනෑම ගිණුම් සමූහයක් වෙනුවෙන් පාලන ගිණුමක් පවත්වාගෙන යා හැකි නමුත් බහුලව පාලන ගිණුම් පවත්වාගනු ලබන්නේ ණයගැතියන්ගේ ගිණුම් හා ණයහිමියන්ගේ ගිණුම් සම්බන්ධයෙනි. මේ අනුව වඩා ප්‍රචලිත පාලන ගිණුම් වර්ග දෙකක් හඳුනාගත හැකිය.

01. ..............................................................................................................................................


..............................................................................................................................................

02. ..............................................................................................................................................

..............................................................................................................................................

## ලෙජරයඃ

කිසියම් ගිණුම් සමූහයක් ඒකරාශී කර ඇති හෝ ගොනු කර ඇති ස්ථානය ලෙජරයක් යනුවෙන් හැඳින්වේ. කුඩා පරිමාණයේ ව්‍යාපාරයක සියලුම ගිණුම් තනි ලෙජරයක පවත්වාගෙන යාහැකි වුවත් පාලන ගිණුම් නඩත්තු කරන ව්‍යාපාරයක ලෙජරය පහත සඳහන් පරිදි වර්ග කොට පවත්වා ගනී.




ලෙජර ගිණුම්වල කිසිදු බේදයකින් තොරව වත්කම්, වගකීම්, ආදායම්, වියදම් හා හිමිකම් යන ඕනෑම වර්ගයකට අයත් සෑම ගිණුමක් ම ඇතුළත් කළ හැකි ව්‍යාපාර ආතනයක අනාවාර්යයෙන්ම පවත්වා ගත යුතු ලෙජරය පොදු ලෙජරය යි.

ණයගැතියන්ගේ හා ණයහිමියන්ගේ පෞද්ගලික ගිණුම් පොදු ලෙජරයෙන් බැහැරව වෙනම ම පවත්වා ගනී නම් එම ගිණුම් ඒකරාශී කොට ඇති ලෙජරය පෞද්ගලික ලෙජරය වේ. පෞද්ගලික ලෙජරය ද ණයගැතියන්ගේ ලෙජරය හා ණයහිමියන්ගේ ලෙජරය වශයෙන් වර්ග කළ හැකි අතර මෙවැනි ලෙජරයන් උප ලෙජර හෙවත් අතිරේක ලෙජර හැටියට හඳුන්වාදිය හැකි ය.

## ණයගැති පාලන ගිණුම (විකුණුම් ලෙජර පාලන ගිණුම)

යම් ව්‍යාපාරයක් පොදු ලෙජරයට අමතරව ණයගැතියන් වෙනුවෙන් උප ලෙජරයක් තබා ගන්නා විට එම උප ලෙජරයේ පවතින ණයගැති පෞද්ගලික ගිණුම් වෙනුවෙන් ඒවා සියල්ල ම නියෝජනය වන පරිදි පොදු ලෙජරයේ තබා ගන්නා තනි ගිණුම ණයගැති පාලන ගිණුම නම් වේ.

ණයගැතියෝ වත්කමක් වන හෙයින් වත්කම් පිළිබඳ මූලධර්මයට අනුව ණයගැති පාලන ගිණුම පිළියෙල කෙරේ. ඒ අනුව ණයගැතියන් වැඩිවීමට ඉවහල්වන ගනුදෙනු ණයගැති පාලන ගිණුමට හර කළ යුතු අතර ණයගැතියන් අඩුවීමට ඉවහල්වන ගනුදෙනු ණයගැති පාලන ගිණුමට බැර කළ යුතු ය.

**ණයගැති පාලන ගිණුමක ආකෘතිය:**

**ණයගැති පාලන ගිණුම**

| | | | |
|---|---|---|---|
| ශේෂය ඉ/ගෙ | xxx | ශේෂය ඉ/ගෙ | xxx |
| ණයට විකුණුම් | xxx | ලද මුදල් හා චෙක්පත් | xxx |
| ලැබුණු චෙක්පත් අගරුවීම | xxx | දුන් වට්ටම් | xxx |
| ප්‍රමාද පොලී අයකිරීම | xxx | බොල් ණය | xxx |
| දුන් වට්ටම් අවලංගු කිරීම | xxx | ආපසු එවුම් | xxx |
| අගරු වූ ලැබිය යුතු බිල් | xxx | ලැබිය යුතු බිල්පත් | xxx |
| ශේෂය ප/ගෙ | xxx | ශේෂය ප/ගෙ | xxx |
| | xxx | | xxx |
| ශේෂය ඉ/ගෙ | xxx | ශේෂය ඉ/ගෙ | xxx |

## ණයගැති පාලන ගිණුමකට අවශ්‍ය තොරතුරු ලබා ගැනීමේ මූලාශ්‍ර / ප්‍රභවයන් / මාර්ග

| ගනුදෙනුව | උපයෝගී පොත | ද්විත්ව සටහන | | | |
|---|---|---|---|---|---|
| 1. ශේෂය | පොදු ජ'නලය | | | | |
| 2. ණයට විකුණුම් | විකුණුම් ජ'නලය | වෙළෙඳ ලැබිය යුතු දෑ පාලන ගිණුම | (හර) | XXX | |
| | | විකුණුම් ගිණුම | | | XXX |
| 3. අගරු වූ චෙක්පත් | පොදු ජ'නලය | වෙළෙඳ ලැබිය යුතු දෑ පාලන ගිණුම | (හර) | XXX | |
| | | අගරු චෙක් / බැංකු | | | XXX |
| 4. අගරු වූ විනිමය බිල් | පොදු ජ'නලය | වෙළෙඳ ලැබිය යුතු පාලන ගිණුම | (හර) | XXX | |
| | | විනිමය බිල් ගිණුම | | | XXX |
| 5. අහිමම් කළ වට්ටම් | පොදු ජ'නලය | වෙළෙඳ ලැබිය යුතු දෑ පාලන ගිණුම | (හර) | XXX | |
| | | දුන් වට්ටම් ගිණුම | | | XXX |
| 6. අයකළ ප්‍රමාද පොළී | පොදු ජ'නලය | වෙළෙඳ ලැබිය යුතු දෑ පාලන ගිණුම | (හර) | XXX | |
| | | ප්‍රමාද පොළී ගිණුම | | | XXX |
| 7. වෙළෙඳ ලැබිය යුතු දෑ සඳහා හානිකර අලාභ | පොදු ජ'නලය | වෙළෙඳ ලැබිය යුතු දෑ හානිකර අලාභ පාලන ගිණුම | (හර) | XXX | |
| | | වෙළෙඳ ලැබිය යුතු දෑ පාලන ගිණුම | | | XXX |
| 8. මුදල් / චෙක්පත් ලැබීම | මුදල් ලැබීම් ජ'නලය | මුදල් ගිණුම | (හර) | XXX | |
| | | වෙළෙඳ ලැබිය යුතු පාලන ගිණුම | | | XXX |
| 9. දුන් වට්ටම් | මුදල් ලැබීම් ජ'නලය | දුන් වට්ටම් ගිණුම | (හර) | XXX | |
| | | වෙළෙඳ ලැබිය යුතු දෑ පාලන ගිණුම | | | XXX |
| 10. ආපසු එවුම් | ආපසු එවුම් ජ'නලය | ආපසු එවුම් ගිණුම | (හර) | XXX | |
| | | වෙළෙඳ ලැබිය යුතු දෑ පාලන ගිණුම | | | XXX |
| 11. වෙ.ලැ.දෑ. හානිකර අලාභ කපා හැරීම | පොදු ජ'නලය | වෙ.ලැ.යු.දෑ. හානිකර අලාභ පාලන ගිණුම | (හර) | XXX | |
| | | වෙළෙඳ ලැබිය යුතු දෑ පාලන ගිණුම | | | XXX |
| 12. ලැබිය යුතු විනිමය බිල් | ලැ/යු විනිමය බිල් ජ'නලය | ලැබිය යුතු විනිමය බිල් | (හර) | XXX | |
| | | වෙළෙඳ ලැබිය යුතු දෑ පාලන ගිණුම | (හර) | | XXX |
| 13. වෙළෙඳ ගෙ.යු.දෑ සහ අන්තර් ලැබිය යුතු දෑ මාරුකිරීම | පොදු ජ'නලය | වෙළෙඳ ගෙවිය යුතු දෑ පාලන ගිණුම | (හර) | XXX | |
| | | වෙළෙඳ ලැබිය යුතු දෑ පාලන ගිණුම | | | XXX |

# ණයහිමි පාලන ගිණුම (ගැනුම් ලෙජර පාලන ගිණුම)

යම් ව්‍යාපාරයක් පොදු ලෙජරයට අමතරව ණයහිමියන් වෙනුවෙන් උප ලෙජරයක් තබා ගන්නා විට එම උප ලෙජරයේ පවතින ණයහිමි පෞද්ගලික ගිණුම් වෙනුවෙන් ඒවා සියල්ල ම නියෝජනය වන පරිදි පොදු ලෙජරයේ තබා ගන්නා තනි ගිණුම ණයහිමි පාලන ගිණුම නම් වේ.

ණයහිමියෝ වගකීමක් වන හෙයින් වගකීම් පිළිබඳ මූලධර්මයට අනුව ණයහිමි පාලන ගිණුම පිළියෙල කෙරේ. ඒ අනුව ණයහිමියන් වැඩිවීමට ඉවහල්වන ගනුදෙනු ණයහිමි පාලන ගිණමට බැර කළ යුතු අතර ණයහිමියන් අඩුවීමට ඉවහල්වන ගනුදෙනු ණයහිමි පාලන ගිණුමට හර කළ යුතු ය.

**ණයහිමි පාලන ගිණුමක ආකෘතිය:**

**ණයහිමි පාලන ගිණුම**

| | | | |
|---|---|---|---|
| ආරම්භක ශේෂය ඉ/ගෙ | xxx | ආරම්භක ශේෂය ඉ/ගෙ | xxx |
| මුදල් හා චෙක්පත්වලින් ගෙවීම් | xxx | ණයට ගැනුම් | xxx |
| ගෙවිය යුතු විනිමය බිල් | xxx | නිකුත් කළ චෙක්පත් අගරුවීම | xxx |
| ලැබූ වට්ටම් | xxx | ගෙවිය යුතු බිල්පත් අගරුවීම් | xxx |
| ආපසු යැවුම් | xxx | ගෙවිය යුතු ප්‍රමාද පොලී | xxx |
| හිස් භාජන ආපසු යැවුම් | xxx | අහිමි කළ ලැබූ වට්ටම් | xxx |
| අවසාන ශේෂය ප/ගෙ | xxx | අවසාන ශේෂය ප/ගෙ | xxx |
| | xxx | | xxx |
| අවසාන ශේෂය ඉ/ගෙ | xxx | අවසාන ශේෂය ඉ/ගෙ | xxx |

**වෙළෙඳ ගෙවිය යුතු දැ පාලන ගිණුමේ සටහන් කරන ගනුදෙනු සඳහා අදාළ උපයෝගී පොත් හා ද්විත්ව සටහන්**

| ගනුදෙනුව | උපයෝගී පොත | ද්විත්ව සටහන | | | |
|---|---|---|---|---|---|
| 1. ශේෂය | පොදු ජ'නලය | | | | |
| 2. ණයට ගැනුම් | ගැනුම් ජ'නලය | ගැනුම් ගිණුම | (හර) | xxx | |
| | | වෙළෙඳ ගෙවිය යුතු දැ පාලන ගිණුම | | | xxx |
| 3. චෙක්පත් ගෙවීම | මුදල් ගෙවීමේ ජ'නලය | වෙළෙඳ ගෙවිය යුතු දැ පාලන ගිණුම | (හර) | xxx | |
| | | මුදල් ගිණුම | | | xxx |
| 4. ගෙවිය යුතු විනිමය බිල් | ගෙවිය යුතු විනිමය බිල් ජ'නලය | වෙළෙඳ ගෙවිය යුතු පාලන ගිණුම | (හර) | xxx | |
| | | ගෙවිය යුතු විනිමිය බිල් ගිණුම | | | xxx |
| 5. ගෙවිය යුතු ප්‍රමාද පොළී | පොදු ජ'නලය | ප්‍රමාද පොළී ගිණුම | (හර) | xxx | |
| | | වෙළෙඳ ගෙවිය යුතු දැ පාලන ගිණුම | | | xxx |
| 6. අයකළ වෙනත් ගාස්තු | පොදු ජ'නලය | ගාස්තු ගිණුම | (හර) | xxx | |
| | | වෙළෙඳ ගෙවිය යුතු දැ පාලන ගිණුම | | | xxx |
| 7. මුදල් ගෙවීම | මුදල් ගෙවීම් ජ'නලය | වෙළෙඳ ගෙවිය යුතු දැ පාලන ගිණුම | (හර) | xxx | |
| | | මුදල් ගිණුම | | | xxx |
| 8. අගරු වූ චෙක්පත් | පොදු ජ'නලය | මුදල් ගිණුම | (හර) | xxx | |
| | | වෙළෙඳ ගෙවිය යුතු පාලන ගිණුම | | | xxx |
| 9. ආපසු යැවුම් | ආපසු යැවුම් ජ'නලය | වෙළෙඳ ගෙවිය යුතු දැ පාලන ගිණුම | (හර) | xxx | |
| | | ආපසු යැවුම් ගිණුම | | | xxx |
| 10. ලද වට්ටම් | මුදල් ගෙවීමේ ජ'නලය | වෙළෙඳ ගෙවිය යුතු දැ පාලන ගිණුම | (හර) | xxx | |
| | | ලද වට්ටම් ගිණුම | | | xxx |
| 11. අගරු වූ විනිමය බිල් | පොදු ජ'නලය | ගෙවිය යුතු විනිමය බිල් ගිණුම | (හර) | xxx | |
| | | වෙළෙඳ ගෙවිය යුතු දැ පාලන ගිණුම | | | xxx |
| 12. ප්‍රතිමාරු | පොදු ජ'නලය | වෙළෙඳ ගෙවිය යුතු දැ පාලන ගිණුම | (හර) | xxx | |
| | | වෙළෙඳ ලැබිය යුතු දැ පාලන ගිණුම | | | xxx |

## අභ්‍යාසය 73

මලිත්ගේ ව්‍යාපාරයේ 2013 ඔක්තෝම්බර් මාසය සඳහා වූ ණයගැතියන්ට අදාල පහත දැක්වෙන තොරතුරු ඔබ වෙත දී ඇත:

| ණයගැතියා | 2013 ඔක්තෝම්බර් 01 දිනට ශේෂය | ණයට විකුණුම් | ආපසු එවුම් | මුදල් ලැබීම් | දෙන ලද වට්ටම් |
|---|---|---|---|---|---|
| නුවන් | 15,000 | 53,000 | 5,000 | 25,000 | - |
| ලක්මාල් | 44,000 | 78,000 | 3,000 | 66,000 | 2,000 |
| ලලිත් | - | 82,000 | 4,500 | 36,000 | 1,750 |
| කුමාර | 4,500 | 45,000 | - | 29,500 | 500 |

ඔබ විසින්, 2013 ඔක්තෝම්බර් 31 දිනට ණයගැති පාලන ගිණුම සහ එක් එක් ණයගැතියන්ගේ ලෙජර් ගිණුම් පිළියෙල කළ යුතුය. **(AAT Foundation - January 2014 - 7 1/2 Marks)**

## අභ්‍යාසය 74

2009 දෙසැම්බර් මාසය සඳහා පහත සඳහන් තොරතුරු සිල්වාගේ ව්‍යාපාරයේ පොත්වලින් උපුටා ගන්නා ලදි.

| | රු |
|---|---|
| 2009 දෙසැම්බර් 01 දිනට වෙළෙඳ ණයගැති පාලන (ලැබිය යුතු ගිණුම්) ගිණුමේ ශේෂය | 985,000 |

| | රු |
|---|---|
| ණයට විකුණුම් වල එකතුව | 900,000 |
| ආපසු එවුම් ජ'නලයේ එකතුව | 30,000 |
| ණයගැතියන්ගෙන් ලැබුණ මුදල් හා චෙක්පත් | 831,000 |
| දුන් වට්ටම් | 21,600 |
| වෙළෙඳ ණයහිමියන්ගේ පාලන ගිණුමට මාරු කිරීම | 120,000 |
| ණයගැතියන්ගෙන් ලැබුණ චෙක්පත් වලින් අගරු වූ චෙක්පත් | 17,000 |
| අගරු වූ චෙක්පත් සඳහා බැංකුව අයකළ ගාස්තු | 320 |
| පසුගිය වර්ෂය තුළ ලියා හරින ලද බොල් ණය ලැබීම් | 1,000 |
| ලියා හරින ලද බොල්ණය | 23,560 |

ඔබ විසින්, 2009 දෙසැම්බර් මස සඳහා, සිල්වාගේ ව්‍යාපාරයේ ණයගැතියන්ගේ පාලන ගිණුම පිළියෙල කළ යුතු ය. **(AAT Foundation - June 2010)**

## අභ්‍යාසය 75

2012 දෙසැම්බර් මාසය සඳහා **ජීජී සහ සමාගමේ** ගනුදෙනු පහත වගුවේ දක්වා ඇත.

| ණයහිමියා | 2012.12.01 දිනට ශේෂය (රු) | ගැනුම් (රු.) | මුදලින් ගෙවීම් (රු.) | ලද වට්ටම (රු.) | ගැනුම් ආ-පසු යැවුම් (රු.) |
|---|---|---|---|---|---|
| අමල් | 25,000 බැර | 40,000 | 38,500 | 1,500 | 2,000 |
| බිමල් | 40,000 බැර | 35,000 | 50,000 | 2,000 | - |
| සිසිල් සහ සමාගම | 15,000 බැර | 55,000 | - | - | 5,000 |
| ඩයනා ඒජන්සි | - | 34,000 | - | - | - |

සිසිල් සහ සමාගමෙන් ලැබිය යුතුව තිබුණ රු. 52,000/- ක් 2012 දෙසැම්බර් 31 වන විට ජීජී සහ සමාගමට ලැබී නොතිබූ අතර, එය හර ශේෂයක් ලෙස ජීජී සහ සමාගමේ ණයගැති ලෙජරයේ පෙන්නුම් කෙරුණි. තමාට ලැබිය යුතු මුදලින් ජීජී සහ සමාගමට ගෙවිය යුතු මුදල් හිලව් කිරීමට සිසිල් සහ සමාගම එකඟ වී ඇත.

ඔබ විසින් 2012 දෙසැම්බර් 31 දිනට ජීජී සහ සමාගමේ ණයහිමි පාලන ගිණුම සහ එක් එක් ණයහිමි ලෙජර් ගිණුම් පිළියෙළ කළ යුතු ය. **(AAT Foundation - January 2013)**

## අභ්‍යාසය 76

පහත සඳහන් තොරතුරු **සෝමවීර ඇන්ඩ් සන්ස්** ව්‍යාපාරයේ පොත්වලින් උපුටා ගන්නා ලදී.

2011 ජූනි 01 දිනට ණයගැතියන්ගේ හිඟ ශේෂය:

| ණයගැතියාගේ නම | මුදල (රු) |
|---|---|
| අනිල් | 10,000 |
| සුනිල් | 15,000 |
| ගගුල් | 17,500 |

2011 ජූනි මාසය තුල ණයට විකුණුම් සහ ආපසු එවූ විකුණුම් පහත පරිදි විය.

| ණයගැතියාගේ නම | ණයට විකුණුම් (රු.) | විකුණුම් ආපසු එවුම් (රු.) |
|---|---|---|
| අනිල් | 40,000 | - |
| සුනිල් | 30,000 | 5,000 |

2011 ජූනි මාසය තුල මුදල් ලැබීම් සහ දුන් වට්ටම් පහත සඳහන් පරිදි විය.

| ණයගැතියා | ලැබූ මුදල (රු.) | දුන් වට්ටම් (රු) |
|---|---|---|
| අනිල් | 18,000 | 2,000 |
| සුනිල් | 32,000 | 3,000 |

ගගුල් බුන්වත්භාවයට පත්වී ඇති බැව් 2011 ජූනි 29 දින උසාවිය විසින් ප්‍රකාශයට පත්කර ඇති. අතර ඒ අනුව ඔහුගෙන් ලැබිය යුතු මුදල ලියා හැරිය යුතු ය.

ඔබ විසින්, 2011 ජූනි 30 දිනට ණයගැති පාලන ගිණුම සහ එක් එක් ණයගැතියන්ගේ ණයගැති ලෙජර් ගිණුම් පිළියෙල කළ යුතු ය. **(AAT Foundation - January 2012)**

## අභ්‍යාසය 77

ලිපිද්‍රව්‍ය අයිතම තොග වෙළෙන්දෙකු වන සන් බුක්ස් ව්‍යාපාරයේ 2016 මාර්තු 01 දිනට ණයහිමි පාලන ගිණුමේ සහ ණයගැති පාලන ගිණුමේ ශේෂ පහත පරිදි වේ.

| | රු. |
|---|---|
| ණයහිමි පාලන ගිණුම් | 2,350,000 |
| ණයගැති පාලන ගිණුම් | 1,780,000 |

2016 මාර්තු මාසය තුළ සන් බුක්ස් ව්‍යාපාරයේ ණයගැතියන්ට සහ ණයහිමියන්ට අදාල ගනුදෙනු පහතින් දැක්වේ.

| | රු. |
|---|---|
| ණය පදනම මත ලිපිද්‍රව්‍ය අයිතම මිලදී ගැනීම | 5,200,000 |
| ණය පදනම මත ලිපිද්‍රව්‍ය අයිතම විකිණීම | 4,800,000 |
| ණය පදනම මත මිලදී  ගැනුම් ආපසු යැවුම් | 750,000 |
| ණයහිමියන්ගේ ලද වට්ටම් | 300,000 |
| ණයහිමියන්ට කරන ලද ගෙවීම් | 3,200,000 |
| ණයගැතියන්ගෙන් ලැබීම් | 4,200,000 |
| ලියා හරින ලද බොල්ණය | 80,000 |

ඔබ විසින් කළ යුතු දෑ,

සන් බුක්ස් ව්‍යාපාරයේ 2016 මාර්තු මාසය පහත සඳහන් දෑ පිළියෙල කරන්න.

(a) ණයගැති පාලන ගිණුම

(ලකුණු 02)

(b) ණයහිමි පාලන ගිණුම

(ලකුණු 03)

(මුළු ලකුණු 05)

**(AAT - AA2 - July 2016)**

## අභ්‍යාසය 78

අමින්ද ෆැෂන්ස් හි පොදු ලෙජරයේ ඇතුලත් වෙළෙඳ ගෙවිය යුතු පාලන ගිණුමේ, 2015 ජූලි 31 දිනට, රු. 118,300/- ක බැර ශේෂයක් පෙන්නුම් කළ අතර, ගෙවිය යුතු උප ලෙජරයේ පෞද්ගලික ගිණුම් ශේෂයන්ගේ එකතුව රු. 118,800/- ක් විය. පසුව පරීක්ෂා කිරීමේදී වෙනසට හේතු වූ පහත සඳහන් කරුණු අනාවරණය විය.

(1) 2015 ජූලි මාසය සඳහා ලද වට්ටම්හි එකතුව වූ රු. 11,700/- ක් පාලන ගිණුමේ නිවැරදිව සටහන් කර තිබුණ ද, එය ගෙවිය යුතු පෞද්ගලික ලෙජර් ගිණුම්වල සටහන් වී නොතිබුණි.

(2) ගෙවිය යුතු උප ලෙජරයේ පෞද්ගලික ගිණුම් ශේෂ ලැයිස්තුවේ එකතුව රු. 7,000/- ක් වැඩියෙන් (overcasted) සටහන් වී ඇත.

(3) 2015 ජූලි මාසයේ දෛනික මිලදී ගැනුම් පොතේ එකතුව රු. 20,000/- කින් වැඩියෙන් සටහන් වී තිබුණි.

(4) 2015 ජූලි මාසය තුළ, සැපයුම්කරුවෙකු වූ **සුපර් ෆැෂන්ස්** වෙත ගෙවිය යුතුව තිබූ රු. 2,700/- ක්, ඔවුන්ගෙන් ලැබිය යුතුව තිබූ මුදලට හිලව් කරන ලදී. මෙය අදාල පෞද්ගලික ලෙජර් ගිණුම්වල නිවැරදිව සටහන් කර තිබූ නමුත්, පොදු ලෙජරයේ අදාල පාලන ගිණුම් වලින් අතහැරී තිබුණි.

(5) සැපයුම්කරුවෙකු වෙත මුදලින් ගෙවූ රු. 4,500/- ක් පාලන ගිණුමේ නිවැරදි ලෙස සටහන් කර තිබුණ ද, සැපයුම්කරුගේ පෞද්ගලික ලෙජර් ගිණුමේ සටහන් කර තිබුණේ නැත.

**ඔබ විසින් කළ යුතු දෑ,**

පහත සඳහන් දෑ පිළියෙල කරන්න.

(a) පොදු ලෙජරයේ සංශෝධිත (ගලපන ලද) වෙළෙඳ ගෙවිය යුතු පාලන ගිණුම.

(b) වෙළෙඳ ගෙවිය යුතු පාලන ගිණුමේ සංශෝධිත ශේෂය, ගෙවිය යුතු උප ලෙජරයේ පෞද්ගලික ගිණුම් ශේෂ ලැයිස්තුවේ එකතුව සමග සැසඳීමේ ප්‍රකාශනය. (ලකුණු 05)

**(AAT - AA2 - January 2016)**

## අභ්‍යාසය 79

2015 මාර්තු 31 දිනට, ශාන්තගේ පොදු ලෙජරයේ ඇතුලත් ලැබිය යුතු පාලන ගිණුමෙහි (Receivables Control Account) ශේෂය රු. 225,200/- ක් විය. ලැබිය යුතු ලෙජරයේ (Receivables ledger) තිබූ එක් එක් පුද්ගලික ගිණුම්වල ශේෂයන්ගේ එකතුව රු. 247,400/- කි.

පහත සඳහන් දෝෂ අනාවරණය කර ගන්නා ලදී.

(1) රු. 5,600/- ක ඉන්වොයිසියක් දෛනික විකුණුම් පොතෙහි නිවැරදිව සටහන් කරන ලද නමුත් ගනුදෙනුකරුගේ පුද්ගලික ගිණුමේ රු.6,500/- ක් ලෙස සටහන් කර තිබුණි.

(2) ගනුදෙනුකරුවෙකුගෙන් ලැබුණු රු.5,500/- ක චෙක්පතක් අගරු වී තිබුණි. මෙය ලැබිය යුතු ලෙජරයේ නිවැරදිව සටහන් කර තිබූ නමුත් ලැබිය යුතු පාලන ගිණුම යාවත්කාලීන (Update) කර තිබුණේ නැත.

(3) රු. 1,200/- ක දුන් වට්ටම් එකතුවක් පාලන ගිණුමේ සටහන් කර නොතිබුණි.

(4) දෛනික විකුණුම් පොත රු. 1,000/- කින් අඩුවෙන් සටහන් (Update cast) වී තිබුණි.

(5) රු. 8,000/- ක මුදල් ලැබීමක් ලැබිය යුතු ලෙජරයේ ගනුදෙනුකරුගේ පුද්ගලික ගිණුමට හරකර තිබුණි.

**ඔබ විසින්,**

පොදු ලෙජරයේ සංශෝධිත ලැබිය යුතු පාලන ගිණුම පිළියෙල කරන්න. ලැබිය යුතු ලෙජර ගිණුමේ ශේෂය, ලැබිය යුතු පාලන ගිණුමේ ශේෂය සමග සසඳන්න. (ලකුණු 05)

**(AAT - AA2 - July 2015)**

## අභ්‍යාසය 80

ලිපිද්‍රව්‍ය අයිතම තොග වෙළෙන්දෙකු වන සන් බුක්ස් ව්‍යාපාරයේ 2016 මාර්තු 01 දිනට ණයහිමි පාලන ගිණුමේ සහ ණයගැති පාලන ගිණුමේ ශේෂ පහත පරිදි වේ.

| | රු. |
|---|---|
| ණයහිමි පාලන ගිණුම් | 2,350,000 |
| ණයගැති පාලන ගිණුම් | 1,780,000 |

2016 මාර්තු මාසය තුළ සන් බුක්ස් ව්‍යාපාරයේ ණයගැතියන්ට සහ ණයහිමියන්ට අදාල ගනුදෙනු පහතින් දැක්වේ.

| | රු. |
|---|---|
| ණය පදනම මත ලිපිද්‍රව්‍ය අයිතම මිලදී ගැනීම | 5,200,000 |
| ණය පදනම මත ලිපිද්‍රව්‍ය අයිතම විකිණීම | 4,800,000 |
| ණය පදනම මත මිලදී ගැනුම් ආපසු යැවුම් | 750,000 |
| ණයහිමියන්ගේ ලද වට්ටම් | 300,000 |
| ණයහිමියන්ට කරන ලද ගෙවීම් | 3,200,000 |
| ණයගැතියන්ගෙන් ලැබීම් | 4,200,000 |
| ලියා හරින ලද බොල්ණය | 80,000 |
| ණයගැති අවසාන බැර ශේෂය | 100,000 |
| ණයගැති අවසාන හර ශේෂය | 60,000 |

ඔබ විසින් කළ යුතු දෑ,

සන් බුක්ස් ව්‍යාපාරයේ 2016 මාර්තු මාසය පහත සඳහන් දෑ පිළියෙල කරන්න.

(a) ණයගැති පාලන ගිණුම (ලකුණු 02)

(b) ණයහිමි පාලන ගිණුම (ලකුණු 03)

(මුළු ලකුණු 05)

## අභ්‍යාසය 81

2016 දෙසැම්බර් 31 දිනට සීමිත කසුන් සමාගමේ ගැනුම් ලෙජර් පාලන ගිණුමේ පහත සඳහන් ශේෂ දැක්විණි.

| | රු. |
|---|---:|
| 2016 ජනවාරි 01 දිනට බැර ශේෂය | 35,000 |
| 2016 ජනවාරි 01 දිනට හර ශේෂය | 500 |
| ණයට ගැනුම් | 275,000 |
| ලද වට්ටම් | 1,000 |
| ණයහිමියන්ට කළ ගෙවීම් | 243,000 |
| ආපසු යැවුම් | 2,500 |
| ණයහිමියන් විසින් ආපසු ගෙවූ මුදල් | 200 |
| ගෙවිය යුතු බිල්පත් | 3,000 |
| විකුණුම් ලෙජරයෙන් මාරු කළ ශේෂය | 850 |
| 2016 දෙසැම්බර් 31 දිනට හර ශේෂය | 650 |

2016 දෙසැම්බර් 31 දිනට පාලන ගිණුමේ ශේෂය ගැනුම් ලෙජරයේ ශේෂ ලැයිස්තුවේ එකතුව සමග එකඟ නොවිණි. පසුව කරන ලද පරීක්ෂණයක දී පහත සඳහන් වැරදි හෙළිදරව් විය.

(i) ගැනුම් ජ'නලය රු. 500 ක් අඩුවෙන් එකතු කර තිබුණි.

(ii) ණයහිමි ශේෂ ලැයිස්තුවෙන් රු. 250 ක බැර ශේෂයක් මගහැරී තිබිණි.

(iii) ලද වට්ටම් රු. 350 ක මුදල් පොතේ හා ලද වට්ටම් ගිණුමේ නිවැරදිව ඇතුළත් කර තිබුණත් එය ණයහිමි ගිණුමට පිටපත් කර නොතිබිණි.

(iv) ගැනුම් ජ'නලයේ ඇතුළත් රු. 780 ක අයිතමයක් ණයහිමි ගිණුමට ඇතුළත් කර තිබුණේ රු. 870 ක් ලෙස ය.

(v) සැපයුම්කරුවෙකුට හරවා යවන ලද රු. 850 ක් අගය වූ බඩු තොගයක් ණයහිමි ගිණුමේ නිවැරදිව ඇතුළත් කර තිබුණත් එය පාලන ගිණුමේ ඇතුළත් කර තිබුණේ රු. 1,850 ක් ලෙසය.

අවශ්‍ය වන්නේ,

(1) ඉහත වැරදි නිවැරදි කිරීමට පෙර පාලන ගිණුම

(2) ඉහත (1) හි ශේෂයට සිදු කෙරෙන ගැළපුම් දැක්වෙන පරිදි පාලන ගිණුම

(2002 උසස් පෙළ ඇසුරිනි)

## අභ්‍යාසය 82

ඒකපුද්ගල ව්‍යාපාරයක් වන ෂාප් පොත් වෙළෙඳසැලේ ගිණුම් පොත්වලින් පහත සඳහන් තොරතුරු උපුටාගන්නා ලදී.

(1)

| | | 2017 මාර්තු 01 දිනට ශේෂය (රු. '000) |
|---|---|---|
| ණයගැති පාලන ගිණුම | (හර) | 100 |
| ණයහිමි පාලන ගිණුම | (බැර) | 60 |

(2) 2017 මාර්තු මාසය තුළ පහත සඳහන් ගනුදෙනු සිදු වී ඇත.

| | (රු. '000) |
|---|---|
| ණය ගැනුම් | 5,200 |
| ණයට විකුණුම් | 6,200 |
| ණයට ගැනුම් ආපසු යැවුම් | 750 |
| ණයහිමියන්ගෙන් ලද වට්ටම් | 350 |
| ණයහිමියන්ට කළ ගෙවීම් | 4,500 |
| ණයගැතියන්ගෙන් ලැබීම් | 3,200 |
| අවසාන ණයගැති බැර ශේෂය | 50 |
| අවසාන ණයහිමි හර ශේෂය | 70 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

2017 මාර්තු මාසය සඳහා පහත සඳහන් දෑ පිළියෙල කරන්න.

(a) ණයගැති පාලන ගිණුම (ලකුණු 01)

(b) ණයහිමි පාලන ගිණුම (ලකුණු 03)

(මුළු ලකුණු 05)

**(AAT - July 2017)**

## අභ්‍යාසය 83

සෙවන හාඩ්වෙයාර් හි පොත්වලින් 2018 මැයි මාසය සඳහා පහත සඳහන් තොරතුරු උපුටාගන්නා ලදී.

| | |
|---|---|
| ණයට විකුණුම් | 750,000 |
| ණයට ගැනුම් | 350,000 |
| ණයහිමියන්ට ගෙවීම් | 450,000 |
| ණයහිමියන්ගෙන් ලද වට්ටම් | 4,300 |
| ණයැගැතියන්ගෙන් ලැබීම් | 725,200 |
| ණයගැතියන්ට දුන් වට්ටම් | 14,800 |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත.

(1) 2018 මැයි 01 දිනට පාලන ගිණුම්හි ශේෂයන් පහත පරිදි වේ.

| | රු. |
|---|---|
| ණයගැති පාලන ගිණුම | 1,565,000 (හර) |
| ණයහිමි පාලන ගිණුම | 860,000 (බැර) |

(2) ණයහිමියෙකු වෙත ගෙවන ලද රු. 12,600/- ක වටිනකමක් සහිත චෙක්පතක් ගිණුමේ ප්‍රමාණවත් ශේෂයක් නොතිබීම නිසා, බැංකුව විසින් 2018 මැයි 31 දින අගරු කර තිබුණි. සෙවන හාඩ්වෙයාර් විසින් එය පියවීමට 2018 ජූනි මාසයේ නව චෙක්පතක් ලබාදීමට එකඟ වී ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2018 මැයි මාසය සඳහා පහත සඳහන් දෑ පිළියෙල කරන්න.

(a) ණයගැති පාලන ගිණුම (ලකුණු 02)
(b) ණයහිමි පාලන ගිණුම (ලකුණු 03)
(මුළු ලකුණු 05)

**(AAT - July 2018)**

## අභ්‍යාසය 84

සීමාසහිත ෆයින් රෙකෝඩ් (පෞද්ගලික) සමාගමේ ලෙජරයෙහි ලෙජරයෙහි 2018 දෙසැම්බර් 31 දිනට පැවති ණයහිමි පාලන ගිණුමේ ශේෂය, ණයහිමියන්ගේ තනි තනි ලෙජර් ගිණුම්වල ශේෂයන්හි එකතුවට වඩා වෙන් විය:

| | රු. |
|---|---:|
| ණයහිමි පාලන ගිණුමේ ශේෂය | 1,300,540 |
| ණයහිමියන්ගේ තනි තනි ලෙජර් ගිණුම්වල ශේෂයන්හි එකතුව | 1,167,640 |
| වෙනස | 132,900 |

පසුව සිදුකරන ලද පරීක්ෂාවේදී පහත සඳහන් වැරදි හඳුනාගන්නා ලදී.

(1) මාසයට අදාලව ලැබුණු රු. 112,300/- ක මුළු වට්ටම් ප්‍රමාණය, පාලන ගිණුමෙහි සටහන් කර තිබුණ ද තනි තනි ලෙජර් ගිණුම්වල වාර්තා කර නොතිබුණි.

(2) තනි තනි ලෙජර් ගිණුම්වල ශේෂයන් උපුටා ගැනීමේදී රු. 43,500/- ක බැර ශේෂයක්, වැරදීමකින් හර ශේෂයක් ලෙස උපුටාගෙන තිබුණි.

(3) 2018 දෙසැම්බර් මාසයට අදාලව දෛනික ගැනුම් පොතේ එකතුව රු. 200,000/- ක් වැඩියෙන් එකතු කර තිබුණි.

(4) ණයහිමියෙකුට ගෙවිය යුතුව තිබූ රු. 12,700/- ක මුදලක් ඔහුගෙන්ම ලැබිය යුතුව තිබූ ණයගැති ලෙජරයෙහි සටහන්ව තිබූ මුදලකට හිලව්කරන ලද අතර, එය තනි තනි ලෙජර් ගිණුම්වල නිවැරදිව සටහන් කර තිබුණ ද, පාලන ගිණුමෙහි සටහන් කර නොතිබුණි.

(5) ණයහිමියෙකුට මුදලින් ගෙවූ රු. 54,500/- ක් පාලන ගිණුමෙහි නිවැරදිව සටහන් කර තිබුණ ද, අදාල ණයහිමියාගේ ලෙජර් ගිණුමෙහි සටහන් කර නොතිබුණි.

ඔබ විසින් කළ යුතු දෑ

පහත සඳහන් දෑ පිළියෙල කරන්න.

(a) සංශෝධිත ණයහිමි පාලන ගිණුම (ලකුණු 02)

(b) සංශෝධිත ණයහිමි පාලන ගිණුමේ ශේෂය, ණයහිමියන්ගේ තනි තනි ලෙජර් ගිණුම්වල ශේෂයන්හි එකතුව සමග සැසඳුම් ප්‍රකාශනය (ලකුණු 03)

(මුළු ලකුණු 05)

**(AAT - July 2019)**

## අභ්‍යාසය 85

ෂෙහාන්ගේ ව්‍යාපාරයේ 2019.08.31 දිනට වෙළෙඳ ලැබිය යුතු දෑ පාලන ගිණුමේ ශේෂය රු. 32,000 ක් විය. වෙළෙඳ ලැබිය යුතු දෑ ලෙජරයේ ශේෂය මීට වෙනස් විය. පසුව කරන ලද විමර්ශනයක දී පහත සඳහන් කරුණු අනාවරණය විය.

1. විකුණුම් ජ'නලයේ එකතුව රු. 2,000 ක් අඩුවෙන් ගණන් ගෙන ඇත.

2. සිල්වා විසින් ආපසු එවූ රු. 2,000 ක භාණ්ඩ ආපසු එවුම් ජ'නලයේ නිවැරදිව සටහන් කර තිබූ නමුත්, ඔහුගේ ගිණුමේ සටහන් කර තිබුණේ රු. 4,000 ක් ලෙසය.

3. රු. 10,000 ක් වෙළෙඳ ලැබිය යුතු දෑ මුදල් ලැබීම්, මුදල් පාලන ගිණුමේ නිවැරදිව සටහන් කර තිබුණත්, වෙළෙඳලැබිය යුතු දෑ පාලන ගිණුමේ සටහන් කර නොතිබුණි. කෙසේ වෙතත් මෙය වෙළෙඳ ලැබිය යුතු දෑ ලෙජරයේ නිවැරදිව සටහන් කර තිබුණි.

4. රු. 5,000 ක වෙළෙඳ ලැබිය යුතු දෑ හානිකර අලාභ කපාහැරීම් අදාළ වෙළෙඳ ලැබිය යුතු දෑ පෞද්ගලික ගිණුමට පිටපත් කර නොමැත.

අවශ්‍ය වන්නේ,

i. ව්‍යාපාරයේ නිවැරදි වෙළෙඳ ලැබිය යුතු දෑ පාලන ගිණුමේ ශේෂය

ii. වෙළෙඳ ලැබිය යුතු දෑ ලෙජර් ශේෂයන්ගේ එකතුව පාලන ගිණුමේ ශේෂය සමග සසඳන ප්‍රකාශයක් පිළියෙල කරන්න.

## අභ්‍යාසය 86

සුරංග ට්‍රේඩර්ස් හි ණයගැතියන්ට අදාළ පහත දැක්වෙන තොරතුරු එහි පොත්වලින් උපුටාගෙන ඇත.

| | රු. |
|---|---|
| ණයගැති පාලන ගිණුම් අනුව 2020 මාර්තු 31 දිනට හර ශේෂය | 62,800 |
| 2020 මාර්තු 31 දිනට එක් එක් ණයගැති ලෙජර ගිණුම් වල හර ශේෂ | |
| කපිල | 12,000 |
| භාරත | 9,000 |
| ඩිලාන් | 11,000 |
| මාලක | 24,000 |
| | 56,000 |

ණයගැති පාලන ගිණුමේ ශේෂය සහ තනි තනි ණයගැති ගිණුම් හේෂවල එකතුව අතර ඇති වෙනස සම්බන්ධයෙන් පහත සඳහන් වැරදි අනාවරණය කරගෙන තිබේ.

(i) ඩිලානස්ට ණය පදනම මත රු. 2,600 ක භාණ්ඩ විකිණීම, ණයගැති පාලන ගිණුමේ නිවැරදිව සටහන් කර ඇතත්, ඩිලාන්ගේ ගිණුමේ එය සටහන් කර තිබුණේ රු. 6,200 ක් ලෙසය.

(ii) භාරත විසින් ගෙවීමට තිබූ රු. 6,000 ක පියවීම සඳහා ඔහු විසින් නිකුත් කළ චෙක්පත, ප්‍රමාණවත් මුදල් නොතිබීම හේතුවෙන් බැංකුව විසින් ගෙවීම ප්‍රතික්ෂේප කර තිබුණි. මේ සම්බන්ධයෙන් ණයගැති පාලන ගිණුමේ සහ භාරතගේ ගිණුමේ යන ගිණුම් දෙකේම සටහන් තබා නැත.

(iii) මාලකට කරන ලද රු. 5,200 ක ණයට විකිණීමෙන්, ණයගැති ලෙජරය තුල ඔහුගේ ගිණුමේ වැරදි පැත්තේ සටහන් කර තිබුණි. ණයගැති පාලන ගිණුමේ එය නිවැරදි ලෙස සටහන් කර ඇත.

(iv) කපිල විසින් රු. 7,000 ක් පියවීම සඳහා බැංකුවට සෘජුවම ගෙවා තිබුණි. මෙය ව්‍යාපාරයේ පොත්වල සම්පූර්ණයෙන් සටහන් වී නැත.

ඔබ විසින්,

(1) 2020.03.31 දිනට ණයගැති පාලන ගිණුම සංශෝධනය කිරීම

(2) සංශෝධිත ණයගැති ශේෂ ලැයිස්තුව ඇසුරින් ශේෂ ලැයිස්තුවේ ශේෂය සෙවීමට සැසඳුම් ප්‍රකාශයක් සකස් කරන්න.

## අභ්‍යාසය 87

සමන් සමාගමේ 2019.12.31 දිනට ණයගැති ලෙජරයේ ණයගැති ශේෂ ලැයිස්තුවේ එකතුවත් පොදු ලෙජරයේ ණයගැති පාලන ගිණුමේ ශේෂයත් එකිනෙකට සමාන නොවීය. පාලන ගිණුමේ ශේෂය රු. 52,000 ක් විය.

වෙනසට හේතු පහත පරිදි විය.

(i) ආපසු එවුම් ජ'නලය රු. 1, ක් වැඩියෙන් එකතු කර ඇත.

(ii) බොල් ණය රු. 200 පාලන ගිණුමේ සටහන් කර නැත.

(iii) ණයගැති ශේෂ ලැයිස්තුවෙන් රු. 500 ක හර ශේයන් මග හැරී ඇත.

(iii) ණයට විකුණුම් රු. 200 ක් වැඩියෙන් පාලන ගිණුමේ සටහන් වී ඇත.

(iii) ණයගැති ශේෂ ලැයිස්තුවේ එකතව රු. 400 ක් වැඩි ය.

(iii) දුන් වට්ටමම් රු. 30 ක් වැඩියෙන් පාලන ගිණුමට සටහන් වී ඇත.

(iii) නිමල්ගෙන් ලැබී අගරු චෙක්පත රු. 1,000 පොදු ලෙජරයේ නිසි පරිදි සටහන් කලත් ඔහුගේ ගිණුමේ සටහන් කර නැත.

ඉහත තොරතුරු ඇසුරිනි,

(1) සංශෝධිත ණයගැති පාලන ගිණුම සකස් කරන්න.

## අභ්‍යාසය 88

නිමල් ව්‍යාපාරයේ 2020.03.31 දිනට විකුණුම් ලෙසට පාලන ගිණුමේ පහත ශේෂ දැකිය හැකි විය.

2020.03.31 දිනට ණයගැති පාලන ගිණුමේ ශේෂය විකුණුම් ලෙජර ශේෂ ලැයිස්තුවේ එකතුව සමග සමාන නොවිනි. පසුව පහත වැරදදි එළිදරව් විය.

| | රු. |
|---|---|
| 2019.04.01 හර ශේෂය | 4,200 |
| 2019.04.01 බැර ශේෂය | 100 |
| ණයට විකුණුම් | 15,900 |
| දුන් වට්ටම් | 800 |
| ණයගැතියන්ගෙන් ලද මුදල් | 12,000 |
| ආපසු එවුම් | 400 |
| ණයගැතියන්ට ආපසු ගෙවූ මුදල් | 100 |
| ලැබිය යුතු බිල් | 1,000 |
| ගැනුම් ලෙජරයට මාරු කල ශේෂය | 400 |
| 2020.03.31 දිනට බැර ශේෂය | 50 |

(i) විකුණුම් ජ'නලය රු. 1,000 ක් අඩුවෙන් එකතු කර ඇත.

(ii) ණයගැති ශේෂ ලැයිස්තුවෙන් රු. 500 ක හර ශේෂයන් මග හැරී ඇත.

(iii) ගැනුම් ලෙජරයට එරෙහිව හිලව් කරන ලද 300 ක ශේෂයන් පාලන ගිණුම්වලට ගෙන නැත.

(iv) කපා හල බොල් ණය රු. 800 ගිණුම් තබා නොමැත.

(v) ණයගැති කමල්ගෙන් ලැබී අගරු වූ රු. 1,000 ක චෙක්පත මුදල් සහ කමල්ගේ ගිණුම් සටහන් කලත් අනික් සටහන් කර ඇත.

(vi) ආපසු එවුම් රු. 300 පාලන ගිණුමේ සටහන් කර ඇත්තේ රු. 400 ක් ලෙසය.

ඉහත තොරතුරු ඇසුරින්

(1) 2020.03.31 අවසන් වසරේ ලෙජරයේ දක්වෙන විකුණුම් ලෙජර් පාලන ගිණුම්

(2) සංශෝධිත ණයගැති පාලන ගිණුම්

## අභ්‍යාසය 89

ව්‍යාපාරයක 2020.03.31 ණයගැති පාලන ගිණුමේ ශේෂය එදිනට ණයගැති ලෙජරයේ ණයගැති ශේෂ ලැයිස්තුවේ එකතුව සමග සම නොවිණි. එදිනට ණයගැති ශේෂ ලැයිස්තුවේ එකතුව රු. 45,000 ක් විය. වෙනසට හේතු පහත පරිදිය.

(i) කපාහල බොල් ණය රු. 1,000 පිළිබඳව සටහනක් ණයගැති ලෙජරයේ ඇතුලත් කර නැත.

(ii) ආපසු එවුම් ජ'නලයේ එකතුව රු. 500 ක් අඩුය.

(v) ණයගැති ලෙජරයේ රු. 300 ක හර ශේෂයන් බැර ශේෂයන් ලෙස ශේෂ ලැයිස්තුවට ඇතුලත් කර ඇත.

(v) පියල් ලබාදුන් රු. 300 ක චෙක්පත අගරු වීම පියල්ගේ ගිණුමේ සහ බැංකු ගිණුමේ සටහන් කිරිම පමණක් සිදු කර ඇත.

(v) ණයගැති ණය හිමි කපා හැරීම් රු. 2,000 පාලන ගිණුමේ සටහන් කර නැත.

(v) කමල්ට දුන් වට්ටම් රු. 100 පොදු ලෙජරයේ නිසි පරිදි සටහන් කර ඇතත් කමල්ගේ ගිණුමේ සටහන් කර නැත.

ඉහත තොරතුරු ඇසුරින් ශේෂ ලැයිස්තුව නිවැරදි කිරීමේ ප්‍රකාශයක් සකස් කරන්න.

## අභ්‍යාසය 90

ව්‍යාපාරයක 2021.03.31 ණයගැති ලෙජරයේ ණයගැති ශේෂ ලැයිස්තුව එකතුව රු. 23,550 වූ අතර ණයගැති පාලන ගිණුමේ ශේෂය රු. 22,000 විය. එම ශේෂ අතර වෙනසට හේතු පහත පරිදි ය.

(i) විකුණුම් ජ'නලයේ එකතුව රු. 1,000 අඩුය.

(ii) කමල් ණයගැතියාගේ ලද මුදල් රු. 500 කමල්ගේ ගිණුමේ සටහන් කර ඇත්තේ රු. 50 ලෙසය.

(iii) කපාහල බොල් ණය රු. 100 පාලන ගිණුමේ සටහන් කර නැත.

(iv) ආපසු එවුම් රු. 200 සටහන් කර ඇත්තේ පොදු ලෙජරයේ පමණි.

(v) දුන් වට්ටම් රු. 100 පොත්වල සටහන් කර නැත.

ඔබ විසින්

(1) සංශෝධිත ණයගැති පාලන ගිණුම් සකස් කරන්න.

(2) ණයගැති ශේෂ ලැයිස්තුව නිවැරදි කරන ප්‍රකාශයක් සකස් කරන්න.

## අභ්‍යාසය 91

01. පාලන ගිණුම් සම්බන්ධයෙන් පහත ප්‍රකාශන ඔබට දී ඇත.

(a) එක් එක් පුද්ගල ගිණුම් වෙනුවෙන් වෙන් වෙන් උප ලෙජර් ගිණුම් පවත්වා ගන්නා අතර එම ගිණුම් ශේෂයන්හි මුළු එකතුව පොදු ලෙජරයේ අදාල පාලන ගිණුමේ ශේෂය සමග එකඟ වෙයි.

(b) තොග වෙනුවෙන් පවා පාලන ගිණුමක් පවත්වාගෙන යා හැකිය.

(c) ණයගැති පාලන ගිණුම හා ණයහිමි පාලන ගිණුම අතර සටහන් තිබිය හැකිය.

ඉහත ප්‍රකාශන අතුරෙන්, පාලන ගිණුම් වලට අදාලව නිවැරදි ප්‍රකාශනය / ප්‍රකාශන වන්නේ,

(1) (a) පමණි.  (2) (b) පමණි.

(3) (a) සහ (c) පමණි.  (4) ඉහත සඳහන් සියල්ලම. (ලකුණු 02)

**(AAT - January 2017)**

02. සමාගමක පොත්වලින් 2014 ජනවාරි මාසය සඳහා ණයගැතියන්ට අදාල පහත සඳහන් ගනුදෙනු උපුටා ගන්නා ලදී:

| | රු. |
|---|---:|
| 2014 ජනවාරි 01 දිනට ශේෂය | 725,000 |
| මාසය තුල මුදල් ලැබීම් | 375,000 |
| ලියා හරින ලද බොල් ණය | 25,000 |
| 2014 ජනවාරි 31 දිනට ශේෂය | 650,000 |

2014 ජනවාරි මාසය තුල මුළු ණයට විකුණුම් වූයේ:

(1) රු. 325,000/-  (2) රු. 975,000/-

(3) රු. 475,000/-  (4) රු. 350,000/-

**(AAT Foundation - July 2014)**

03. 2013 නොවැම්බර් මාසය තුල සමාගමක්, එහි ණයහිමියන් සම්බන්ධයෙන් පහත සඳහන් ගනුදෙනු සටහන් කර තිබුණි:

| | රු. |
|---|---:|
| 2013 නොවැම්බර් 01 දිනට ශේෂය | 256,000 |
| මාසය තුළ ණයට මිල දී ගැනුම් | 944,000 |
| ලද වට්ටම් | 100,000 |
| ආපසු යැවුම් | 50,000 |
| 2013 නොවැම්බර් 30 දිනට ශේෂය | 110,000 |

2013 නොවැම්බර් මාසය තුල ණයහිමියන්ට ගෙවන ලද මුළු මුදල් වන්නේ:

(1) රු. 990,000/- කි.  (2) රු. 1,160,000/- කි.

(3) රු. 1,240,000/- කි.  (4) රු. 940,000/- කි.

**(AAT Foundation - January 2014)**

04. ණයගැතියකුගේ ගිණුමෙන් කපා හළ රු. 800/- ක බොල්ණයක් ණයගැති පාලන ගිණුමේ සටහන් **කර නැත.** ණයගැති පාලන ගිණුමේ ශේෂය නිවැරදි කිරීම සඳහා අවශ්‍ය ගැලපීම වන්නේ:

(1) රු. 800/- ක් හර කිරීම. (2) රු. 800/- ක් බැර කිරීම.
(3) රු. 1,600/- ක් බැර කිරීම. (4) ගැලපීමක් අවශ්‍ය නොවේ.

**(AAT Foundation - July 2013)**

05. 2012 අප්‍රේල් මාසය තුල **සීමාසහිත ෆ්‍රී මාර්ට් සහ සමාගමේ** පොත්වලින් පහත සඳහන් ණයහිමියන්ගේ තොරතුරු උපුටා ගන්නා ලදි.

| ණයහිමියා | 2012 අප්‍රේල් 01 දිනට ශේෂය රු. | මිල දී ගැනුම් රු. | මුදලින් ගෙවීම් රු. | ලැබුණ වට්ටම් රු. |
|---|---|---|---|---|
| හන්ටර්ස් ට්‍රේඩර්ස් | 13,000 (බැර) | 5,000 | 10,000 | 200 |
| අමීබා ට්‍රේඩර්ස් | 10,000 (බැර) | 7,000 | 10,000 | 400 |

ඉහත තොරතුරු වලට අනුව, 2012 අප්‍රේල් 30 දිනට ණයහිමි පාලන ගිණුමේ ශේෂය වන්නේ:

(1) රු. 15,000/- බැර (2) රු. 15,600/- බැර
(3) රු. 14,400/- බැර (4) රු. 15,600/- හර

**(AAT Foundation - July 2012)**

06. 2011 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ ණයගැති පාලන ගිණුමට සම්බන්ධ පහත සඳහන් තොරතුරු ඔබට දී ඇත.

| | රු. |
|---|---|
| 2010 අප්‍රේල් 01 දිනට ශේෂය (හැර) | 791,200 |
| ණයට විකුණුම් | 5,000,000 |
| වර්ෂය තුල ණයගැතියන්ගෙන් ලැබීම් | 3,800,000 |
| 2011 මාර්තු 31 දිනට ශේෂය (හර) | 1,421,200 |
| ආපසු එවූ විකුණුම් | 220,000 |
| ණයහිමියන්ට කරන ලද ගෙවීම් වැරදීමකින් ණයගැති පාලන ගිණුමේ සටහන් කිරීම | 200,000 |

ඉහත දත්ත අනුව වර්ෂය තුල ලියා හරින ලද බොල්ණය ප්‍රමාණය වන්නේ,

(1) රු. 150,000/- (2) රු. 550,000/-
(3) රු. 150,200/- (4) රු. 570,000/-

**(AAT Inter - January 2012)**